# රණවිරුවා

2025 ඔක්තෝබර් • 281 කලාපය



## බුහුමන් මැදින් සැමරු අභිමානය

76 යුද්ධ හමුදා සංවත්සරය

1949 2025

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.

# යුධෝපකරණ ගබඩා පහසුකම් නිරීක්ෂණය කෙරේ





ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, ඉකුත් ඔක්තෝබර් මස 11 වන දින අගුණුවැල්පැලස්ස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණයෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එම අවස්ථාවට ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ද එක්වූහ. තවද, ඉකුත් ඔක්තෝබර් මස 12 වන දින පූනානි හි පිහිටි ප්‍රාදේශීය යුධෝපකරණ ගබඩා සංකීර්ණයෙහි ද නිරීක්ෂණ චාරිකාවක නිරතවීමට ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා කටයුතු කළේය. එම අවස්ථාවට ආරක්ෂක ලේකම් මෙන්ම නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති ද එක්වූහ.

එහිදී, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් සමඟ එහි වත්මන් මෙහෙයුම් සහ ආරක්ෂක සූදානම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ද පැවැත්වූහ. පතොරම් සහ යුධෝපකරණ ගබඩාවල ආරක්ෂාව සහ සුරක්ෂිතතා පියවර වැඩිදියුණු කිරීම, හදිසි ප්‍රතිචාර සැලසුම් සංවර්ධනය, හදිසි තත්ත්වයන්හිදී බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, නියාමන අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සම්මත මෙහෙයුම් පටිපාටි ක්‍රියාත්මක කිරීම, වගවීම සහ ආරක්ෂිත ක්‍රියාවලීන්හි සුමට බව ඇතුළු තීරණාත්මක කරුණු රැසක් එහිදී සාකච්ඡාවට ලක් විය.

## ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආමන්ත්‍රණය කරයි

76 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය. යුද්ධ හමුදාධිපති ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත සාම්ප්‍රදායික හමුදා උත්තමාචාරයක් ද පිරිනමනු ලැබීය.



එහිදී, ජ්‍යෙෂ්ඨ යුද්ධ හමුදා නිලධාරීන් ඇමතූ නියෝජ්‍ය අමාත්‍යවරයා ජාතික ස්වෛරීත්වය ආරක්ෂා කිරීමට දක්වන ලද නොසැලෙන කැපවීම, පශ්චාත් යුද සමයේදී ජාතික ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා දැක්වූ දායකත්වය මෙන්ම ස්වාභාවික විපත් හා ජාතික හදිසි ආපදා අවස්ථාවල දී දක්වන ලද කාර්යක්ෂම ප්‍රතිචාර වෙනුවෙන් ජනාධිපතිතුමා වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත සිය හෘදයාංගම ස්තුතිය පුද කළේය. එමෙන්ම, ඔහු සිය වෘත්තීය අත්දැකීම් ඇසුරින් කරුණු දක්වමින්, හමුදාමය වෘත්තීයභාවයේ මූලික පදනම ලෙස විනය පවත්වා ගැනීමේ වැදගත්කම ද අවධාරණය කළේය. ආදර්ශයෙන් මෙන්ම උපදේශනයෙන්, හමුදා ප්‍රමිතීන් ස්ථිර නමුත් එම කරුණු සාධාරණව බලාත්මක කිරීමෙන් හමුදා සාමාජිකයන් තුළ විනය පවත්වා ගැනීමට කටයුතු කරන ලෙස ඔහු එම නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන්නේය.



# එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා හමුදා දායකත්වය ලබාදෙන රටවල ප්‍රධානීන්ගේ සමුළුව



"එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා හමුදා දායකත්වය ලබාදෙන රටවල ප්‍රධානීන්ගේ සමුළුව - 2025" ඉන්දියාවේ නවදිල්ලි නුවරදී ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින සිට 16 වන දින දක්වා පැවැත්විණ. ඉන්දීය හමුදාව විසින් පවත්වන ලද මෙම සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි විය. මේ සඳහා ලොව පුරා එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා හමුදා දායකත්වය ලබාදෙන රටවල් 32ක නියෝජිතයෝ එක්වූහ. මෙම සමුළුවට මෙරට යුද්ධ හමුදාව නියෝජනය කරමින් විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එම්කේඩීපී මාපලගම පීඑස්සී ද සහභාගි විය.

# ඕස්ට්‍රේලියානු ආරක්ෂක විද්‍යාලයේ නියෝජිත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති



Colonel Brandon Ashley Wood ගේ ප්‍රධානත්වයෙන් යුත් ඕස්ට්‍රේලියානු ආරක්ෂක විද්‍යාලයේ නියෝජිත පිරිසක් Colonel Amanda Johnston (ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක) සමඟින් ඉකුත් ඔක්තෝබර් මස 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ.



# යුද්ධ හමුදාධිපති යාපනය අර්ධද්වීපයේ සංචාරයක







යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී, ඉකුත් ඔක්තෝබර් මස 18 වන දින සිට 20 දින දක්වා යාපනය අර්ධද්වීපයේ දෙදින නිල සංචාරයක නිරත වූ අතර, එහිදී, ආඥාපති මේජර් ජෙනරාල් කේඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී විසින් එතුමන්ව පිළිගන්නා ලදී. අනතුරුව යුද්ධ හමුදාධිපති එම බලප්‍රදේශයේ රාජකාරීන් සඳහා යොදවා ඇති භටපිරිස්හි සුභසාධනය සහ මෙහෙයුම් සූදානම පිළිබඳව සොයා බැලීය. තවද, වාසවිලාන් ප්‍රදේශයේ නවතමයෙන් ඉදිකරන ලද ප්‍රගමන සංවර්ධන මධ්‍යස්ථානය (CDC), පලාලි යුද්ධ හමුදා මූලික රෝහල සහ චුල්ලිපුරම් ඇමරිකානු මිෂනාරි දමිළ මිශ්‍ර පාසල ද හෙතෙම නිරීක්ෂණය කළේය. එසේම, 11 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව, 5 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය, 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය, 9 (ස්වේච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව, 11 වන බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 521 වන පාබල බළසේනාව ද නිරීක්ෂණය කරමින් එහි රාජකාරී ස්වභාවය හා පාලන අවශ්‍යතා පිළිබඳව ද ඔහු සොයාබැලීය. මෙම සංචාරයේදී ශ්‍රී නාග විහාරස්ථානයේ පූජ්‍ය මීගහජඳුරේ සිරිවිමල හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගත් යුද්ධ හමුදාධිපති අනතුරුව, යාපනය රදගුරු ආචාර්ය ජස්ටින් බර්නාඩ් ඥානප්‍රගාසම් රදගුරුතුමන් ද හමුවිය.



# ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවෙන් කාලීන මෙහෙවරක්

යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ දක්ෂ කාර්මික ශිල්පීන් විසින් අලුත්වැඩියා කරන ලද වාහන රැසක් ධාවනය කළ හැකි තත්ත්වයට ප්‍රතිසංස්කරණය කරන ලදී. විවිධ ආපදා හේතුවෙන් මෙතෙක් භාවිතයට නොගෙන තිබූ එම වාහන විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපොළවල්හීදී අලුත්වැඩියා කටයුතු සිදුකෙරිණ.



මේ හේතුවෙන් නව වාහන මිලදී ගැනීම් සඳහා වැය වීමට තිබූ විශාල මුදලක් යුද්ධ හමුදාවට ඉතිරි කරගැනීමට හැකි විය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති උත්සවයකදී එලෙස ප්‍රතිසංස්කරණය කරන ලද වාහන අදාළ රෙජිමේන්තු නියෝජිතයන් වෙත භාරදෙන ලදී. එම වාහන අතරට ටාටා 1313 සහ 1613 ට්‍රක් රථ 26ක්, ටාටා 709 ට්‍රක් රථ 15ක්, බස් රථ 14ක්, යුනිකෝන් ජල බවුසර් 1ක්, යුනිබෆල් 1ක්, ගලි බවුසර් 2ක්, කැබ් රථ 5ක්, ගිලන් රථ 6ක්, වෑන් රථ 4ක්, කැන්ටර් වර්ගයේ ලොරි රථ 1ක් සහ මෝටර් රථ 1ක් ඇතුළත් විය. මීට අමතරව, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවට කාලතුවක්කු ඇදගෙන යාම සඳහා භාවිතා කරන ට්‍රක් රථ (අයන්හෝස්) 10ක් සහ විශේෂ බලකාය වෙත DRZ 400 යතුරුපැදි 8ක් අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව භාරදීම ද සිදුකෙරිණ.









# 76 වන සංවත්සරය

1949 2025





ඔක්තෝබර් මස 10 වන දිනට යෙදුන 76 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් උත්සව කටයුතු රැසක් පැවැත්විණ. එහිදී, සර්ව ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් ආශීර්වාද දේවමෙහෙයක් කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු ඇන්ටන් රංජිත් හිමිපාණන් ඇතුළු පූජකතුමන්ලා කිහිප දෙනෙකුගේ ප්‍රධානත්වයෙන් ඔක්තෝබර් මස 01 වන දින කෝට්ටේ ශාන්ත තෝමස් දේවස්ථානයේදී පැවැත්විණි. තවද ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින කොල්ලුපිටිය ජුම්මා මුස්ලිම් පල්ලියේදී ද විශේෂ යාඥාවක් පැවැත්විය.













76 වන යුද්ධ හමුදා සංවත්සර දිනයට ආශීර්වාද පතා සංවිධානය කෙරුණු සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය ඉකුත් ඔක්තෝබර් මස 06 සහ 07 යන දිනයන්හිදී පනාගොඩ ශ්‍රී බෝධිරාජාරාමය විහාරස්ථානයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ද යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය සහභාගී වූහ.

මෙම අවස්ථාව වෙනුවෙන් වැඩමවා වදාළ ගංගාරාම විහාරයේ විහාරාධිපති පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි ස්වාමීන් වහන්සේ විසින් මෙම සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයේ මුලසුන හෙබවූ අතර, රත්නමාලි විහාරයේ ප්‍රධාන විහාරාධිපති පූජ්‍ය ඊතලවැටුනවැවේ ඥානතිලක හිමියන් විසින් එහිදී අනුශාසනාවක් පවත්වමින් යුද්ධ හමුදාව විසින් ජාතිය වෙනුවෙන් සිදුකළ කෘතහස්ත සේවය අගයමින් යුද්ධ හමුදාවේ අනාගතයට ආශිර්වාද කළහ. වැඩසටහනේ කටයුතු අවසන් කරමින් 2025 ඔක්තොබර් මස 07 දින මහා සංඝරත්නය උදෙසා උදෑසන දානය පිරිනැමිණ.



මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවය බත්තරමුල්ල, රණවිරු ස්මාරකය අභියසදී ඉකුත් ඔක්තෝබර් මස 08 වන දින පැවැත්විණි. යුද්ධ හමුදාවේ 76 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත්වූ මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය. එතුමන් සමඟ එක් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද මව්බිම වෙනුවෙන් දිවිපිදූ එම රණවිරුවන්ගේ මතකය නැවත ජීවමාන කරමින් එහිදී එම රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුදකරනු ලැබූහ.



හිරු නැගෙනා මොහොතේදීත් හිරු බසිනා මොහොතේදීත් රට වෙනුවෙන් දිවිපිදූ විරෝදාර රණවිරුවන් වෙනුවෙන් හමුදා සම්ප්‍රදායානුකූලව වැයෙන යුද්ධ හමුදා තූර්යවාදක බියුගල් නලාකරුවන්ගේ අවර රණවිරු අනුස්මරණ බියුගල් නාදය ගුවනට මුසුවීමත් සමඟම උත්සවයේ සමාප්තිය සනිටුහන් විය.



# 76 වසක අභිමානය සැමරූ ඓතිහාසික දිනක්



මෙවර 76 වන යුද්ධ හමුදා සංවත්සරය වෙනුවෙන් පැවති අභිමානවත් පෙළපාලිය ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින පෙරවරුවේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී පැවැත්විණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් පීආර් පතිරවිතාන යූඑස්ඒඩබ්ලිව්සී පීඑස්සී ගේ අණදීම යටතේ පැවති යුද්ධ හමුදා සංවත්සර දින පෙළපාලිය සඳහා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 24 නියෝජනය කරමින් නිලධාරීන් 75 දෙනෙක් සහ සෙසුනිලයෝ 626 දෙනෙක් යුද්ධ හමුදා වර්ණ සමඟින් සහභාගි වූහ.



යුද්ධ හමුදාධිපතිතුමන් විසින් පෙළපාලිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, භටපිරිස් හමුදා සම්ප්‍රදායානුකූලව එතුමන් වෙත ගෞරවාචාර පුදකළහ. ඉන් අනතුරුව, පසුගිය වසර තුළ යුද්ධ හමුදාවේ අභිමානය වෙනුවෙන් දායක වූ සෙසුනිලයන් 06 දෙනෙකු වෙත යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡනය පැළඳවීය. නිර්භීතකම, අවංකභාවය, ජාතියේ හදිසි අවස්ථාවන් සඳහා කැපවීම සහ සිය ආරක්ෂාව පිළිබඳ නොතකමින් අනුපමේය රාජකාරියක නිරත වීම වෙනුවෙන් ඔවුන් වෙත මෙම ලාංඡන පළඳවනු ලැබීය. අනතුරුව,  භටපිරිස් ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති අනාගත සංවර්ධනය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම පිළිබඳව හා උසස් තාක්ෂණික කුසලතා සහ නවීන යුද හැකියාවන්ගෙන් සමන්විත වෘත්තීය සෙබළුන් බිහිකිරීම පිළිබඳව අවධාරණය කළ අතර, "සේවයෙන් නායකත්වයට" යන ආදර්ශ පාඨය යටතේ, විශිෂ්ටත්වය, වෘත්තීයභාවය සහ ශක්තිමත් නායකත්වය මඟින් අනාගතයට සූදානම් හමුදාවක් බවට යුද්ධ හමුදාව පත්කිරීමට කැපවී සිටින බව වැඩිදුරටත් පැවසීය.



# මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්




පසුගිය ඔක්තෝබර් මස 10 වන දිනට යෙදුණු 76 වන යුද්ධ හමුදා දින සැමරුමට සමගාමීව, ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී සහ යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ නිර්දේශ මත, සන්නද්ධ හමුදා සේනාධිනායක ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් ක්‍රියාන්විතයේදී තුවාල ලැබූ බ්‍රිගේඩියර්වරුන් පස් දෙනෙකු ජාතියට සිදුකළ සේවය අගයා ඔවුන්ව මේජර් ජෙනරාල් නිලයට උසස් කරන ලදී.

ඒ අනුව මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්එස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් ර්එන් කුරුකුලසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් එම්ජ්ඩීජේඩී ගුණතිලක ආර්එස්පී යූඑස්පී, මේජර් ජෙනරාල් කේජ්ඩීඑස්කේ ධර්මසේන ආර්ඩබ්ලිව්පී සහ මේජර් ජෙනරාල් සීඑස් තිබ්බොටුගේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එලෙස උසස්වීම් ලැබීය. එහිදී, ඉකුත් ඔක්තෝබර් මස 12 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති විසින් එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හට මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත ප්‍රදානය කරමින් සිය සුබ පැතුම් එක් කළේය. ක්‍රියාන්විත හේතූන් මත ආබාධ සහිත තත්වයට පත්වූ නිලධාරීන් වෙනුවෙන් නිල උසස්වීමේ ක්‍රමවේදයක් පසුගිය සමයේ ක්‍රියාත්මකව නොතිබිණ. නමුත්, වත්මන් යුද්ධ හමුදාධිපතිතුමාගේ සෘජු මැදිහත්වීම මත එවැනි නිලධාරීන්ට නිල උසස්වීම් ලබාදීම ඔවුනගේ කැපවීම වෙනුවෙන් ඉටුකළ සාධාරණයක් සේම එය යුද්ධ හමුදවේ ඓතිහාසික සන්ධිස්ථානයක් ද වේ.




මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මේජර් ජෙනරාල් ඒඒඩීපී කුලතිලක යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත එම නිලයට හිමි අධිකාරියේ සංකේතය පිරිනැමීම පසුගියදා යුද්ධ හමුදාධිපතිගේ සුරතින් යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.

# යුද්ධ හමුදා සිවිල් සේවක යහසාධක සංගමයේ මහසභා රැස්වීම






ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිවිල් සේවක යහසාධක සංගමයේ මහසභා රැස්වීම ඉකුත් ඔක්තෝබර් මස 31 වන දින කොළඹ මහජන පුස්තකාලයේදී පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගි විය. එහිදී, සිවිල් සේවක මහතුන්ගේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ද, යුද්ධ හමුදා සිවිල් සේවක යහසාධක සංගමයේ සාමාජිකත්වය දැරූ විශ්‍රාම යාමට නියමිත සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ සාමාජිකත්වය ඇගයීම වෙනුවෙන් සමරුඵලක ප්‍රදානය කිරීම ද සිදුවිය. එසේම, නව අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සාමාජිකයින් පත්කිරීම ද එහිදී සිදුකෙරිණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු සහ සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් රැසක් සහභාගී වූහ.



# එක්සත් ජාතීන්ගේ හටකාර්ය සම්පාදක නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථකව අවසන්

එක්සත් ජාතීන්ගේ හටකාර්ය සම්පාදක නිලධාරීන්ගේ පාඨමාලා අංක - 07, ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේදී ඉකුත් සැප්තැම්බර් මස 29 වන දින සිට ඔක්තෝබර් මස 10 වන දින දක්වා පැවැත්විණ. මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් 24ක් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිෂ්‍ය නිලධාරීන් 02ක් ඇතුළුව, බංගලාදේශය, ෆීජී, ඉන්දුනීසියාව, මොංගෝලියාව සහ පිලිපීනය යන රටවල ශිෂ්‍ය නිලධාරීහු 06ක් සහභාගී වූහ.

එහි පුහුණු මණ්ඩලය ගෝලීය සාම මෙහෙයුම් මුලපිරීම පිළිබඳ විෂය කරුණු දැනුමැති විශේෂඥයින්ගෙන් සමන්විත වූ අතර, මෙම මණ්ඩලයේ නායිකාව ලෙස කැනඩාවේ Mrs. Tracey Martineau කටයුතු කළාය. අනෙකුත් විෂය කරුණු පිළිබඳ විශේෂඥයින් ලෙස නෝර්වේහි Mr. Stein Ellingsen, ඩෙන්මාර්කයේ Mr. Jens Winther Andersen සහ ඇමරිකා එක්සත් ජනපදයේ Mr. Marc Sheldon Spurling යන මහත්වරු එක්වූහ.



# "Wolverine Path 2025" රුසියානු - ශ්‍රී ලංකා ඒකාබද්ධ හමුදා අභ්‍යාසය අරඹයි





රුසියානු - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික හමුදා අභ්‍යාසයක් වන "Wolverine Path 2025" ඔක්තෝබර් මස 25 වන දින සිට නොවැම්බර් මස 04 වන දක්වා මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේදී පැවැත්වේ. මෙම උපායශීලී ත්‍රස්ත විරෝධී අභ්‍යාසය ශ්‍රී ලංකා හමුදාව සහ රුසියානු සමූහාණ්ඩුවේ සන්නද්ධ හමුදා අතර සහයෝගීතාවය සනිටුහන් කරනු ලබන පළමු ඒකාබද්ධ ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය වේ.

පාබල අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එන්කේඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ පුහුණු අභ්‍යාසයේ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් එස්ජ්යූජ් සෝළංගාරච්චි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් එම හමුදා භටපිරිස් ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී උණුසුම් ලෙස පිළිගනු ලැබූහ. රුසියානු සමූහාණ්ඩුව නියෝජනය කරමින් Major General Andrey Borisovich Kozlov පුහුණු අභ්‍යාසයේ ප්‍රධානියා ලෙස පැමිණි අතර මෙම ඒකාබද්ධ පුහුණු වැඩසටහන පුරා රුසියානු කණ්ඩායමට එම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් නායකත්වය දෙනු ලබයි. "Wolverine Path 2025" අභ්‍යාසය උපායශීලී සහ අන්තර් ක්‍රියාකාරි ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාස මාලාවකින් සමන්විත වෙන අතර, මෙම අභ්‍යාසය හරහා දෙරට අතර හමුදා සහයෝගීතාව වැඩි දියුණු කිරීම, වෘත්තීය බැඳීම් ශක්තිමත් කිරීම සහ ඒකාබද්ධ ත්‍රස්ත විරෝධී හැකියාවන් වර්ධනය කිරීම සිදුකරනු ලබයි.

# "මිත්‍ර ශක්ති - 2025" යුද අභ්‍යාසයේ පූර්ව පුහුණු පාඨමාලාව





11 වන වරටත් පවත්වනු ලබන "මිත්‍ර ශක්ති - 2025" යුද අභ්‍යාසය 2025 නොවැම්බර් මස 09 දින සිට නොවැම්බර් මස 23 වන දින දක්වා ඉන්දියාවේ බෙල්ගාවි හිදී පැවැත්වීමට නියමිතය. ඒ සඳහා, සහභාගි වන කණ්ඩායම සඳහා පූර්ව පුහුණු පාඨමාලාව ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින නිකවැව ගුවන් සංක්‍රමික පුහුණු පාසලේදී ආරම්භ වූ අතර, එම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගි වූහ. සමාරම්භක අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ ගුවන් සංක්‍රමික බළසේනාවේ බළසේනාධිපති සහ අභ්‍යාස අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජ්ජේ හේමචන්ද්‍ර ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සී විසින් ආරම්භක දේශනය පවත්වමින් අභ්‍යාසය සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

## ඇල්ල ප්‍රදේශයේදී "මුදාගැනීමේ මෙහෙයුම්" පුහුණු අභ්‍යාසයක්







බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය විසින් සංවිධානය කරන ලද ඇල්ල-වැල්ලවාය මාර්ගයේ ආපදා අවස්ථාවකදී ජනතාව මුදාගැනීමේ මෙහෙයුම් පුහුණු අභ්‍යාසයක් ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින පැවැත්විය. 2025 සැප්තැම්බර් මස 04 දින සිදු වූ ඛේදජනක බස්රථ අනතුරෙන් පසු ඉදිරියේදී සිදුවිය හැකි එවැනි හදිසි අනතුරු වැළැක්වීම සඳහා වන සූදානම සහ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම පුහුණු අභ්‍යාසය පැවැත්විණ.

එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ස්වේච්ඡා සංවිධාන කිහිපයක් ඇතුළු ආයතන රැසක සහභාගීත්වයෙන් පවත්වන ලදී. එහිදී, ඇල්ල-වැල්ලවාය මාර්ගයේ 25 වන කිලෝමීටර් කණුව අසල බස් රථයක් අඩි 500ක ප්‍රපාතයකට වැටී ඇති බවට උපකල්පනය කරමින් මෙම පුහුණු අභ්‍යාසය කෙරිණ.

එහිදී, සහභාගි වූ සියලුම පාර්ශවකරුවන් අතර පවතින සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් ඇගයීම, අනතුරු හැසිරවීමේ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම, සන්නිවේදනය සහ රාත්‍රී මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම වැනි කටයුතු සිදුකෙරිණ.

බ්‍රිගේඩියර් බීජ්ඩීඑන්කේ බුලත්සිංහල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් මත 112 වන පාබල බළසේනාවේ මෙන්ම 23 බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ, 3 කමාන්ඩෝ රෙජිමේන්තුවේ, 1 බලඇණිය ගැමුණු හේවා බලකායේ සහ 5 බලඇණිය ගැමුණු හේවා බලකායේ භටපිරිස් මෙම ආපදා මුදාගැනීමේ මෙහෙයුම් සිදුකරනු ලැබූහ.

ඌව පළාත් ආණ්ඩුකාර ජේඑම් කපිල ජයසේකර මහතා සහ බදුල්ල දිස්ත්‍රික් ලේකම් පීඑස්පී අබේවර්ධන මහතා මෙම අභ්‍යාසය අධීක්ෂණය කරනු ලැබූහ. අනතුරුව ආණ්ඩුකාරතුමන් විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා සහභාගී වූ සියලුම ආයතනවල වෘත්තීයභාවය සහ ඒකාබද්ධ උත්සාහය ඇගයීමට ලක්කරන ලදී.

# තවත් ගුවන් ප්‍රහාරක පාඨමාලාවක් විසිර යයි








ගුවන් ප්‍රහාරක පාඨමාලා අංක 30හි විසිර යාමේ පෙළපාලිය ඉකුත් ඔක්තෝබර් මස 15 වන දින 1 බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් ගුවන් සංග්‍රමික පුහුණු පාසලේදී පැවැත්විණි. නිලධාරීන් 04 දෙනකු සහ සෙසු නිලයන් 102 දෙනෙකු පාඨමාලාව සාර්ථකව හැදෑරූ අතර, එහිදී හොඳම වෙඩික්කරු ලෙස 1 බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලුතිනන් ඩීඑම්සීසීබී පුස්සැල්ල ද හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි සෙබළා ලෙස 3 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ පාබල සෙබළ රත්නායක ආර්එම් ද දක්ෂතම සෙබළා ලෙස 5 බළඇණිය ගැමුණු හේවා බළකායේ සැරයන් ප්‍රියන්ත ඩබ්ලිව්එම්එස් ද සම්මාන දිනාගත්හ. මෙම අවස්ථාවට 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඒටී ගොඩේවත්ත ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ද සහභාගී වූහ.

# ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව








ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලා අංක - 57, හි සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් ඔක්තෝබර් මස 28 වන දින අම්පාර, සටන් පුහුණු පාසලේදී පැවැත්විණි. එහිදී, යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් පාඨමාලාව හැදෑරූ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් 41 දෙනෙකු වෙත සහතිකපත් ප්‍රදානය කෙරුණු අතර, 23 බළඇණිය ගැමුණු හේවා බළකායේ සැරයන් දිනේෂ් කුමාර ජීජී පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස තේරී පත්විය. මෙහි අවසන් දේශනය අම්පාර, සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී එන්ඩීසී විසින් සිදුකරන ලදී.

# ජාත්‍යන්තර සංස්කෘතික සහ ආහාර සැණකෙළිය සඳහා සහභාගී වෙමින්



16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම ඉකුත් ඔක්තෝබර් මස 23 වන දින නාකූරා හි පිහිටි ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේදී 'Flavours without Borders' යන තේමාව යටතේ පැවති ජාත්‍යන්තර සංස්කෘතික සහ ආහාර සැණකෙළිය සඳහා සහභාගී වූහ. මෙම සැණකෙළිය තුළ පැවති විවිධ සාම්ප්‍රදායන්ට අදාළ ආහාර, සජීවී නර්තන සහ සංගීතමය වැඩසටහන් මඟින් ගෝලීය සංස්කෘතීන් ප්‍රදර්ශනය කළ අතර, එමඟින් විවිධ ජාතීන්ට අයත් සංස්කෘතීන් අත්විඳීමට සහ අගය කිරීමට සහභාගීවූවන්ට වටිනා අවස්ථාවක් හිමිවිය. මෙහිදී, සාම සාධක රාජකාරි සඳහා සහභාගීව සිටින ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ සමාජිකයන් විසින් සාම්ප්‍රදායික ආහාර මෙන්ම සංගීතමය සහ නර්තන වැඩසටහන් ඉදිරිපත් කරමින් ශ්‍රී ලාංකිය සංස්කෘතික උරුමයන් විදහා දැක්විය. මෙම අවස්ථාවට ලොව පුරා විවිධ රටවල් නියෝජනය කරමින් විශාල හමුදා භටපිරිසක් සමඟ දූත මණ්ඩල ප්‍රධානීන් සහ බළඇණි අණදෙන නිලධාරීන් සහභාගී වූහ.






# ලක්ෂපාන තේ කර්මාන්ත ශාලාවේ ඇති වූ හදිසි ගින්නක් මැඩපවත්වයි





ඉකුත් ඔක්තෝබර් මස 09 වන දින නල්ලතන්නිය ප්‍රදේශයේ ලක්ෂපාන තේ කර්මාන්ත ශාලාවේ හදිසි ගින්නක් ඇතිවිය. එම අවස්ථාවේදී 642 වන පාබල බළසේනාවේ උපදෙස් මත 5 (ස්වේච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 3 (ස්වේච්ඡා) බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් කඩිනමින් එම ස්ථානයට පැමිණ ගින්න නිවීමේ කටයුතු ආරම්භ කළහ. ඒ අතුරතුර, හැටන් නගර සභාවේ ගිනි නිවන රථයක් සහ ගිනි නිවන කණ්ඩායමක් ද මෙම මෙහෙයුමට එක්වූ අතර, යුද්ධ හමුදා සාමාජිකයන්, කර්මාන්තශාලා සේවකයින් සහ ගිනි නිවන කණ්ඩායම එක්ව ගින්න සාර්ථකව මැඩපවත්වනු ලැබූහ.

# ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපතිතුමන් 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ නිල සංචාරයක



ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කපිල ජයවීර මහතා ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේදී, එරට බලකායේ අණදෙන නිලධාරි සහ දූත ප්‍රධානි හමුවී සුහද කථා බහක නිරත විය. 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම් කඳවුර නාකියුරා ප්‍රදේශයේ ස්ථාපිත කිරීමෙන් පසු තනාපතිතුමන් එහි සිදුකළ පළමු නිල සංචාරය එය විය. කඳවුර වෙත පැමිණි තානාපතිතුමන්ව 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි ගජබා රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් වයිඑස්එච්එන්පී සිල්වා යූඑස්පී පීඑස්සී විසින් පිළිගන්නා ලදී. එහිදී, තානාපතිතුමන් විසින් භටපිරිස් අමතමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ සේවය කරන සාම සාධක භටපිරිස් ලෙස ඔවුන්ගේ වෘත්තීයභාවය සහ කැපවීම අගය කළේය.





# හානි වූ මාර්ගය යළි පිළිසකර කෙරේ



තවලම ප්‍රදේශයේ නායයෑමකින් හානි වූ මාර්ගයක් වාහන ධාවනයට සුදුසු ලෙස යථා තත්වයට පත්කිරීමට යුද්ධ හමුදා භටපිරිසක් කටයුතු කළහ. ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින උදෑසන 1010ට පමණ සිදුවූ මෙම ව්‍යසනයෙන් තවලම - පිටිගල, ආයුදගල අසල ප්‍රධාන මාර්ගය මෙසේ නාය යාමට ලක්ව තිබිණ. එලෙස හානි වූ මාර්ගය යළි පිළිසකර කිරීමේ කටයුත්ත සඳහා පූර්ණ නායකත්වය හා මාර්ගෝපදේශකත්වය 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති විසින් ලබාදුන් අතර, එහි අධීක්ෂණ කටයුතු 573 වන පාබල බළසේනාවේ බළසේනාධිපති විසින් සිදුකළේය. මෙහිදී, භටපිරිස් සමඟ තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන එක්ව කටයුතු කළහ.

# හදිසි ආපදා තත්ත්වයන් සඳහා යුද්ධ හමුදා හටපිරිස් කඩිනම් ප්‍රතිචාර දක්වයි

**ඉකුත් ඔක්තෝබර් මස 19 වන දින සිට 22 වන දින දක්වා කාලය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ ඇති වූ හදිසි ආපදා තත්ත්වයන්ට යුද්ධ හමුදා හටපිරිස් කඩිනමින් ආපදා මෙහෙයුම් දියත් කළහ.**







මහනුවර සිට කොළඹ බලා ධාවනය වූ දුම්රියක් ඉකුත් ඔක්තෝබර් මස 19 වන දින මාවනැල්ල ප්‍රදේශයේදී ඇති වූ නායයෑම් තත්ත්වය හේතුවෙන් පීලි පැනීමට ලක්විය. ඊට කඩිනම් ප්‍රතිචාර දක්වමින්, 8 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් දුම්රිය මාර්ගය යථා තත්වයට පත්කිරීමට මෙන්ම පීඩාවට පත් මගීන්ගේ හා දුම්රිය කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කිරීමට ද කටයුතු කළහ.

මේ අතර, ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින කෑගල්ල, ඉහළ කෝට්ටේ දුම්රිය ස්ථානයේ දී දුම්රියක් පීලි පැනීමකට ලක්වූ අතර, ඊට කඩිනම් ප්‍රතිචාර දක්වමින්, 8 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් එකතුව දුම්රිය බලධාරීන් සමඟ එක්ව දුම්රිය ගමනාගමනය ආරක්ෂිතව නැවත යථා තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළහ.

තවද, 61 වන පාබල සේනාංකය යටතේ 573 වන පාබල බළසේනාවේ ස්ථාපිත 2 (ස්වේච්ඡා) බළඇණිය ගැමුණු හේවා බළකායේ හටපිරිස් විසින් ඉකුත් ඔක්තෝබර් මස 22 වන දින ගාල්ල, පියදිගම ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය ඉහළ යාම හේතුවෙන් අතරමංව සිටි මවක් සහ ඇයගේ මාස දෙකක් වයසැති බිළිඳා ඇතුළු සිවිල් වැසියන් සිව් දෙනෙකු බේරාගනු ලැබූහ. පසුව එම පිරිස ආරක්ෂිතව තාවකාලික සහන සේවා කඳවුරක් ලෙස පවත්වාගෙන යනු ලබන සුදර්ශනාරාම විහාරස්ථානය වෙත රැගෙන යනු ලැබීය. මෙම මෙහෙයුම සඳහා ගාල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පළාත් පාලන ආයතනයන් සිය සහයෝගය යුද්ධ හමුදා හටපිරිස් වෙත ලබාදෙන ලදී.



# රණක්ෂිතයට පත් විරුවන් සඳහා තවත් වෛද්‍ය කඳවුරක්



**යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම යටතේ, රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය එක්ව පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචි යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් සංවිධානය කළ බහු විධ වෛද්‍ය සායන කඳවුරක් ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින 58 වන පාබල සේනාංක මූලස්ථානයේදී පවත්වනු ලැබීය.**



එහිදී, බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය මෙම අවස්ථාවට ප්‍රධානත්වය දැරූහ. මෙම වෛද්‍ය සායනය අතරතුරදී, ඇස් කණ්ණාඩි 300ක්, රෝද පුටු 15ක්, කිහිලිකරු 100ක්, වෝකර් යන්ත්‍ර 5ක් සහ වෛද්‍ය උපකරණ රැසක් රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා ප්‍රදානය කිරීම ද සිදුවිය. තවද, ඊට සහභාගී වූ සියලු දෙනා වෙත දිවා ආහාරය ලබාදීම විශේෂත්වයකි.

මෙම වැඩසටහන මඟින් රණක්ෂිතයට පත් වූ විශ්‍රාමික, වෛද්‍ය හේතුන්මත ඉවත්ව ගිය රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු 1,000කට අධික සංඛ්‍යාවක් සඳහා වෛද්‍ය උපදේශන සේවා, කෘත්‍රිම අවයව නඩත්තු කිරීම, චර්ම රෝග සහ දන්ත සායන, මානසික සෞඛ්‍ය උපදේශන සේවා සහ පෝෂණ උපදේශණ සේවා ලබාදීම සිදුකෙරිණ. එසේම, මෙම වැඩසටහනට සහභාගීවූවන්ට පවතින ගැටලු විමසා නිරාකරණය කිරීම සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරු, ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරින්, රණවිරු සේවා අධිකාරියේ සාමාජිකයින් ඇතුළු නිලධාරින් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගි වූහ.

# බෝ නොවන රෝග නිවාරණය පිළිබඳ වෛද්‍ය කඳවුරක්





22 වන පාබල සේනාංකය සහ ඒ යටතේ පාලනය වන පාබල බළසේනා සහ ඒකකයන්හි රාජකාරී නියුතු සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම හා බෝ නොවන රෝග නිවාරණය පිළිබඳ උපදෙස් ලබාදීමේ කඳවුරක් ඉකුත් සැප්තැම්බර් 25 සහ 29 යන දිනයන් තුළ එම මුලස්ථාන ක්ෂේත්‍ර රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ සහයෝගීතාවයෙන් පැවති මෙම වැඩසටහන සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් 369 දෙනෙක් පමණ සහභාගී වූහ.





### සෙරන්ඩිබ් ලෝක වාර්ථා පොතට එක් වූ
# රණවිරු පියතිස්ස

කඹුරුපිටිය, අභිමංසල 2 සුවතා නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන ගජබා රෙජිමේන්තුවේ පාබල සෙබළ පියතිස්ස ආර්ඩබ්ලිව්වී විසින් පසුගියදා සෙරන්ඩිබ් ලෝක වාර්තාවක් පිහිටුවන ලදී. රණක්ෂිතයට පත්ව දෘශ්‍යාබාධිතව සිටින එම සෙබළාගේ අභියෝගවලට මුහුණ දීමේ ධෛර්යය සහ අධිෂ්ඨානය මෙම ලෝක වාර්ථාව මඟින් කදිමට පෙන්නුම් කළේය. ඉකුත් ඔක්තෝබර් මස 09 වන දින සීනිගමින් ආරම්භ කළ එම පා ගමන ඔක්තෝබර් මස 10 වන දින බත්තරමුල්ල රණවිරු ස්මාරකය අසලින් අවසන් කළ අතර, ඒ සඳහා ඔහුට පැය 18යි මිනිත්තු 51යි තත්පර 12ක කාලයක් ගත විය.

පා ගමන අවසානයේදී පැවති උත්සවයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්වී... ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් රණවිරු පියතිස්ස ආර්ඩබ්ලිව්වී උණුසුම් ලෙස පිළිගන්නා ලදී. යුද්ධ හමුදාවේ 76 වැනි සංවත්සර සැමරුමට සමගාමීව පවත්වන ලද වාර්ථාව සෙරෙන්ඩිබ් ලෝක වාර්තා (පුද්ගලික) සමාගමේ සභාපති වන වෛද්‍ය ලාල් ඒකනායක මහතා විසින් සනාථ කරන ලදී. එය ඔහු විසින් සනාථ කරන ලද 8 වෙනි සෙරෙන්ඩිබ් ලෝක වාර්තාව ද වෙයි.

# ආචාර ධර්ම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්



පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් යුතුව රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් සඳහා පවත්වනු ලබන ආචාර ධර්ම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනේ දෙවන අදියර ඉකුත් ඔක්තෝබර් මස 14 සහ 15 යන දිනයන්හිදී ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ඒ සඳහා යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් 206 දෙනෙක් සහභාගී වූහ. යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී විසින් එහි ආරම්භක දේශනය සිදුකරමින් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ වෘත්තීයමය සහ පෞද්ගලික හැසිරීම් යන දෙකෙහිම ආචාර ධර්ම පවත්වා ගැනීමේ වැදගත්කම මෙහිදී අවධාරණය කරන ලදී.





# අභිමානවත් ගමන් මඟක මතක සටහන්





1 බලකායේ 4 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින එම මූලස්ථානයේදී අභිමානවත් අයුරින් සමරනු ලැබීය. ඒ වෙනුවෙන් ඔක්තෝබර් මස 15 සහ 16 යන දිනයන්හිදී කිලිනොච්චි ලුම්බිණි විහාරය, ශාන්ත තෙරේසා රෝමානු කතෝලික දේවස්ථානය සහ මුරුක්කන්ඩි හින්දු කෝවිලේදී සර්ව ආගමික වතාවත් ද පැවැත්විණ. සංවත්සර දිනයේදී, 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී වෙත 8 රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් කඳවුරු මුරයේ ගෞරවාචාරය පිරිනමනු ලැබූහ. තවද, සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කෙරුණු සාම්ප්‍රදායික කටයුතු රැසක් සඳහා එම බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයෝ සාමූහිකව එක්රොක් වූහ.



## 22 වසරක අභිමානය සැමරූ නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය

නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය සිය 22 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 31 වන දින වැලිකන්දේ පිහිටි එම මූලස්ථාන පරිශ්‍රයේදී අභිමානවත්ව සැමරීය. එම අවස්ථාවට සමගාමීව, ඉකුත් ඔක්තෝබර් මස 24 සහ 25 යන දිනයන්හිදී එම මූලස්ථානයෙහි රාජකාරි කරනු ලබන සාමාජිකයන් වෙත ආශීර්වාද පතා මඩකලපුව සෝමාවතිය මහා සෑය, ශාන්ත මරියා දේවස්ථානය, මාමංග හින්දු කෝවිල සහ අල් ලක්ෂා මුස්ලිම් පල්ලියේදී ආගමික වතාවත් ද සිදුකෙරිණ.



සංවත්සර දිනයේදී, ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී වෙත 2 වන (ස්වේච්ඡා) බළඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනමනු ලැබූහ. එහිදී, ආඥාපති විසින් භටපිරිස් ඇමතීමට ද කටයුතු කළ අතර, උත්සවයේ කටයුතු අවසන් කරමින් සියලු නිල තේ පැන් සංග්‍රහයක්, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් සහ එදින සන්ධ්‍යාවේ සංගීත ප්‍රසංගයක් ද පැවැත්විණි.





# 69 වසරක අභිමන සැමරූ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 69 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින අභිමානවත් අයුරින් සැමරීය. කඳවුරු පරිශ්‍රය වෙත පැමිණි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වෙත හටපිරිස් විසින් කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනැමූහ. එහිදී, රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට බුහුමන් දැක්වීම සඳහා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර පුදකිරීමට ද හෙතෙම එක්විය.

සංවත්සරය වෙනුවෙන් සැමරුම් වැඩසටහන් රැසක් ද පැවති අතර, මහඔය ප්‍රදේශයේ කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ගයක් විවෘත කිරීම ද, ඊට දායක වූ හටපිරිස්හි සේවය ඇගයීම වෙනුවෙන් රෙජිමේන්තු අධිපතිගේ සුරතින් සහතිකපත් ප්‍රදානය කිරීම ද එහිදී එක්විය.





# ගජබා රෙජිමේන්තුව සිය 42 වන සංවත්සරය සමරයි





ගජබා රෙජිමේන්තුවේ 42 වන සංවත්සරය දිනය ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සැමරීය. එහිදී, ධජයන්ට ආශිර්වාද පතා සර්ව ආගමික වතාවත්වලින් සංවත්සර උත්සව මාලාව ආරම්භ වූ අතර, සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව සහ මහා සංඝරත්නය වෙනුවෙන් පිරිනැමූ දානමය පිංකම විශේෂ විය.



තවද, මව්බිම වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයක්ද පැවති අතර, ඒ සඳහා දිවිපිදූ රණවිරුවන්ගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් සහ භාර්යාවෝ රැසක් සහභාගි වූහ. සංවත්සර දිනයේදී, රෙජිමේන්තු අධිපති වෙත කඳවුරු මුරයේ ගෞරවාචාරය පිරිනමන ලද අතර, එතුමන් විසින් ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ පිළිරුවට පුෂ්පෝපහාර දක්වන ලදී. රෙජිමේන්තු අධිපති වෙත සරඹ භූමියේදී හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූළ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනැමීම සහ සියලු නිල දිවා භෝජන සංග්‍රහය සංවත්සර දිනයේ වැඩසටහන් අතර කැපීපෙණුනි.

# 76 වසක අභිමානය මැදින් පෙරට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ 76 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් මස 30 වන දින පනාගොඩ ස්ථාපිත එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී යුද්ධ හමුදා විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සැමරීය. මෙම අවස්ථාවට සමගාමීව, අන්තර් බළඇණි ක්‍රිකට් සහ වොලිබෝල් තරඟාවලියක් ද පනාගොඩ, ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේදී රණවිරු සැමරුම් වැඩසටහනක් සහ දානමය පිංකමක් ද පැවැත්විණ.

සංවත්සර දිනයේදී, බලකාධිපති වෙත හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනමනු ලැබූහ. එහිදී, ජ්‍යාතන්තර හමුදා ක්‍රීඩා කවුන්සිලය විසින් 'Knighthood' සම්මානයෙන් පිදුම් ලැබූ මේජර් ආර්බීඑන් රත්නායක ඇතුළු ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ ඉසව්වලදී යුද්ධ හමුදාවට සහ යුද්ධ හමුදා සේවා බලකායට කීර්තියක් ගෙන දුන් එම බලකායේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට උපහාර දැක්වීම ද සිදුවිය.





# මානසික සෞඛ්‍ය සහ සියදිවි නසාගැනීම් වැළැක්වීම පිළිබඳ වැඩමුළුවක්



සන්නද්ධ හමුදා සාමාජිකයන් අතර මානසික සෞඛ්‍යය සහ "සියදිවි නසාගැනීමේ උත්සාහයන් වැළැක්වීම" යන මැයෙන් තෙදින වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 21 වන දින සිට 23 වන දින දක්වා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හිදී පැවැත්විණි. නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ මානසික සෞඛ්‍ය විශේෂඥයින් විසින් මෙහෙයවනු ලැබූ මෙම වැඩසටහන මගින් යුද්ධ හමුදා සමාජිකයන් තුළ ඇතිවන මානසික සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ වැළැක්වීම සඳහා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් අතර දැනුම්වත්භාවය සහ හැකියාව දියුණු කිරීම අරමුණු වේ. ආතතිය හා සම්බන්ධ තත්ත්වයන් කල් ඇතිව හඳුනා ගැනීම, ස්වයං හානි සිදුකර ගැනීමේ අවස්ථා හඳුනාගැනීම සහ සියදිවි නසා ගැනීමේ අවදානම අවම කිරීම සඳහා වන නිවාරණ පියවර මෙහිදී අවධාරණය කෙරිණි. මෙම වැඩසටහනෙහි සමාප්ති දේශනයේදී, ආරක්ෂක සේනා නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින් මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රයත්නයන් ඇගයීමට ලක්කළ අතර, මානසික ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ දැනුම්වත් කිරීම් සහ ආයතනික සහයෝගය අවශ්‍ය බවද අවධාරණය කළේය.

# රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් "යුද සාහිත්‍යය" දේශනයක්





"යුද සාහිත්‍ය" පිළිබඳ දේශනයක් ඉකුත් ඔක්තෝබර් මස 22 වන දින පල්ලෙකැලේ පිහිටි 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේදී පැවැත්විණ. මේ සඳහා එම ඒකකයට අයත් 200කට ආසන්න භටපිරිසක් සහභාගී වූ අතර, ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද එම අවස්ථාවට එක්වීම විශේෂත්වයකි. යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂගේ උපදෙස් හා මඟපෙන්වීම මත සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ලෙස පැවති මෙම දේශනය ජනමාධ්‍ය සහ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් ඊඡ්ඡ් සුජිත් චමින්ද විසින් මෙහෙයවන ලදී. එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත්, යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් අරමුණ විය.

# මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සබැඳි දේශනයක්



යුද්ධ හමුදා සාමාජිකයින් මත්ද්‍රව්‍ය උවදුරෙන් මුදවා ගැනීමේ අරමුණින් 54 වන පාබල සේනාංකය හා ඒ යටතේ ඇති බළසේනා සහ ඒකකයන්හි භටපිරිස්වල සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු "අන්තරායකර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම" පිළිබඳ දැනුම්වත් කිරීමේ දේශන ද්විත්වයක් පසුගියදා පැවැත්විණ. මේ යටතේ ඉකුත් සැප්තැම්බර් මස 25 වන දින 8 විජයබාහු පාබල රෙජිමේන්තුවේදී ද සැප්තැම්බර් 26 වන දින 54 වන පාබල සේනාංක මූලස්ථානයේදි ද දේශන පැවැත්විණ. අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය අධ්‍යාපන නිවාරණ හා තොරතුරු නිලධාරිනී ඉනූෂා හෙට්ටිආරච්චිගේ මහත්මිය විසින් මෙම දේශන මෙහෙයවූවාය.

# දැනුම්වත් කිරීමේ දේශනයක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් සංවිධානය කරන ලද දැනුම්වත් කිරීමේ දේශනයක් ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා මූලස්ථානයේ සියලු ශාඛා අංශයන්හි රාජකාරී නියුතු අයවලුන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී යුද්ධ හමුදා ආයතන තුළ ඇති පද්ධතිමය බාධාවන් නිවැරදිව හඳුනාගැනීමටත්, ඒවා මඟහරවා ගැනීමටත්, ආයතනයක් ලෙස ක්‍රියාකළ යුතු ආකාරයත් පිළිබඳ දැනුම්වත් කෙරිණ. එමඟින් කාර්යක්ෂමතාවය හා නිවැරදිභාවය රැකෙන පරිදි කටයුතු කළ යුත්තේ කෙසේද යන කරුණු පිළිබඳව මෙන්ම දූෂණ අවදානම් සහ අල්ලස පිළිබඳව අවබෝධයක් ලබාදීම කෙරෙහි ද අවධානය යොමු කෙරිණ.

# නිවැරදි තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම පිළිබඳව වැඩමුළුවක්





යුද්ධ හමුදා සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිලධාරින් සඳහා සංවිධානය කරන ලද "නිවැරදි තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම" පිළිබඳ වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථාන බහුකාර්ය ශාලාවේදී පැවැත්විණ. යුද්ධ හමුදා තත්ත්ව ආරක්ෂණ හා පිරික්සුම් අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එල්එස්ඩීඑන් පතිරත්න ආර්එස්පී යූඑස්පී විසින් මෙම වැඩමුළුව මෙහෙයවනු ලැබූ අතර, පිරිවිතර සකස් කිරීමේ තාක්ෂණික ක්‍රම පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබාදීම තුළින් යුද්ධ හමුදා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සමස්ත ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

# බෝ නොවන රෝග පිළිබඳ දේශනයක්









වන්නි ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් සංවිධානය කළ බෝ නොවන රෝග පිළිබඳ දේශනයක් 2025 ඔක්තෝබර් මස 01 වන දින එම මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම වැඩසටහන යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශක මනෝචිකිත්සක වෛද්‍ය බ්‍රිගේඩියර් ඒඑස්එම් විජේවර්ධන (විශ්‍රාමික) යූඑස්පී එම්බීබීඑස් එම්ආර්සීපී එෆ්ආර්සීපී (යූකේ), උපදේශක මනෝචිකිත්සක වෛද්‍ය බ්‍රිගේඩියර් ආර්එම්එම් මොනරාගල යූඑස්පී, උපදේශක ප්‍රජා වෛද්‍ය මේජර් පීජ්එස් ඩී ජෝතිපාල සහ ආහාරවේදී මේජර් ඒසීකේ උඩුගම යන නිලධාරී කණ්ඩායමක් විසින් මෙහෙයවනු ලැබූහ. මෙම දේශනයේදී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සෞඛ්‍යමත් පැවතුම්, ආතති කළමනාකරණය, පෝෂදායී ආහාර පිළිවෙත් යන ප්‍රධාන මාතෘකා යටතේ කරුණු සාකච්ඡා කෙරිණි.

# දකුණු ආසියාවේ වේගවත්ම ක්‍රීඩිකාව සහ ක්‍රීඩකයා යුද්ධ හමුදාවෙන්

**ඉන්දියාවේ රංචි හි පැවති 4 වන දකුණු ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේදී ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශිෂ්ට දස්කම් දක්වමින් ජාතියට සහ යුද්ධ හමුදාවට ඉමහත් ආඩම්බරයක් ගෙන දුන්හ.**





එහිදී, පිරිමි මීටර් 100 ඉසව්ව තත්පර 10.30කින් නිමකරමින් චමෝද් යෝධසිංහ විසින් එම ඉසව්වේ රන් පදක්කම සහ දකුණු ආසියාවේ වේගවත්ම මිනිසා යන කිරුළ දිනාගන්නා ලදී. එසේම, කාන්තා මීටර් 100 ඉසව්ව තත්පර 11.53කින් නිමකරමින් සෆියා යමික් එම ඉසව්වේ රන් පදක්කම දිනාගනිමින් දකුණු ආසියාවේ වේගවත්ම කාන්තාව බවට පත්වූවාය. එමෙන්ම, එම ඉසව්වේ රිදී පදක්කම තවත් යුද්ධ හමුදා ක්‍රීඩිකාවක් වන අමාෂා ද සිල්වා විසින් දිනාගන්නා ලදී. තවත් මෙවැනි ජයග්‍රහණ ජාතියට ලබාදෙමින් විග්නරාජ් වක්සන් පිරිමි මීටර් 5000 ඉසව්වෙන් තරඟ කරමින් රිදී පදක්කම දිනාගත් අතර, පසිඳු මල්ෂාන් විසින් පිරිමි ත්‍රිත්ව පැනීමේ ඉසව්වෙන් මීටර් 16.19ක දුරක් පනිමින් එම ඉසව්වේ රන් පදක්කම දිනාගන්නා ලදී. තවද, පිරිමි මීටර් 400 ඉසව්ව තත්පර 46.21 ක කාලයකින් නිමාකරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මලල ක්‍රීඩක කාලිංග කුමාරගේ එම ඉසව්වේ රන් පදක්කම දිනාගත්තේය.










මෙරට නියෝජනය කළ එම යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිස ඉකුත් ඔක්තෝබර් මස 28 වන දින දිවයිනට පැමිණියහ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට පැමිණි එම පිරිස ගරු ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය සුනිල් කුමාර ගමගේ මහතා, යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරු ඇතුළු එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පිළිගනු ලැබූහ.

දකුණු ආසියානු කලාපයේ සිටින ඉහළ පෙළේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ තරඟ කරමින්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් ජවන හා පිටිය තරඟ ඉසව්වලදී විශිෂ්ට දක්ෂතා දක්වමින් යුද්ධ හමුදාවට මෙන්ම මෙරටට ලබාදුන්නේ ඉමහත් කීර්තියකි. සමස්ත තරඟාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් රන් පදක්කම් 12ක්, රිදී පදක්කම් 8ක් සහ ලෝකඩ පදක්කම් 7ක් දිනාගනිමින් ඔවුහු එම ඓතිහාසික ජයග්‍රහනයට හිමිකම් කියූහ.

# දකුණු ආසියාව එකලු කළ විරුවන් ඇගයේ












ඉන්දියාවේ රංචි හි පැවති 4 වන දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියේදී යුද්ධ හමුදාවට මෙන්ම සමස්ථ මව්බිමටම ඉමහත් ආඩම්බරයක් ගෙන දෙමින් රන් පදක්කම් 12ක්, රිදී පදක්කම් 8ක් සහ ලෝකඩ පදක්කම් 7ක් දිනාගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමේ උත්සවයක් ඉකුත් ඔක්තෝබර් මස 30 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

එහිදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කැපවීම තුළින් ලැබූ එම ජයග්‍රහණ පෞද්ගලිකව අගය කරමින් ඉදිරියේදී ද තවතවත් එවැනි ජයග්‍රහණයන් අත්කරගැනීම සඳහා දිරිගැන්වීම පිණිස ඔවුන් වෙත මුදල් ත්‍යාග පිරිනමන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී, රෙජිමේන්තු අධිපතිවරු, කර්නල් සේනා විධායකවරු, ක්‍රීඩා අධ්‍යක්ෂ සහ පුහුණුකරුවන් ද සහභාගී වූහ. එසේම, මෙම ජයග්‍රහණ හිමි කරගන්නා ලද යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 18 දෙනාගේ කැපවීම හා දක්ෂතා අගයමින් යුද්ධ හමුදාධිපති විසින් ඔවුනගේ නිල උසස් කිරීම් සිදුකිරීමට ද කටයුතු කිරීම විශේෂය.







# ලොව හොඳම පැරා මලල ක්‍රීඩකයින් අතරට එක් වූ රණවිරුවා




2025 ඔක්තෝබර් මස 02 වන දින ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති ලෝක පැරා මලල ක්‍රීඩා ශූරතාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පැරා මලල ක්‍රීඩක කෝප්‍රල් නුවන් ඉන්දික ගමගේ විසින් ලෝකඩ පදක්කමක් දිනාගන්නා ලදී. එහිදී, ඔහු පිරිමි T44 දුර පැනීමේ ඉසව්වෙන් මීටර් 6.46ක දුරක් වාර්තා කරමින් ලොව හොඳම පැරා මලල ක්‍රීඩකයින් අතරට එක්වීම විශේෂය.




# ක්ලිෆර්ඩ් කුසලාන මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය





ශ්‍රී ලංකා මුෂ්ඨි ප්‍රහාර සංගමය විසින් සංවිධානය කරන ලද ක්ලිෆර්ඩ් කුසලාන මුෂ්ඨි ප්‍රහාර තරඟාවලිය ඉකුත් ඔක්තෝබර් මස 15 වන දින සිට 19 වන දින දක්වා කොළඹ රාජකීය විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. තරඟාවලිය සඳහා ක්‍රීඩා සමාජ 20කින් පිරිමි මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩකයින් 92 දෙනෙක් සහ කාන්තා මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩිකාවන් 42 දෙනෙක් සහභාගි වූහ. එහිදී යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම විසින් බර පන්ති 10ක් යටතේ රන් පදක්කම් 07ක්, රිදී පදක්කම් 03ක් සහ ලෝකඩ පදක්කම් 12ක් දිනාගනිමින් ක්ලිෆර්ඩ් කුසලාන අභියෝගතා කුසලානය දිනාගන්නා ලදී. එම තරඟාවලියේදී, යුද්ධ හමුදා කාන්තා කණ්ඩායම ද රන් පදක්කම් 02ක්, රිදී පදක්කම් 06ක් සහ ලෝකඩ පදක්කම් 01ක් දිනා ගනිමින් සිය දක්ෂතා දැක්වීය.

3 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සැරයන් ප්‍රියදර්ශනී එච්එස් කිලෝග්‍රෑම් 51ට අඩු බර පන්තියේ කැපී පෙනෙන දක්ෂතා දැක්වීම වෙනුවෙන් තරඟාවලියේ දක්ෂතම මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩිකාව ලෙස තේරී පත්වූවාය. යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායමේ සභාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාර කණ්ඩායම මෙම තරඟාවලියට සහභාගි විය.



# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු චෙස් තරඟාවලිය - 2025










යුද්ධ හමුදා චෙස් කමිටුව විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු චෙස් තරඟාවලිය - 2025 ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් සැප්තැම්බර් මස 22 වන දින සිට 26 වන දින දක්වා පැවැත්විණ. ඒ සඳහා රෙජිමේන්තු 14ක් නියෝජනය කරමින් පිරිමි සහ කාන්තා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 135 දෙනෙක් සහභාගී වූහ. තරඟාවලියේ සමාප්ති උත්සවය සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදා චෙස් කමිටුවේ සභාපති සහ විනයාරක්ෂකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් අබේසිංහ එන්ඩීසී සහභාගී විය.

මේ සඳහා විවෘත සහ කාන්තා යන කාණ්ඩ දෙක යටතේ ස්ටෑන්ඩඩ්, බ්ලිට්ස් සහ කණ්ඩායම් යන තරග ඉසව් ඇතුළත් වූ අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කණ්ඩායම ලකුණු 245ක් ලබාගනිමින් සමස්ත ශූරතාවයත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා කණ්ඩායම ලකුණු 200ක් ලබාගනිමින් අනුශූරතාවයත් හිමිකරගත්හ. එසේම ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා කණ්ඩායම සහ ඉංජිනේරු සේවා බලකා කණ්ඩායම ලකුණු 105 බැගින් ලබා ගනිමින් තෙවන ස්ථානයට හිමිකම් කියූහ. තරඟාවලියේ විවෘත පිරිමි ස්ටෑන්ඩඩ් ඉසව්වෙන් ඉංජිනේරු සේවා බලකායේ ලුතිනන් ආර්ඩීඒඑම් සුරවීර, කාන්තා ස්ටෑන්ඩඩ් ඉසව්වෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් දසනායක අයිඑන්ඩී, බ්ලිට්ස් විවෘත ඉසව්වෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ ලාන්ස් කෝප්‍රල් ද සිල්වා ඩීඑන්එස්, බ්ලිට්ස් කාන්තා ඉසව්වෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ කෝප්‍රල් ආරියරත්න ඩබ්ලිව්ජීඑච්එස් ජයග්‍රහණ හිමිකරගත්හ. තවද, විවෘත කණ්ඩායම් ඉසව්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය ද කාන්තා කණ්ඩායම් ඉසව්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය විසින් ද දිනාගනු ලැබූහ.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් ශූරතාවලිය 2025





යුද්ධ හමුදා ස්කොෂ් කමිටුව විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් ශූරතාවලිය-2025 යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 11ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 185 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 05 වන දින සිට 15 වන දින දක්වා මත්තේගොඩ යුද්ධ හමුදා කඳවුරේදී පැවැත්විණි. තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීකේආර්එන් සිල්වා ආර්එස්පී යූඑස්පී සහභාගී විය. එහිදී, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තු කණ්ඩායම විසින් විවෘත පිරිමි අංශයේ ශූරතාව දිනාගත් අතර, ගජබා රෙජිමේන්තුව විසින් අනුශූරතාවය දිනාගන්නා ලදී.

# වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩසටහනක්





76 වන හමුදා දින සැමරුමට සමගාමීව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ හටපිරිස් විසින් කොස්ගම, රජයේ රෝහලේ වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීමේ වැඩසටහනක් සිදුකරනු ලැබූහ.

එහිදී, කොස්ගම, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා වැඩපොලෙහි හටපිරිස්හි සහාය ඇතිව භාවිතයෙන් ඉවත් කර තිබූ රෝද පුටු හතක්, ට්‍රොලි තුනක්, සේලයින් ස්ටෑන්ඩ් අටක් සහ ඇඳන්, ප්‍රතිසංස්කරණය කරනු ලැබීය. යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්පීඑස් පීඑස්සී විසින් එම උපකරණ තොගය ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින රෝහල් බලධාරීන් වෙත භාරදෙන ලදී. එසේම, ඔවුන්ගේ ඉල්ලීමකට අනුව හටපිරිස් එකතුව රෝහල් පරිශ්‍රය පිරිසිදු කිරීමේ දින දෙකක වැඩසටහනක් ද පවත්වනු ලැබූහ.

# පුපුරණ ද්‍රව්‍යවල අවදානම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්





7 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින් ඉකුත් ඔක්තෝබර් මස 19 වන දින සේරුනුවර, 215, F සුහසාධන ප්‍රජා මධ්‍යස්ථානයේදී ප්‍රදේශවාසීන් සඳහා පුපුරණ ද්‍රව්‍යවල අවදානම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. සේරුනුවර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම වැඩසටහන සංවිධානය කෙරිණ. පුපුරා නොගිය බිම්වෙඩිවලින් එල්ල වන අනතුරු පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ ප්‍රදේශයේ දක්නට ලැබෙන ඕනෑම සැක සහිත පුපුරණ ද්‍රව්‍ය පිළිබඳව දැනුවත් කිරීම, හඳුනා ගැනීම සහ වහාම වාර්තා කිරීමේ වැදගත්කම පෙන්වාදීමේ අරමුණින් මෙම වැඩසටහන පැවැත්විය. ඒ අනුව, එහිදී සහභාගිවූවන් වෙත විවිධ වර්ගයේ පුපුරණ ද්‍රව්‍යවලින් වන අනතුරු, ඒවායින් ආරක්ෂා වීමේ ක්‍රම සහ එවැනි සැක සහිත පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීමක් සිදුවුවහොත් පළාත් පාලන ආයතන හෝ යුද්ධ හමුදාව දැනුම්වත් කිරීම සඳහා ගතයුතු නිවැරදි ක්‍රියා පටිපාටි පිළිබඳව අවබෝධය ලබාදෙන ලදී.

පූනගර් බිම්බෝම්බ ඉවත් කිරීමේ ස්ථානයේ මානුෂීය බිම්බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම්වල නියැළී සිටින ඉංජිනේරු බලකා හටපිරිස් විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලද අතර, එහිදී විවිධ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරමින් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතා කරමින් සැබෑ සිදුවීම් ආදිය උදාහරණ වශයෙන් ඉදිරිපත් කිරීම ද සිදුකරන ලදී.



# විරු සවියෙන් හිසට සෙවණක්





76 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව කරෙයිනගර් ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් සඳහා ඉදිකරනු ලැබූ නව නිවසක් එම ප්‍රතිලාභීන් වෙත පවරාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 10 වන දින පැවැත්විණ. 51 වන පාබල සේනාංකයේ උපදෙස් මත 513 වන පාබල බළසේනාවේ අධීක්ෂණය යටතේ, 11 ශ්‍රී ලංකා පාබල හමුදාවේ භට පිරිස් විසින් ඉදිකරනු ලැබූ මෙම නිවස විවෘත කිරීමේ අවස්ථාවට 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ජ් මුතුමාල යූඑස්පී පීඑස්සී ඇතුළු රාජ්‍ය නිලධාරීන් පිරිසක් සහභාගී වූහ. වන්නි ඒඩ් කැනඩා සංවිධානය විසින් පහසුකම් සපයන ලද, අභාවප්‍රාප්ත හර්බට් අලගරත්නම් මහතා සිහි කිරීම සඳහා "ජෝ-පීට් 68 කණ්ඩායමේ" මිතුරන්, මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණයෙන් මෙම නිවස ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදුන්හ.



4 බළඇණිය ගැමුණු හේවා බලකායේ භටපිරිස් විසින් කොමතරෙ උතුර ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා සහිත පවුලක් සඳහා ඉදිකරන ලද නව නිවසක් ඉකුත් ඔක්තෝබර් මස 15 වන දින නිවාසලාභීන් වෙත පවරාදෙනු ලැබූහ. මෙම නිවාස ව්‍යාපෘතියට ළමා හදිසි සහන සංවිධානය විසින් අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. නව නිවස විවෘත කිරීමේ අවස්ථාවට නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ ළමා හදිසි සහන අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයේ ඉන්දියාවේ ජාතික අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකාවේ වැඩබලන ප්‍රධානී Mr. Nitin Tonk සහභාගී වූහ.



# දිරිය දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් වෙමින්





21 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති අනුරාධපුර නබඩවැව විද්‍යාලයේ සහ අනුරාධපුර පුලියන්කඩවල ප්‍රාථමික විද්‍යාලයන්හි ඉගෙනුම ලබන දරු දැරියන් 150ක් වෙනුවෙන් පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 26 වන දින එම විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. "Clean Sri Lanka" වැඩසටහන යටතේ සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා පූර්ණ අනුග්‍රහය ඩීපීඑස්එස් රාජපක්ෂ මහතා විසින් ලබාදුන් අතර, සිසුවෙක් වෙනුවෙන් පාසල් පාවහන්, පොත්බෑග්, කුඩයක් ඇතුළු වසරකට අවශ්‍ය සෑම පාසල් උපකරණයක්ම ඇතුළත් වන පරිදි සැකසූ රුපියල් 13,000.00ක් පමණ වටිනාකමකින් යුතු උපකරණ කට්ටලය බැගින් ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට 21 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑම්වී කොඩිතුවක්කු එන්ඩීසී, ඩීපීඑස්එස් රාජපක්ෂ මහතාගේ ඥාතීන් හා හිතවතුන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.





කොළඹ ජාත්‍යන්තර පාසලේ මහනුවර ශාඛාවේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් එක්ව ත්‍රිකුණාමලයේ එරක්කණ්ඩි සිංහල මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් රුපියල් 400,000.00ක් පමණ වටිනා පාසල් උපකරණ සහ සන්නිවේදන උපකරණ කට්ටල පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 04 වන දින සිදුකරනු ලැබූහ. 221 වන පාබල බළසේනාවේ බළසේනාධිපති  බ්‍රිගේඩියර් ඊඩබ්ලිව්ආර්එස්බී ඇහැලේපොල යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී සහ කොළඹ ජාත්‍යන්තර පාසල මහනුවර ශාඛාවේ ව්‍යාපාර අධ්‍යන අංශයේ අංශ ප්‍රධානී අංජලී ඇහැලේපොල මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදුකෙරුණු මෙම වැඩසටහන සඳහා මහනුවර පිටකන්ද පාරේ "සපුමල් සංගමය" විසින් ද එම දරු දැරියන් උදෙසා පාසල් බෑග් 50ක් පරිත්‍යාග කිරීමට ද  කටයුතු කරන ලදී.






242 වන පාබල බළසේනාව විසින් සංවිධානය කරන ලද පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින අම්පාර පානම මහා විද්‍යාලයේදී පැවැත්විණ. එක්සත් රාජධානියේ සිංහල බලමණ්ඩලයේ සභාපති, මොරටුව ප්‍රදේශයේ පදිංචි ගාමිණී කීර්තිචන්ද්‍ර මහතා මෙම වැඩසටහනට මූල්‍ය අනුග්‍රහය දැක්වූ අතර, එහිදී, තෝරාගත් පාසල් අටක සිසුන් 100 දෙනෙකුට අත්‍යවශ්‍ය පාසල් උපකරණ හිමිවිය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලෙකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය.

# පාසල් උපකරණ බෙදා දෙමින්





මන්නාරම මඩුපාර සිංහල මහා විද්‍යාලය හා මන්නාරම ශාන්ත ලුඩ්ස් මහා විද්‍යාලයේ පාසල් හි ඉගෙනුම ලබන සිසු සිසුවියන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩටහනක් ඉකුත් ඔක්තෝබර් මස 16 වන දින මන්නාරම ශාන්ත ලුඩ්ස් මහා විද්‍යාලයේදී පැවැත්විණ. 542 වන පාබල බළසේනාව සහ 4 ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා අනුග්‍රහය ලබාදීම නික/වාරියපොල ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයේ මගපෙන්වීම මත එම විද්‍යාලයේ ශිෂ්‍ය නායක නායිකාවෝ විසින් සිදුකරනු ලැබූහ.

# අක්ෂි සායනයක්






වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ භටපිරිස් එකතුව ප්‍රදේශයේ දෘශ්‍යාබාධිත සිවිල් වැසියන් 364 දෙනෙකු සඳහා ඉකුත් ඔක්තෝබර් මස 02 වන දින විශේෂ අක්ෂි සායනයක් පවත්වනු ලැබූහ. එහිදී, දෘශ්‍යාබාධිත සිවිල් වැසියන් හට අක්ෂි පරීක්ෂාවන්, වෛද්‍ය උපදේශන සහ අක්ෂි සත්කාර සේවා පිළිබඳ විශේෂඥ උපදෙස් ලබා දෙනු ලැබූහ. 561 වන පාබල බළසේනාවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමයේ සහයෝගය ඇතිව පවත්වනු ලැබූ මෙම වැඩසටහන සඳහා 16 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් සිය සහයෝගය ලබාදුන්හ.

# ලේ දන්දීමේ වැඩසටහනක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා 76 වන සංවත්සර දිනයට සමගාමීව කුට්ටිගල පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා වෘත්තීය පාසලේ භටපිරිස් විසින් ඉකුත් ඔක්තෝබර් මස 13 වන දින ලේ දන්දීමේ වැඩසටහනක් කුට්ටිගල ජයතිමාපියපුර ප්‍රජා ශාලාවේදී පැවැත්විය. එම වෘත්තීය පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමාජ සත්කාරය සඳහා කොළඹ සෙන්ටේනියල් සිංහ සමාජයේ පූර්ණ අනුග්‍රාහක දායකත්වය මත රත්නපුර සහ ඇඹිලිපිටිය රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ නොමඳ සහාය හිමිවූහ. මේ සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් සහ ප්‍රදේශවාසීන් ඇතුළුව 152ක් ලේ පරිත්‍යාග කිරීම සඳහා එක්වූහ.

හෙට දිනන දරු කැළට මග තනන විරු කැළ

# ලෝක ළමා දිනයේ

මතක සටහන්

ගෙවුණු ඔක්තෝබර් මස 01 වන දිනට යෙදී තිබුණු ලෝක ළමා දිනය නිමිත්තෙන් යුද හමුදාවේ ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක, බළසේනා, ඒකක මෙන්ම දිවයින පුරා පිහිටි විරුකැකුළු පෙර පාසල් ඇතුළු අංශ ආයතන රැසක ද සැමරුම් උත්සව පැවැත්විණ. රණවිරුවන්ගේ හා සිවිල් ප්‍රජාවේ දරුවන්ගේ ද සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු එම එකතුවීම එම දරු දැරියන්ට නැවුම් අත්දැකීම් ගෙනදුන් අවස්ථා විය. විශේෂයෙන්ම එහිදී එම දරු දැරියන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා රැසක් ද සම්පූර්ණ කෙරුණු අතර, ඔවුනට ආහාරපාන ආදියෙන් සංග්‍රහ කිරීම් ද අඩු නොවීය. දරුවන්ගේ අපූරු හැකියාවන් ද ඉස්මතුව උතුරු  නැගෙනහිර ඇතුළුව දිවයින පුරා පැවැත්වූ එම ලෝක ළමාදින සොඳුරුබර සැමරුම් අවස්ථාවලින් මෙම පිටුව වර්ණවත් වේ.












# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙන් සුබසාධන වැඩසටහනක්







යුද්ධ හමුදාවේ සක්‍රීය සේවයේ නියුතු රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන සුභසාධක වැඩසටහන්හි තවත් එක් අදියරක් ලෙස නව නිවාස, අර්ධ නිවාස මූල්‍යාධාර සහ වෛද්‍යාධාර පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් මස 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය සහභාගී වූහ.

## සෙවණක් තනන්නට සවියක් ලැබේදී



එසේම, ඉකුත් ඔක්තෝබර් මස 24 වන දින ද යුද්ධ හමුදා මූලස්ථානයේදී තවත් එවැනි වැඩසටහනක් පැවැත්විණ. යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා ඒකක සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායට අයත් කෝප්‍රල් ධර්මප්‍රිය ඩබ්ලිව්බී, ගජබා රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් පහලගෙදර එල්පී යන කොනොනින් දෙදෙනාට සහ එච්පී තිලකරත්න යන සිවිල් සේවක මහත්මා වෙනුවෙන් රුපියල් ලක්ෂ පහළොව (රු. 1,500,000.00) බැගින් වූ මූල්‍යාධාර හිමිගැන්වූහ.





# නව රූපලාවණ්‍යාගාරය සුබ මොහොතින් විවෘත කෙරේ





යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ප්‍රයෝජනය උදෙසා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන "Shop of the Garrison" දියතලාව වෙළෙඳ සංකීර්ණයෙහි නවතමයෙන් ඉදිවූ නවීන අංගෝපාංගයන්ගෙන් හා පහසුකම්වලින් සමන්විත කාන්තා රූපලාවන්‍යාගාරය යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින විවෘත කරනු ලැබුවාය. එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාලනය කරනු ලබන දියතලාව විරුකැකුළු පෙර පාසලේ සහ 8 යුද්ධ හමුදා සේවා බලකාය වෙතින් පාලනය කරනු ලබන යෝගට් ව්‍යාපෘතියෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත වන්නට ද එතුමිය අමතක නොකළාය.

# ඇඳුම් මැසීම පිළිබඳ වැඩමුළුවක්





මැනිංටවුන් විවාහක නිවාසයන්හි පදිංචි නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ භාර්යාවන් සඳහා ස්වයං රැකියා අවස්ථාවන් ලබාදීමේ අරමුණින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සංවිධානය කළ ඇඳුම් මැසීම පිළිබඳ වැඩමුළුවක් ඉකුත් ඔක්තෝබර් මස 07 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ෆෙස්ටල් ආයතනයේ රොෂානි ඇන්තනී මහත්මිය සහ නෙලෝනි සේනානායක මහත්මිය විසින් මෙම වැඩමුළුව මෙහෙය වූ අතර, ඊට සහභාගී වූ අයවළුන් සඳහා පාසල් නිල ඇඳුම් මැසීම පිළිබඳ පුහුණුවක් ලබාදීම ද මෙහි අරමුණක් විය.

# ජාතික රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹේ





ආරක්ෂක අමාත්‍යාංශ සේවා වනිතා ඒකක සභාපතිනි වෛද්‍ය රසිකා පෙරේරා මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මියගේ මඟපෙන්වීම මත වැලිසර ශ්වසන රෝග පිළිබඳ ජාතික රෝහලේ ප්‍රතිසංස්කරණ කටයුතු ඉකුත් ඔක්තෝබර් මස 25 වන දින ආරම්භ කෙරිණ. ශ්වසන රෝග පිළිබඳ ජාතික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය නිර්මලා යෝගනාදන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ අයවලුන් පිරිසක් ඊට එක්වූහ.

# රණක්ෂිතයට පත් විරුවන් හට පරිත්‍යාගයක්



කඹුරුපිටිය අභිමංසල 2 සුවතා නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් ඇගයීමේ අරමුණින් සංවිධානය කෙරුණු වැඩසටහනක් කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සමින්දි වික්‍රමරත්න මහත්මියගේ මඟපෙන්වීම මත පසුගියදා පැවැත්විණ. ගණේමුල්ල පිහිටි කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති මෙම වැඩසටහනේදී රණක්ෂිතයට පත් විරුවන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ ඇසුරුම් බෙදාදෙන ලදී.

# දිරිය දිනන දරුවන්ට අත්වැලක්





සන්නද්ධ බුද්ධි බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ටීඑන් මජීඩ් ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිඑස්සී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉල්මා මජීඩ් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයක් ඉකුත් ඔක්තෝබර් මස 03 වන දින සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. 2024 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දුවා දරුවන් අතුරින් වැඩිම ලකුණු ලබාගත් දූ දරුවන් 25 දෙනෙකුට, 2024 වර්ෂයේ අ.පො.ස(සා/පෙළ) ඒ සාමාර්ථ 09ක් ලබාගත් දරුවෙකුට සහ අ.පො.ස (උ/පෙළ) ඒ සාමාර්ථ 03ක් ලබාගත් දරුවකු සඳහා එහිදී මූල්‍යාධාර හා පාසල් උපකරණ ප්‍රදානය කෙරිණ. සිදුකරන ලදී.

# සොල්දාදු මවකට ඇවිදින්න වාරුවක්




ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව මැදිහත්ව අංශභාග රෝගයෙන් පෙළෙන මවකට රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී. ඉකුත් ඔක්තෝබර් මස 29 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉසේබ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මියගේ සහභාගීත්වයෙන් මෙම මාහැඟි කටයුත්ත සිදුවිය.

# නිවාඩු නිකේතනය වෙනුවෙන් පරිත්‍යාගයක්

තිසාවැව පිහිටි 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායෙහි නවතමයෙන් ඉදිකිරීමට නියමිත සෙසුනිල නිවාඩු නිකේතනය සඳහා මුදලින් රුපියල් 2,500,000.00ක මුදල් පරිත්‍යාගයක් ඉකුත් සැප්තැම්බර් මස 30 වන දින සිදුකෙරිණ. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අජන්තා ද සිල්වා මහත්මිය විසින් එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්එම්ජේඅයි දිසානායක යූඑස්පී එල්එස්සී වෙත අදාළ චෙක්පත පිරිනැමුවාය.



# සිවිල් සේවක මහතෙකුගේ සේවාව අගයමින්



ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් 1996 දී පරන්තන් ප්‍රදේශයේදී මෙන්ම 1999 දී වව්නියාව සහ 2006 මුහමාලේ ප්‍රදේශයේදී තුන් වතාවක් තුවාල ලැබූ යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ සිවිල් සේවක මහතකු වන ජී ගීත් උදය කුමාර මහතා වෙත මූල්‍ය ප්‍රදානයක් සිදුකෙරිණ. ඉකුත් ඔක්තෝබර් මස 13 වන දින යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති මාසික සභා රැස්වීමේදී මෙම මූල්‍ය පරිත්‍යාගය පිරිනැමුණු අතර, එම අවස්ථාවට ප්‍රධාන අමුත්තිය ලෙස යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරානි නිමර්ලීන් විජේකෝන් මහත්මිය සහභාගී වූවාය.

# යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය




ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස නයෝමිණි කුසුම් ද සිල්වා මහත්මිය ඉකුත් ඔක්තෝබර් මස 08 වන දින සිට පත්ව ඇත.



# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්

මියගිය 3 යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායට අයත් සාමාජිකයින්ගේ දූ දරුවන් 08 දෙනෙකු උදෙසා වටිනා පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් මස 20 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිරෝෂිකා කරුණාපාල මහත්මිය ඇතුළු එම ශාඛා සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# අලුත උපන් බිලිඳුන් වෙනුවෙන් පරිත්‍යාගයක්



6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රාජකාරී නියුතු සෙ/කිව්112516 කෝප්‍රල් සෙනවිරත්න යූඑච්ජීආර්ජ්පී යන කොනොනිගේ බිරිඳ විසින් නිවුන් දරුවන් බිහිකළ අතර, ඔහුගේ පවුලට යම් සහනයක් ලබාදීමේ අරමුණින් ඉකුත් සැප්තැම්බර් 29 වන දින ඔවුනට කිරිපිටි පරිත්‍යාගයක් සිදුකරනු ලැබීය. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කුමාරි පල්ලේකුඹුර මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම මාහැඟි කටයුත්ත සිදුවිය. මෙම සහයෝගය මාස හයක කාලසීමාවක් අඛණ්ඩව ලබාදීමට සැලසුම් කර ඇත.



# සෙබළ සිතකට කවියකින්...
# “යතුර පාපිස්ස යට”

කවියකින් සෙබළ සිතකට ආමන්ත්‍රණය කළ හැකිද? සෙබළෙකුට කවියක් රසවිඳිය හැකිද? මෙම ලිපිය දුටු විගස ඔබට මෙවැනි හැඟීම් රැසක් ඇතිවනු නොඅනුමානයි. නිල ඇඳුම ඇඳි අවි අතදරා සිටින සෙබළා යටින් ජීවිතය ගෙවන හැඟීම් දැනීම් පිරි මිනිස් සත්වයා කවියකින් ආමන්ත්‍රණය කිරීමට හැකි යන අදහසත් සමඟ මෙම ලිපියේ ආරම්භයක් ලබාගැනීමට බලපොරොත්තුවෙමි.

කවිය හා මිනිසා පිළිබඳව පවතින නිර්වචන රැසකි. රසය ආත්මය කොටගත් වැකිය කවිය ලෙස අර්ථ දක්වා ඇත. විලියම් වර්ඩ්ස්වත් නම් වූ කවියාට අනුව නිරුත්සාහිකව අප තුළින් ගලායන හැඟීම් සමුදාය කවිය ලෙස දැක්විය හැක. කෙසේ වුවද නූතන කවිය බොහෝ සහෘද හදවත් ආමන්ත්‍රණය කර ඇති බව රහසක් නොවේ. කවිය සහ කවියා කෙතරම් සමාජය තුළට කිඳා බැසගෙන හිඳීද යන්න මොනවට පිළිබිඹු වන උදාහරණය නම් ශ්‍රී ලංකා පොලිසීය තුළ පවා සම්මානනීය කවියන් බිහිවෙමින් පැවතීමයි. එසේ බිහිවූ කවියෙකු වන උප පොලිස් පරීක්ෂක ඉලක්ශ ජයවර්ධනගේ අපූර්වතම කවියක් සෙබළ අපගේ ජීවන දෘෂ්ටි කෝණයෙන් සමීප කරවීමට දරණ වෑයමයි මේ.

කාර්යබහුලත්වය පිරි, වගකීම් සමුදායකින් පිරුණු රාජකාරියට තාවකාලික නැවතීමක් ලබා නිවසට යන බොහෝ සොල්දාදුවන් මුහුණදෙන ගැටලුවක පැතිකඩක් මෙම කවිය තුළින් නිරූපණය වේ යන්න මගේ අදහසයි. තම බිරිඳ සහ දරුවන් අමතක කර වෙනත් අසම්මත සම්බන්ධතා බැඳීම තමන්ගේ ජීවිතයට එක්කරගැනීම තුළින් තමන් මෙන්ම ආදරණීය බිරිඳගේ, තමන් නමින් උපන් කුඩා දරුවන්ගේ ජීවිත පවා අහිමිවී යන සෙබළ ජීවිත වර්තමානයේ බොහෝ දැකගත හැක. මෙම කවිය අන්තර්ගතව ඇත්තේ එවන් සම්බන්ධතාවක පැටලුන ස්වාමියෙකුගෙන් බිරිඳක කරන ආයාචනාවකි. ගැහැනු ආත්මයකට ආරූඪ වී වෙනත් ගැහැනියක හා ඇසුරක් පවත්වාගෙන තම ස්වාමියාගේ ආත්මය කරනු ලබන සියුම් ආමන්ත්‍රණය මෙසේයි.

උදේ ගෙදරින් යද්දි නළල වෙත හාදුව..
අමතකව ගියත් මම ඇහුවෙ නෑ හේතුව..
ලේඩීස් පර්ෆියුම් මුසු කමිස හේදුව..
දවස්වල වුනත් නෑ මැරුනෙ පෙම මේරුව..

උයන මොහොතෙත් ඇවිත් ඉනවටේ අත දැම..
මොනවා ඉව්වත් ඉතින් අද රසයිනේ කෑම..
දූවව නිදි කරන්නෙ නැද්ද රහසින් කීම..
මඟහැරුණ දෙයකි තව මහ රැයේදිත් නෑම..

දෙයක් තව මෙමට නෑ හිමිට ගෙනවිත් දෙන්න..
ප්‍රේමයක් තියෙන තැන ගිහින් නැවතී ඉන්න..
දුක්වෙන්න එපා මට හැකිය දුව රැකගන්න..
යතුර පාපිස්ස යට මඟ වැරදුනොත් එන්න..

සිය ස්වාමියා අසම්මත ඇසුරකට පැටලී ඇති බව බිරිඳකට දැනෙන අකාරය පළමු කවියෙන් ඉස්මතු කරවා ඇත. කවියකට යෙදිය හැකි උපමා රූපක අලංකරන නැතත් සරල බස් වහරකින්ම බිරිඳ සිය ශෝකාන්තයට පාදක වූ කරුණ සහෘදයාට එළිකරයි.

උදේ ගෙදරින් යද්දි නළල වෙත හාදුව..
අමතකව ගියත් මම ඇහුවෙ නෑ හේතුව..
ලේඩීස් පර්ෆියුම් මුසු කමිස හේදුව..
දවස්වල වුනත් නෑ මැරුනෙ පෙම මේරුව..

කෙතරම් සාර්ථක පුහුණුවීම් තුළින් සැඟවීම වෙස්වළාගැනීම කෙතරම් ප්‍රගුණ කළත් නිවසට ඔබ යනවිට ඔබේ බිරිඳට ඔබේ හැඟීම් සැඟවීමේ හැකියාවක් නොමැති බව ඔබ සිහියේ තබාගත යුතුමය. නිවාඩු අවසානයේ කඳවුරට පැමිණීමට ප්‍රථම ඔබ බිරිඳට දෙන හාදුව අමතක වීම වරක් දෙවරක් සිදුවන විටදීම එය හඳුනා ගැනීමට බිරිඳට හැකියාව ඇත. මෙම කවි දෙපදයෙන් ගෙනහැර දක්වන්නෙ එයයි.

උදේ ගෙදරින් යද්දි නළල වෙත හාදුව..
අමතකව ගියත් මම ඇහුවේ නෑ හේතුව..

ඔබේ දුරකතනය කාර්යබහුලවීම් ඉහළ යාම්, බිරිඳට ගන්නා ඇමතුම් අඩුවීම, හේතුවක් නැතිව ගමන් බිමන් ඉහළ යාම, තෑගිභෝග ලැබීම ඇයට තව තවත් ඉඟි සපයනු ඇත. ඔබ කොතෙක් සැඟවීමට උත්සාහ කළත් ඔබගේ බිරිඳ ඔබගේ

> "ඔබේ දුරකතනය කාර්යබහුලවීම් ඉහළ යාම්, බිරිඳට ගන්නා ඇමතුම් අඩුවීම, හේතුවක් නැතිව ගමන් බිමන් ඉහළ යාම, තෑගිභෝග ලැබීම ඇයට තව තවත් ඉඟි සපයනු ඇත. ඔබ කොතෙක් සැඟවීමට උත්සාහ කළත් ඔබගේ බිරිඳ ඔබගේ සුළු වෙනස්කම් පවා අඳුනාගනු ඇති බව විශ්වාසය. මන්ද ගැහැනිය යනු ස්වභාවයෙන්ම සැකය උරුම කරගත් කොට්ඨාසයක් බැවිනි. මෙම දෙපදයෙන් කවියා එම සියලු ඉඟියන්, සැකයන් දරාගෙන සිටීමට බිරිඳකට හැකි බව ඉස්මතු කරවයි.
>
> ලේඩීස් පර්ෆියුම් මුසු කමිස හේදුව..
> දවස්වල උනත් නෑ මැරුනෙ
> පෙම මේරුව.."

සුළු වෙනස්කම් පවා අඳුනාගනු ඇති බව විශ්වාසය. මන්ද ගැහැනිය යනු ස්වාභාවයෙන්ම සැකය උරුම කරගත් කොට්ඨාසයක් බැවිනි. මෙම දෙපදයෙන් කවියා එම සියලු ඉඟියන්, සැකයන් දරාගෙන සිටීමට බිරිඳකට හැකි බව ඉස්මතු කරවයි.

ලේඩීස් පර්ෆියුම් මුසු කමිස හේදුව..
දවස්වල උනත් නෑ මැරුනෙ පෙම මේරුව..

අසම්මත ඇසුර සමඟ ස්වාමියාගෙන් ගිලිහී යන ආදරණීය බව බිරිඳක් දරාගන්නා අයුරු දෙවන කවියෙන් කවියා ඉස්මතු කරයි.

උයන මොහොතෙත් ඇවිත් ඉනවටේ අත දැම..
මොනවා ඉව්වත් ඉතින් අද රසයිනේ කෑම..
දූවව නිදි කරන්නේ නැද්ද රහසින් කීම..
මඟහැරුන දෙයකි තව මහ රැයේදිත් නෑම..

සෙබළ සිතකට කවියා ආරූඪ වූ කළ තම නිවාඩු දින කිහිපය සිය බිරිඳ හා ගතකරන අයුරු මතකයට නැංවීමට කවියා උත්සහා දරයි. බිරිඳ සමඟ ගතකළ ආදරණීය මොහොතවල්, ඇයගෙන් සිදුවන අතපසුවීම් ආදරණීය ලෙස විඳගන්නා අයුරු මෙම දෙපදයෙන් සිහිපත් කරවයි. ඔබගේ ආදරණීයත්ව කෙතරම් ද යත් ඇය සාදන ඕනෑම කෑමක් රස වුවත් නැතත් අද කෑම රසයිනේ යනුවෙන් පැවසීම ආදරණීය පිරිමියාගේ, නිවාඩු ලබා නිවසට එන නියම සොල්දාදුවාගේ ලක්ෂණයකි. කවියා පෙර සිටි සැබෑ සෙබළාගේ ගතිගුණ, ආකල්ප මෙම දෙපදයෙන් දක්වයි.

උයන මොහොතෙත් ඇවිත් ඉනවටේ අත දැම..
මොනවා ඉව්වත් ඉතින් අද රසයිනේ කෑම..

කෙසේ වෙතත් අසම්මත ඇසුරත් සමඟ අහිමිව යන ආදරණීය භාවයන් දැක්වීමට කවියා මීළඟ කවි දෙපදය

භාවිතා කර ඇත. ඔබත් නිවසට ගියපසු ඔබේ බිරිඳ සමඟ තනිවීමට දරණ උත්සාහය සිහිපත් කරවීමට ඔහු මෙසේ යොදාගෙන ඇත.

දූවව නිදි කරන්නේ නැද්ද රහසින් කීම..
මඟහැරුන දෙයකි තව මහ රැයේදීත් නැම..

එසේ ආදරණීය වූ ජීවිතයක් ගතකළ ඔබටම අසම්මත පෙමක සුව සොයන කළ ආදරණීය බව ඔබගෙන් නිරායාසයෙන්ම ගිලිහියන බව ඊළඟ පදයෙන් දක්වා ඇත. මෙසේ මඟහැරීම ජීවිතයේ ලබාගත හැකි උපරිම දුක දරගෙන ඔබට ආදරණීයන් තිලිණ කළ ඔබේ බිරිඳට කෙසේ දැනෙනවා ඇත්ද?

මීළඟ කවිය තුළ අතිශය සුන්දර, සුකුමාල ගැහැනිය තුළ සිටින සාහසික කාන්තාවකගේ අවදිවීම දැකගත හැකිවේ. කවියා තමා හැරයාමට සැරසෙන බිරිඳකගේ භාවයන් පිටකිරීමට ඒ සඳහා යොදාගන්නා වචන නම් වූ දරුණු තම අවිය යොදගන්න අකාරය දෙස බලමු.

දෙයක් තව මෙමට නෑ හිමිට ගෙනවිත් දෙන්න..
ප්‍රේමයක් තියෙන තැන ගිහින් නැවතී ඉන්න..
දුක් වෙන්න එපා මට හැකිය දුව රැකගන්න..
යතුර පාපිස්ස යට මඟ වැරදුනොත් එන්න..

බිරිඳ හැරයාමට සැරසෙන සෙබළෙකුගේ කෝණයෙන් මෙ පද පෙළට ප්‍රවිශ්ට වෙමු. ඔබගේ අසම්මත සමබන්ධතාවය හෙළි වූ විට ඇයගේ ප්‍රකාශයන් කෙබඳු වේයි ඔබ සිතුවාද? ඇය ඔබට මෙසේ පැවසුවොත්..?

දෙයක් තව මෙමට නෑ හිමිට ගෙනවිත් දෙන්න..
ප්‍රේමයක් තියෙන තැන ගිහින් නැවතී ඉන්න..

"මන් ඔයාට දෙන්න පුලුවන් හැමදේම දුන්නා. ඔයාගේ ලේ මගෙ බඩේ දසමාසයක් තියන් ලෝකෙ දරුනුම වේදනාව විඳලා අලුත් ජීවිතේකුත් ගෙනාවා. මට දෙන්න පුලුවන් උපරිම ආදරය මන් ඔයාට දෙන්නේ. මට වඩා ආදරයක් දෙන තැනක් තියේනම් ඔයා ගිහින් නවතින්න." ශෝකය ප්‍රකාශ කිරීමේදී ඔබේ බිරිඳත් ඉතාමත් අවිහිංසක වචන අතිශය සාහසික ලෙස ඔබගේ සිතේ සියුම් තැන් රිඳවීමට යොදගන්නා ආකාරය බලන්න. මෙවැනි ප්‍රකාශයන් ඔබට අසන්නට වුවහොත් ඔබගේ හදවතේ ඇතිවන හැඟීම් කුමන අකාරයේ වේවිද? මදක් සිතා බලන්න. නියම සොල්දාදුවෙකු ලෙස ඇයගේ අසාමාන්‍ය කැපවීම් ඔබ කෙසේ ආමන්ත්‍රණය කළ යුතුද?

දුක්වෙන්න එපා මට හැකිය දුව රැකගන්න..
යතුර පාපිස්ස යට මඟ වැරදුනොත් එන්න..

එසේ ආදරණීය වූ ජීවිතයක් ගතකළ ඔබටම අසම්මත පෙමක සුව සොයන කළ ආදරණීය බව ඔබගෙන් නිරායාසයෙන්ම ගිලිහී යන බව ඊළඟ පදයෙන් දක්වා ඇත. මෙසේ මඟහැරීම ජීවිතයේ ලබාගත හැකි උපරිම දුක දරගෙන ඔබට ආදරණීයන් තිලිණ කළ ඔබේ බිරිඳට කෙසේ දැනෙනවා ඇත්ද?

මෙම කවි දෙපදයෙන් ඔබට නොපවසා පවසන අපවාදයක් ගම්‍ය කරවීමට කවියා තැත් දරා ඇත. යම් මතු දවසක අසම්මතය සම්මතයක් නොවන බවත් එය මඟහැරී යන බවත් බිරිඳ ඔබට පවසන අතරේම ඔබට යම් ආරාධනාවක් ද සිදුකරයි. මඟ වැරදී ගියවිට නැවත එන ලෙසත් ඇය ඔබ නැවත පැමිණෙන තුරු යතුර සඟවා ඔබට පහසුවෙන් දොර ඇරගෙන නිවසට පැමිණෙන ලෙසටත් ආරාධනාවක් කරයි. ඔබ පැමිණෙන තුරු ඇය සිත නමැති දොරගුල් වසා දමා ඔහුට නැවත පැමිණ පහසුවෙන් සොයාගත හැකි තැනක යතුර සඟවා තබන්නේ වැඩිකල් නොගොස් ඔහු නැවත පැමිණෙන බව ඔහු දන්නා නිසාය. ඇය ඔබව රිඳවන්නේ තමන්ගේ ලෙයින් උපන් දියණියටවත් අයිතියක් ඔබට ලබා නොදෙමිනි. වරදකට දඬුවම් ඕනෑවටත් ඇය ඔබට දී අවසන්ය.

ඉදින් ඉලක්ශ නම් පොලිස් නිලධාරීයා සිය අත්දැකීම්වලින් කවිකොට බෙදාගත් දේ, මතු දිනෙක, වර්තමානයේ හෝ අතීතයේ ඔබට අත්විඳීමට සිදුවිය හැක. ඉතින් ආදරණීය සෙබළුනි. අසම්මතයට පෙම් බඳිනවාට වඩා සම්මතයට ආදරය කරන ලෙස ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමි.



- මේජර් එම්ආර්එල් ගුණවර්ධන
ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

## තත්වය හා විවාහය

- නිහතමානී මිනිස්කම නැයෙකි. පෞරුෂය සතුරෙකි. නිහතමානීකම වුවද සීමාව ඉක්මවා යෑම නිසා අනියම් නිවටකමක් මතුවෙයි. එහෙයින් පරිසරය හා පුද්ගලයා ගැන වැටහීමක් ඇතිව බුද්ධිය විසින් ඒ තත්වය නිරවුල් කරගත යුතුය.
- පොත් රාක්කය දැවැන්ත එකක් නම් ඒ ගෙදර පැසුණු වියතෙක් වෙයි. කැසට් රාක්කය විශාල නම් මතුපිට මිස ගැඹුර තේරුම්ගත නොහැකි විනෝදකාමියෙක් එහි වෙයි.
- මිනිසෙකුට අපේක්ෂා තැබිය හැකි අරමුණක් තිබිය යුතුය. ආශාවෙන් සිහිපත් කළහැකි යටගියාවක් තිබිය යුතුය. ආදරයෙන් පුද ලැබිය යුතු දෙවෙනි ලිංගිකයෙකු සිටිය යුතුය.
- ලෝකය කලහකාරී වී ඇත්තේ සිත කලහකාරී වී ඇති බැවිනි. සිත කලහකාරී වී තිබෙන්නේ සිත විසින් මවනු ලැබ තිබෙන ලෝකය කලහකාරී නිසාය.
- අවිනිශ්චිත සිතක් ඇති මනුෂ්‍යයා වූ කලී හුදෙක් උසස් දේ සඳහා සිය මනස නිදහසේ යොදවන්නට සෑහෙන තරම් තමා තුළ රුවා ගන්නට වෙහෙස නොදැරුවෙකි.
- මිනිසා නීති පනවාගෙන ඇත්තේ ඔවුන් ස්වභාවයෙන්ම කරගන්නට පෙළඹෙන ක්‍රියාවලිය වැලකීම සඳහාය. සොබා දහම විසින්ම වළකාලන හෝ දඬුවම් දෙන ක්‍රියාවන්ගෙන් වැලකීම පිණිස මිනිසාට නීති පැනවිය යුතු නැත.

- නදීකා අංගම්පොල, මැල්සිරිපුර



# මානසික ආතතිය කළමනාකරණය සහ භාවනාව

## මොකද්ද මේ මානසික ආතතිය ?

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව වගේ දේශපාලන සහ ආර්ථිකව වියවුල් තත්වයකින් පෙළෙන රටක මානසික ආතතිය යන වචනය නුපුරුදු වචනයක් නොවේ. එහෙත් එම තත්වය නිවැරදි ලෙස කළමනාකරණය කරගැනීමට අවැසි දැනුම සංසරණය වීමක් අපට පෙනෙන්නට නැත. මින් ඇතිවන භයානකම ප්‍රතිඵලය වන්නේ මානසික ආතතිය දිගු කාලයක් දරාගැනීම නිසා මුහුණදීමට සිදුවන විවිධාකාර ලෙඩ රෝග වලට සහ වෙනත් පුද්ගලික මෙන්ම සමාජයීය ගැටලු නිර්මාණය වීමයි.

## ආතතිය යනු කුමක්ද ?

අප යම් දුෂ්කර තත්වයකට මුහුණ දීමේදී ඇති වන යම් කනස්සලු හෝ කාංසාමය තත්වයක් මානසිකමය ආතතිය ලෙස සරලවම අර්ථ දැක්විය හැක. මානසික ආතතිය ස්වභාවික මනුෂ්‍ය ප්‍රතිචාරයක් වන අතරම අප ජිවිතයේ එදිනෙදා මතු වන යම් යම් තර්ජන (බාහිර හෝ අභ්‍යන්තර) ආමන්ත්‍රණය කිරීමට අප අභ්‍යන්තරයෙන්ම (මානසික සහ ශාරීරික වෙනස්කම් සහිතව) මතු වන තත්වයකි. මෙලොව නිරෝගී ඕනෑම පුද්ගලයෙක් යම් මට්ටමක ආතතිමය තත්වයකට සිය ජීවිත කාලය තුළ මුහුණ දී ඇතුවාට සැකයක් නැත. මෙහි ඇති විශේෂතම දෙය නම් අප යම් ආතතිමය තත්වයකට මුහුණ දෙන, ප්‍රතිචාර දක්වන සහ එම තත්වය අර්ථ දක්වන ආකාරය අනුව අප අත්දකින ආතතිමය තත්වයෙන් අප හට ඇති වන බලපෑම අඩු වැඩි වන බවයි. කෙසේ හෝ මානසික ආතතිය අප ජීවිතයට විශාල බලපෑමක් ඇති කරන බව නොරහසකි.

## තවත් ලෙසකට ආතතිය යනු,

"ආතතිය යනු යම්කිසි පුද්ගලයෙකු රැකියාවෙන්, පවුලෙන් සහ හෝ වෙනත් බාහිර මූලාශ්‍රවලින් එන ඉල්ලීම් සහ පීඩනයන්ට ප්‍රතිචාර දක්වන විට නිර්මාණය වන තත්වයකි. මෙහිදී, එම බාහිර හෝ අභ්‍යන්තර ඉල්ලීම් සහ පීඩන තත්වයන්ට මුහුණ දීමට අවැසි තරම් හැකියාව හෝ සම්පත් නොමැති විට ආතතිමය තත්වය තවදුරටත් වර්ධනය වේ."

> "ආතතිය වළක්වා ගත යුතු සෘණාත්මක දෙයක් ලෙස අප බොහෝ විට සිතන අතර, එහෙත් එය එදිනෙදා ජීවිතයේ ස්වභාවික සහ අපේක්ෂිත බොහෝ විට අනිවාර්යය කොටසකි. අපට හොඳ ආතතියක් දැනෙන විට, අපගේ හෘද ස්පන්දන වේගය වැඩි වේ, අපගේ හුස්ම ගැනීමේ වේගය වැඩි වේ, සහ අපට ප්‍රබෝධමත් බවක් දැනේ. එය අපගේ ශරීරයේ කෙටි කාලීන වෙනසක් වන අතර එය අපට අවැසි කාර්යය කිරීමට සූදානම්, ජවසම්පන්න බවක් සහ අපගේ උපරිමයෙන් ක්‍රියා කිරීමට සූදානම් බවක් දැනීමට උපකාරී වේ."

## මීළගට අපි බලමු මානසික ආතතිය ඇතිවන ආකාරය සහ එහි ජීව විද්‍යාත්මක පදනම ගැන.

ආතති ප්‍රතිචාර දැක්වීමේ ජීව විද්‍යාත්මක පද්ධතිය හයිපොතැලමීය පිටියුටරි අධි වෘක්ක අක්ෂය (HPA Axis - Hypothalamic - pituitary - Adrenal Axis) ලෙස ජීව විද්‍යාවේදී හඳුන්වනු ලබන අතර, මෙහිදී ඇති වන්නේ කිසියම් වූ ආතතියකට හේතු වන තත්වයක් (stressor) ඇති වූ විට මොළයේ කොටසක් වන හයිපොතැලමසය විසින් යම් රසායනිකමය සංඥාවක් පිටියුටරි ග්‍රන්ථිය වෙත යැවීමයි. ඉන් පසු පිටියුටරි ග්‍රන්ථිය තුළින් ඇති කරන්නා වූ නවතම රසායනිකමය සංඥාවක් රුධිරය හරහා වකුගඩු වල පිහිටා ඇති අධිවෘක්ක වෙත යැවේ. මෙමඟින් කෝටිසෝල් හෝමෝනය නිකුත් කිරීමට යම් ශරීරමය අණ දීමක් සිදුවන අතර එම හෝමෝන අප ආතති හෝමෝන ලෙසද හඳුන්වයි.

## මානසික ආතතිය සැමවිටම නරකද?

නැත. අප ඕනෑම සංකීර්ණ කටයුත්තක් කිරීමේදී යම් ආතතියක් තිබීම අපගේ මානසික ඒකාග්‍රතාවය ඉහළ නැංවීමට හේතු පාදක වේ. ඒවගේම අපගේ මානසික මෙන්ම ශාරීරික සූදානමද මෙම යහපත් ආතතිය විසින් ඉහළ නංවයි. මෙම යහපත් ආතතියට අප ඔයිස්ට්‍රෙස් (Eustress) නමින් හඳුන්වයි. ආතතිය වළක්වා ගත යුතු සෘණාත්මක දෙයක් ලෙස අප බොහෝ විට සිතන අතර, එහෙත් එය එදිනෙදා ජීවිතයේ ස්වභාවික සහ අපේක්ෂිත බොහෝ විට අනිවාර්යය කොටසකි. අපට හොඳ ආතතියක් දැනෙන විට අපගේ හෘද ස්පන්දන වේගය වැඩිවීම සහ අපගේ හුස්ම ගැනීමේ වේගය වැඩි වීමෙන් අපට ප්‍රබෝධමත් බවක් දැනේ. එය අපගේ ශරීරයේ කෙටි කාලීන වෙනසක් වන අතර එය අපට අවැසි කාර්යය කිරීමට සූදානම්, ජවසම්පන්න බවක් සහ අපගේ උපරිමයෙන් ක්‍රියා කිරීමට සූදානම් බවක් දැනීමට උපකාරී වේ.


යහපත් ආතතිය ඇති වන්න බලපාන හේතු.

- එක්වර රැකියාවේ උසස් වීමක් ලැබීම.
- නව රැකියාවකට යාම.
- විවාහ දිවියට එළඹීම.
- මව් පදවිය ලැබීමට සූදානම් වීම සහ දරුවෙකු ලැබීම.
- වෙනත් නගරයකට හෝ දේශයකට පදිංචියට යාම.
- විශ්‍රාම යාම.
- විශ්ව විද්‍යාලයට ඇතුල් වීම.
- විභාග අපේක්ෂාවන් සමඟ ඇති වන බලපෑම.

## හානිකර ආතතිය යනු කුමක්ද?

හානිකර ආතතිය යනු ඔබව වෙහෙසට පත් කරන, ඔබව අපහසුතාවයට පත් කරන සහ ඔබේ සෞඛ්‍යයට හානිකර වන ආකාරයේ ආතතිමය තත්වයකටයි. හානිකර ආතතිය ඇතිවූ විට ඔබව යම් කාංසාමය තත්වයකට හෝ චිත්ත ඒකාග්‍රතාවය බිඳවැටී යම් අපහසුතාවකට පත්වීම නොවැළැක්විය හැකිය.

මෙම හානිකර ආතතිය කෙටි කාලීන හෝ දිගු කාලීන (නිදන්ගත) විය හැක. කෙටි කාලීන ආතතිමය තත්වයක් ඔබ නිවැරදි ආකාරයෙන් කළමනාකරණය නොකොට ගතහොත් එය දිගු කාලීන ආතතිමය තත්වයක් බවට වර්ධනය වී එය ඔබගේ එදිනෙදා ජීවිතයට, පවුල් ජීවිතයට, රැකියාවට හෝ අධ්‍යාපනයට මෙන්ම සෞඛ්‍ය තත්ත්වයට ද ඉතා දැඩි ලෙස




හානිකර තත්වයක් උදාකර දීමේ සම්භාවිතාවයක් පවතී.

දිගුකාලීන ආතතිමය තත්වයකින් ඇතිවිය හැකි ප්‍රතිඵලවලින් කිහිපයක්.

- නින්ද නොයෑමේ ගැටලු හෝ අධික ලෙස නින්ද අවැසි වීම.
- අධික හිසරදය සහ විවිධ ශාරීරක වේදනාමය තත්වයන්.
- ලිංගික ගැටලු හා ඒ නිසා හටගත් පවුල් ප්‍රශ්න.
- අධික ලෙස කෝපයට පත්වීම.
- විශාදමය තත්වයකට පත්වීම.
- කාංසාමය තත්වයකට පත්වීම.
- විවිධ වෙනත් මානසික රෝගී තත්වයන්ට භාජනය වීමේ සම්භාවිතාවය වැඩි වීම.
- කෝටිසෝල් වැනි ආතතිය සහ සම්බන්ධ හෝමෝන අක්‍රමිකතා ඇතිවීම තුළින් දියවැඩියාව හෝ වෙනත් හෝමෝන පද්ධතිය සම්බන්ධ ලෙඩ රෝග වැළඳීමේ සම්භාවිතාවය වැඩි වීම.
- සමාජයෙන් ඈත්ව සිටීමට උත්සාහ කිරීම.

## දිගුකාලීන ආතතිමය තත්වයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක.

- විවිධාකාර මානව සබඳතා නිසා හටගත් හේතු. (ප්‍රේම සබඳතා, මිත්‍ර හෝ ඥාතී සබඳතා)
- ආර්ථිකමය ගැටලු.
- රැකියාව සම්බන්ධ ගැටලු.

- ➢ සෞඛ්‍යය ගැටලු.
- ➢ ජනවාර්ගික හෝ දේශපාලනිකමය තත්වයන්.

## ආතතිය කළමනාකරණය කරගැනීමේ ක්‍රමවේද.

මානසික ආතතිය කළමනාකරණයේදීද අප පළමුව දත යුත්තේ එම ආතති තත්වය තාවකාලික තත්වයක් නිසා ඇති වූ ආතති තත්වයක් ද නැතහොත් දිගු කාලීන හේතුවක් නිසා ඇති වූවක්ද යන්නය. එනම්, හෙට දින යම්කිසි විභාගයකට මුහුණදීමේදී ඇති වන ආතතිමය තත්වයක් කළමනාකරණය කරගැනීමේදී අප වැඩපිළිවෙල යෙදිය යුත්තේ ඔබ කිසියම් දිගු කාලීන රෝගයකින් පිඩා විදීමේදී ඇති වන ආතතිමය තත්වය කළමනාකරණය කරගන්නා අන්දමටම නොවන නිසාය. පහත ක්‍රමවේදයන් ඔබට ආතති කළමනාකරණයේදී භාවිතා කළ හැක.

## කෙටි කාලීන ආතතිමය තත්වයක් කළමනාකරණය කරගැනීම.

ආතතිමය අවස්ථාව - හෙට දින පැවැත්වෙන විභාගයක්

- ➢ මෙවැනි අවස්ථාවකදී බොහෝ විට ඇති වන්නේ කාංසාමය තත්වයකි. කාංසාමය තත්වයකදී කළයුතු හොඳම ආතති කළමනාකරණ ව්‍යායාමය නම් "ගැඹුරු හුස්ම" ලිහිල් වීමේ අභ්‍යාසයයි (Deep breathing exercise).

ගැඹුරු හුස්මක් ගන්න, දැන් එය පිට කරන්න. ඔබට දැනටමත් හැගෙන ආකාරයෙහි වෙනසක් ඔබට පෙනෙනු ඇත. ඔබේ හුස්ම ආතතිය අඩු කිරීමට සහ ඔබට අඩු කනස්සල්ලක් ඇති කිරීමට ප්‍රබල මෙවලමකි. සමහර සරල හුස්ම ගැනීමේ අභ්‍යාස ඔබ ඒවා ඔබේ සාමාන්‍ය චර්යාවේ කොටසක් කර ගන්නේ නම් විශාල වෙනසක් සිදු කළ හැක.

## ඔබ ආරම්භ කිරීමට පෙර, මෙම ඉඟි මතක තබා ගන්න:

ගැඹුරු හුස්ම ව්‍යායාමය කිරීම සඳහා ගැලපෙන නිදහස් ස්ථානයක් තෝරන්න. එය ඔබේ ඇඳේ, ඔබේ විසිත්ත කාමරයේ බිම හෝ සුවපහසු ආසනයක් විය හැකිය.

කිසි විටෙක මෙහි කිසිදු පියවරක් කිරීමට ඔබ ඔබට බලකිරීමක් නොකරන්න.

දිනකට වරක් හෝ දෙවරක් එකම වේලාවක එය කිරීමට උත්සාහ කරන්න.

සුවපහසු ඇඳුමක් අඳින්නේනම් තවත් උචිතය.

බොහෝ හුස්ම ගැනීමේ ව්‍යායාම සඳහා ගත වන්නේ මිනිත්තු කිහිපයක් පමණි. ඔබට වැඩි කාලයක් කිරීමට හැකි නම් එය ඔබට තවත් සැහැල්ලු ස්වභාවයක් අත් කර දෙනු ඇත. සාමාන්‍යයෙන් විනාඩි 15ත් 20ත් අතර කාලයක් මෙය කිරීමට හැකි නම් ඉතා හොඳය.

## ගැඹුරු හුස්ම ගැනීම

සුවපහසුව අසුන් ගන්න. අවැසිනම් ඔබේ හිස සහ දණහිසට යටින් කොට්ටයක් තබා ගෙන ඇඳේ හෝ බිම මත වැතිර සිටිය හැකිය. එසේත් නැතිනම් ඔබේ උරහිස්, හිස සහ බෙල්ල පුටුවේ පිටුපසට හොඳින් හේත්තු කර තබාගෙන අසුනක වාඩි විය හැකිය.

- ➢ ඔබ අවට ඇත්තේ සිත එකග කරගැනීමට අපහසු පරිසරයක් නම් ඔබගේ ජංගම දුරකථනයේ යූ ටියුබ් නාලිකාවට ගොස් ලිහිල් වීමට උපකාර වන අන්දමේ සංගීතයක් තෝරාගන්න. (Relaxatμon Music - Ex - River by Hariprasad Chaurasia).
- ➢ දෑස පියාගන්න.
- ➢ ඔබගේ වර්තමාන මොහොතේ දැනෙන්නා වූ සංවේදන ගැන සතිමත් වන්න. එනම් ඔබ යම් තැනක වාඩිවී සිටී නම් ඔබගේ ශරීරයට දැනෙන ස්පර්ශ, ඒ මොහොතේ ඔබට දැනෙන ගඳ සුවඳ, දිවට දැනෙන රස පිළිබඳ සතිමත් වන්න.
- ➢ දැන් සෙමින් ඔබගේ අවධානය ඔබගේ නාසය වෙත ගෙන එන්න. ගැඹුරු හුස්ම ගන්න ආරම්භ කරන්න. ඔබ ගන්නා හුස්ම ගණන් කිරීමට ඔබගේ අතේ ඇගිලි යොදාගත හැක. එක් හුස්මක් ගත්විට එක් ඇගිල්ලක් නවා ගන්න. මෙලෙස ඔබ හුස්ම 5ත් 6ත් අතර ප්‍රමාණයක් ගත යුතුය. හුස්ම ගන්න අතරතුර මෙලෙස ඔබේ අවධානය තබා ගන්න. ඔබගේ නාසය දෙසට ඔබගේ අවධානය යොමු කල පසු හුස්මත් සමග ඔබගේ අවධානය සම්බන්ධ කරන්න. හුස්මෙහි ගමන් මාර්ගය මනසින් දකින්න. නාසයෙන් ඇතුළුව ස්වාසනාලය ඔස්සේ පෙනහළු වලට ඇතුළු වන හුස්ම දෙස මනසින් බලා සිටින්න.
- ➢ මෙම හුස්ම ගැඹුරු හුස්ම විය යුතුය, හුස්මත් සමග ඔබගේ පපුව ඉදිරියට විත් උරහිස් පවා යම් ප්‍රමාණයකට ඉහළට යනු ඇත. එම හුස්ම තත්පර 5ක් පමණ පෙනහළුවල එලෙසම රඳවා තබා ගන්න. දැන් හුස්ම පිට කරන්න. සැහැල්ලු වන්න.
- ➢ මෙලෙස වට කිහිපයක් කරන්න (5ත් 6ත් අතර ප්‍රමාණයක්).
- ➢ දැන් ඔබ ගැඹුරු හුස්ම ගැනීම නවතා සාමාන්‍ය ලෙස හුස්ම ගන්න. විනාඩි 10ත් 15ත් අතර කාලයක් ඔබගේ සාමාන්‍ය හුස්ම වල මාර්ගය දෙස මනසින් බලා සිටින්න.
- ➢ ඔබගේ අවදානය වෙනස් වන සිතුවිලි පැමිණෙන විට මෙලෙස සිතන්න .

එය අනාගතය පිළිබඳ සිතුවිල්ලක් නම් ඔබ මෙලෙස සිතන්න - අනාගතය තවමත් පැමිණ නැත. මා සිටින්නේ ජිවත් වන්නේ වර්තමානයේය. එසේ නම් මට මෙම සිතුවිල්ල අදාළ නැත. එලෙස සිතා නැවත හුස්ම වෙත අවධානය ගෙන එන්න.

එය අතීතය ගැන සිතුවිල්ලක් නම් මෙලෙස සිතන්න.

අතීතය සිදුවී අවසන්ය. එසේ නම් තවදුරටත් අතීතයක එල්ලී සිටීමෙන් පලක් නොමැත. එලෙස සිතා නැවත හුස්ම වෙත අවදානය ගෙන එන්න.

හැකි නම් මෙම ලිහිල් වීමේ අභ්‍යාසය දිනකට දෙවරක් පමණ සිදු කරන්න. මෙය ඔබගේ තාවකාලික ආතති තත්වය යථා තත්වයකට පත්කරවනවා මෙන්ම දිගු කාලයක් දිනපතා යෙදීම ඔබගේ ශරීර සෞඛ්‍යය තත්වය ද යහපත් තත්වයට පත් කිරීමට හේතු වනු ඇත.




▪ දුලිත නසුන්
මනෝ උපදේශක හා මනෝවිද්‍යාඥ
*MSc in Applied Psychology (UK), BSc in Psychology, BA in Social Sciences*




# කොයි තරම් කොළඹ ආවත් කටු ගේ දුටුවාද?

ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය හැමෝම අතර ප්‍රචලිත වෙලා තියෙන්නේත් "කටු ගේ" කියන නමින්. 1877 දී ආරම්භ කරපු මේ කෞතුකාගාරය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරනු ලබනවා. මේ කෞතුකාගාරයේ උඩරට රජවරුන්ගේ රාජකීය භාණ්ඩ වගේම රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් සම්බන්ධ තවත් බොහෝ ප්‍රදර්ශන අංග සහ ශ්‍රී ලංකාවේ සැළකිය යුතු වැදගත්කමක් ඇති විවිධ අංග දැකබලා ගැනීමේ අවස්ථාව හිමිවෙනවා.

ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය, මුලින් හැඳින්වූ පරිදි, 1877 වර්ෂයේ ජනවාරි මස 01 වන දින ආරම්භ කළා. එහි නිර්මාතෘ ලෙස එවක අපේ රටේ ආණ්ඩුකාරවරයෙක් වූ බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් විලියම් හෙන්රි ග්‍රෙගරි බව ඉතිහාස පොත්වල සඳහන් වෙනවා. රාජකීය ආසියාතික සංගමය 1872 දී ශ්‍රීමත් විලියම් හෙන්රි ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා ලෙස පත් කිරීමේදී පොදු කෞතුකාගාරයක අවශ්‍යතාවය ඔහුගේ අවධානයට යොමු වූ අතර, යම් යම් අභියෝගයන්ට මුහුණ දෙමින් වසරක් ඇතුළත කෞතුකාගාරය ඉදිකිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය ලබාගත් අතර, පොදු වැඩ දෙපාර්තමේන්තුවේ රජයේ ගෘහ නිර්මාණ ශිල්පියකු වන ජේම්ස් ජෝර්ජ් ස්මිටර් විසින් ඉතාලි ගෘහ නිර්මාණ ශිල්පයට අනුව වර්ෂ 1876 දී ඉදිකර ඊළඟ වසරේදී කෞතුකාගාරය විවෘත කෙරිණ. එහි ඉදිකිරීම් කටයුතු අරාසි මරික්කාර් වපාචි මරික්කාර් නොහොත් වපාචි මරික්කාර් බාස් වෙත පැවරිණ. මොහු වර්ෂ 1060 දී ශ්‍රී ලංකාවට පැමිණි ෂෙයික් ෆරීඩ් පවුලෙන් පැවත එන්නෙකි. සාමාන්‍ය තැපැල් කාර්යාලය, කොළඹ රේගු ගොඩනැගිල්ල, පිටකොටුවේ නගර ශාලාව, ගාලු මුවදොර හෝටලය, වික්ටෝරියා ආකේඩ්, ෆින්ලේ මොයර් ගොඩනැගිල්ල, කොළඹ කොටුව ඔරලෝසු කණුව, බැටර්න්බර්ග් බැටරිය සහ අදටත් පවතින තවත් ගොඩනැගිලි ගණනාවක ඉදිකිරීම්කරු වූයේද මේ වප්චි මරිකාර් මහතා වීම විශේෂත්වයකි.

කොළඹ ජාතික කෞතුකාගාරය වර්ෂ 1877 සහ 1999 අතර කාලය තුළ, කෞතුකාගාර බලධාරීන් මේ සඳහා රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ප්‍රදර්ශනය කිරීමට විවිධ පියවර ගත්තා. ආචාර්ය ආතර් විලී සහ ආචාර්ය ජෝසප් පියර්සන්ගේ මඟපෙන්වීම යටතේ වරින් වර තවත් අංශ කිහිපයක් එකතු කළා. ආචාර්ය පීර්පී දැරණියගල, ආචාර්ය පීඑච්ඩීඑච් ද සිල්වා සහ සිරිනිමල් ලක්දුසිංහ යන අයගේ පාලන සමයේදී නව අංශ එකතු වූ අතර, ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරයක් ලෙසත් ශ්‍රවණාගාරයකිනුත් සමන්විත වුණා. තවද, මෙහි ඇති පුස්තකාලය ජනවාර්ගික හා මානව විද්‍යාත්මක අධ්‍යයනයන් පුළුල් කිරීමට ද පහසුකම් සපයනවා.

පීර්පී දැරණියගල මහතාගේ පාලන සමයේදී මෙම කෞතුකාගාරයට ජාතික වශයෙන් වටිනාකමක් ලබාදෙන ලදී. ඔහු යාපනය, මහනුවර සහ රත්නපුර යන ප්‍රදේශවල ශාඛා කෞතුකාගාර විවෘත කළ අතර වර්ෂ 1942 දී අංක 31 දරන පනත යටතේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කළා. අවසන් ප්‍රතිඵල ලෙස ශාඛා කෞතුකාගාර නවයක් විවෘත කරන ලද අතර, පාසල් විද්‍යා වැඩසටහනක් සහ ජංගම කෞතුකාගාර සේවාවක් ද ක්‍රියාත්මක කළා.

මෙම කෞතුකාගාරයේ තාරා ප්‍රතිමාවේ අනුරුවක් ඇත. එය දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තබා ඇති තාරාගේ ජීවමාන ප්‍රමාණයේ ප්‍රතිමාවකි. තවද, බ්‍රිතාන්‍ය රජය විසින් ශ්‍රී ලංකාවට ආපසු ලබාදෙන ලද ඔටුනු ආභරණ සහ මහනුවර අවසාන රජුගේ සිංහාසනය කෞතුකාගාර එකතුවද ඔබට සියැසින් දැකබලා ගැනීමේ අවස්ථාව හිමිවනු ඇත. මෙහි බිම් මහල සහ ඉහළ මහල විවිධ අංග ඓතිහාසික වටිනාකම අනුව අනුපිළිවෙලට නිර්මාණය කර ඇත.

මෙම කෞතුකාගාරයට නව පණක් දෙමින් වර්ෂ 1877 ජනවාරි මස 01 වන දින පුස්තකාලයක් ද පිහිටවූවා. මෙම පුස්තකාලය ශ්‍රී ලංකාවේ නිල නොවන ජාතික පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මක වන අතර දිවයිනේ පළමු නීතිමය තැන්පතු පුස්තකාලය බවට ද පත්වූවා.

ක්‍රිව 126-170 රජකල වසභ රජ සමයේ පැරණි සිංහල භාෂාවෙන් (බ්‍රාහ්මී අක්ෂර යොදාගෙන) ලියා තිබූ 1936දී යාපනයේ වඩමාරච්චි පෙදෙසින් සොයාගත් වල්ලිපුරම් රන් සන්නස මෙම කෞතුකාගාරය සතු සුවිශේෂී වස්තුවක් බවට පත්වෙනවා. රන් පත්‍රයක, පේළි හතරක ලියවුනු 2 වැනි සියවසේ බ්‍රාහ්මීය අක්ෂරවලින් සමන්විත වූ මෙම රන් සන්නස සිංහල සහ දමිළ ජනතාවට වැදගත් වන්නේ, එමගින් නකදිව හෙවත් නාගදීපය ලෙස මහාවංශයේ, චූලවංශයේ සඳහන් වන ස්ථානය නූතන යාපනය බවට තහවුරු වීමයි. මීට අමතරව තවත් වටිනා දමිළ සෙල්ලිපි, නටරාජ ප්‍රතිමා ඇතුළු දේව ප්‍රතිමා විශාල ප්‍රමාණයක් දැකගැනීමේ අවස්ථාව ද ඔබට හිමිවෙනවා.

ශ්‍රී ලංකාවේ නායක්කාර රජ පෙළපතෙහි අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් පරිහරණය කරනු ලැබූ රාජ සිංහාසනය, ඔටුන්න සහ අසිපත ඔබට දැකබලා ගැනීම සඳහා ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර තිබෙනවා.

තොලුවිල බුද්ධ ප්‍රතිමාව, දැදිගම අලි ලාම්පුව, හෙයියන්තුඩුව රාජා (අලි) ඇටසැකිල්ල ඇතුළු ඓතිහාසික වගේම පෞරාණික වටිනාකමකින් යුත් සිංහල සහ දමිළ ජනතාවගේ ඉතිහාසය ගැන දැනගන්න ශ්‍රී ලංකා ජාතික කෞතුකාගාරය, එහෙමත් නැත්නම් කටු ගේ බලන්න ඔයත් එන්න. සතියේ දිනවල උදෑසන 0900 පැයේ සිට සවස 0600 පැය දක්වා විවෘතව ඇති අතර, පොහො දිනයේ සහ අනෙකුත් රජයේ නිවාඩු දිනවල උදෑසන 0900 පැයේ සිට සවස 0500 පැය දක්වා කටුගෙය ඔබ වෙනුවෙන් විවෘතව ඇත.

**අන්තර්ජාලයෙන්**
**උපුටා ගැනීමකි.**

# ආදරණීය මිනිසුන් සහ ආදරණීය විවාහය



“ආදරය” වචනයට පමණක් සීමා නොවී ක්‍රියාවෙන් පෙන්වන මිනිස්සුන්ට ඔබ මම ඇතුළු බොහෝ දෙනා කැමතියි. ආදරය ඉවසිලිවන්තකමින් පෙන්වන, කරුණාවන්තකමින් පෙන්වන, විශ්වාසවන්තකමින් පෙන්වන, ඔබව දරා ගනිමින් පෙන්වන ආදරණීය මිනිසුන් ලැබීම ඔබේ භාග්‍යයකි. ඔබ ගැන පුංචි පුංචි සොයා බැලීම් කරන, මුහුණට සිනාවක් ගෙනෙන වචන වලින් හිත පුරවා ඔබව සතුටු කරන මිනිසුන් ජීවිතයට එන්නේ කලාතුරකිනි. ඔබේ ජීවිතයේ අමාරුම අවස්ථාවල ඔබව අත් නොහරිමින් ආදරය වෙනදාටත් වැඩිය දැනෙන්නට හරිමින්, ඔබේ ජීවිතයේ පුංචිම ජයග්‍රහණ හමුවේ වුවද අවංකවම සතුටු වෙමින් නිහඬවම දිරි ගන්වන, සාර්ථකත්වය කරා යන ගමනේ දී හමුවෙන බාධක ඉදිරියේ අත් නොහැර අල්ලාගෙන සිටීමට ඔබව දිරිගන්වන මිනිසුන් ඔබට මුණ ගැසීම ද කලාතුරකින් ඔබ ලබන භාග්‍යයකි. ඔබගේ දුර්වල තැන්වලදී කෝපවීමට වඩා අවබෝධයෙන් ඔබව තේරුම්ගෙන ඔබව දරාගෙන නිහඬවම සොයා බලමින් ඔබව නිවැරදි කරන ඉවසිලිමත් මිනිසුන් ඔබට ආශිර්වාදයකි. බොහෝ දෙනෙක් කැමති ඇත්තටම තමන්ට ආදරය ක්‍රියාවෙන් පෙන්වන මිනිස්සුන්ට. ඉතින් එවැනි විශිෂ්ට පුද්ගලයින් ඔබගේ ජීවිතයෙත් ඇති. එවැනි ආරණීය මිනිසුන් වෙනුවෙන් කොන්දේසි විරහිතව අවංකවම ස්තූතිවන්ත වෙන්න. ආදරය කියන වචනය ප්‍රකාශනයක් තුළ තියෙනවාට වඩා එය ක්‍රියාවක් තුළ ඉතා ප්‍රබලයි.

ජීවිතයේ මට මෙන්ම ඔබට ද හැමවෙලාවෙම ලස්සනම දේවල් ගෙනවිත් දෙන්නේ නැහැ. විශේෂයෙන් ඔබට හමුවෙනවා හිතා මතාම තවත් අයව රිදවන මිනිස්සු. පළමුවෙනි දේ තමා ඒ වගේ මිනිස්සු ඔබට මුණ ගැසෙන විට තවත් අයෙකු රිදවන්න තරම් මනුස්සයෙකුගේ මනසට එන සිතුවිලි කිසිවිටෙකත් උසස් සිතුවිලි නොවන බව ඔබට හිතන්න පුළුවන් නම් එය ඉතාමත් වටිනවා. එවැනි සිතුවිලි පහළ වන්නේ බොහෝ විට තමන්ගේ දුර්වලතා, අසතුට හෝ ඊර්ෂ්‍යාව හේතුවෙන් වෙන්න පුළුවන්. ඒ නිසා ඔබට රිදවන්න උත්සාහ කරන එවැනි පුද්ගලයින් ගැන අනුකම්පාවක් ඇති කර ගැනීමයි වඩාත්ම සුදුසු වන්නේ. දෙවනුව ඔබ විසින් තේරුම් ගත යුත්තේ ඔවුන්ගේ ක්‍රියාවන් ඔබගේ වටිනාකම තීරණය නොකරන බවයි.

ඒ නිසා ඔවුන්ගේ සෘණාත්මක බවට ඔබගේ සතුට විනාශ කිරීමට ඉඩ නොදී සිටීම ඉතා වැදගත්. ඔබ ඒ හැම මොහොතකම ඔබේම ශක්තිය සහ සතුට කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. ජීවිතය කියන්නේ ඔවුන්ගේ කුඩා ලෝකයට වඩා බොහෝ විශාල ලස්සන දේවල් තියෙන ගමනක් බව මතක තබා ගන්න. ඔබට රිදවන අයට සමාව දී ඔවුන්ගේ සෘණාත්මක බවෙන් මිදී ඉදිරියට යන්න ඔබට පුළුවන්.

ඔබ විවාහ වී වසර 10ක්, 20ක් හෝ ඊටත් අඩු වැඩි වෙන්න පුළුවන්. විවාහ වීමට පෙර පෙම්වතුන් ලෙස ගත කළ කාලය තුළදී "මම ඔබට කැමතියි" කී මුල්ම දවසට වඩා විවාහ ජීවිතය හාත්පසින්ම වෙනස්. මුල් කාලයට සාපේක්ෂව රැකියා තත්ත්වයන් වෙනස් වෙනවා. දරුවන් ඉතා වේගයෙන් වැඩිහිටියන් බවට පත්වෙනවා. පෙර තිබුණු සෞඛ්‍ය තත්ත්වයන් හාත්පසින්ම වෙනස් වෙනවා. ඔබේ හීන පවා වෙනස් වෙනවා. සමහර වෙලාවට මේ වෙනස්වීම් නිසා එකිනෙකා විවිධ දිශාවන්ට ඇදී යනවා. එක් අයෙකු රැකියාවටම යොමු වෙද්දී, අනිත් කෙනා පවුලට ප්‍රමුඛව අවධානය යොමු කරනවා වෙන්න පුළුවන්. කෙනෙක් අලුත් විනෝදාංශවලට යොමු වෙද්දී, අනිත් කෙනා තනි වෙලා වගේ දැනෙන්න පුළුවන්.

එකිනෙකාට වෙලාවක් නැති තරම් කාර්යබහුල වෙන එක මෙන්ම විවිධ වූ රුචිකත්වයන් හෝ ප්‍රමුඛතා හෙමින් හෙමින් ඔබ දෙදෙනා අතර පරතරයක් ඇති කරනවා. හිතේ තියාගෙන ඉන්න නොකියන බලාපොරොත්තු බිඳෙනකොට ඒක පාලමක් වෙනුවට ඔබ දෙදෙනා අතර නොදැනුවත්වම තාප්පයක් හදනවා. මේ අයුරින් විවාහක යුවලවල් එකිනෙකාගෙන් ඈත් වෙනවා. හැබැයි ඔබට මේක වෙනස් කරන්න පුළුවන්. ඔබ දැනුවත්කමින් යුක්තව හිතාමතා තීරණ ගතහොත් විවාහක ජීවිතය වෙනස් වුවත් ඔබ දෙදෙනාටම එකට අත් අල්ලාගෙන එකට ගමන් කරන්න පුළුවන්. ඒකට කරන්න පුළුවන් සරල පියවර කිහිපයක් පිළිබඳව මෙසේ සටහන් කළ හැක.

තනි තනි ඉලක්ක වෙනුවට පොදු ඉලක්ක ගොඩනගා ගැනීම තුළින් ඔබ දෙදෙනාට එකට එක්ව හදන්න ඕන අනාගතය පිළිබඳව තීන්දු තීරණ ගත හැකිය. අනාගත හීන පිළිබඳව විවෘතව සාකච්ඡා කරන්න. රැකියාවක නියුතු ඔබ දෙදෙනා විශ්‍රාම ගිය

**ඔබගේ දුර්වල තැන්වලදී කෝපවීමට වඩා අවබෝධයෙන් ඔබව තේරුම්ගෙන ඔබව දරාගෙන නිහඬවම සොයා බලමින් ඔබව නිවැරදි කරන ඉවසිලිමත් මිනිසුන් ඔබට ආශිර්වාදයකි. බොහෝ දෙනෙක් කැමති ඇත්තටම තමන්ට ආදරය ක්‍රියාවෙන් පෙන්වන මිනිස්සුන්ට. ඉතින් එවැනි විශිෂ්ට පුද්ගලයින් ඔබගේ ජීවිතයෙත් ඇති. එවැනි ආදරණීය මිනිසුන් වෙනුවෙන් කොන්දේසි විරහිතව අවංකවම ස්තූතිවන්ත වෙන්න.**

පසු කරන්න හිතන් ඉන්න දේවල් මොනවාද (සංචාරය කිරීම, නිවසක් ඉදි කිරීම, පුංචි ව්‍යාපාරයක් ආරම්භ කරන එක) යන්න පිළිබඳව කතා බහ කර තීරණයන්ට එළඹෙන්න. ව්‍යායාම හෝ ආහාර පාලනය වැනි සෞඛ්‍යමය ඉලක්ක දෙදෙනා එක්ව සිදු කරන්න. මෙවැනි පොදු ඉලක්ක තබා ගැනීමෙන් ඔබ එකම වහලක් යට ජීවත් වෙන පුද්ගලයන් දෙදෙනෙක් පමණක් නොව, එකම කණ්ඩායමක් බවට නිරායාසයෙන්ම පත් වෙනවා.

ඔබ දෙදෙනා එකම විනෝදාංශවලට කැමති නොවෙන්න පුළුවන්. නමුත් ඔබට එකිනෙකාගේ දියුණුවට සහයෝගය දෙන්න පුළුවන්. ඔබේ සහකරු හෝ සහකාරිය සහභාගී වෙන වැඩසටහන්, ප්‍රසංග හෝ විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙන්න. එමෙන්ම, යුවළක් ලෙස එකට පාඨමාලාවක් හෝ වැඩමුළුවකට සහභාගී වෙන්න. එකම පොත කියවලා ඒ ගැන කතා කරන්න. අලුත් කෑමක්, භාෂාවක් හෝ ක්‍රීඩාවක් එකට ඉගෙන ගන්න උත්සාහ කරන්න. ගෙදර දොරේ වැඩ විතරක් නෙවෙයි. ජීවිතය ගැනත් එකිනෙකාගෙන් විමසන පුරුද්දක් ඇති කර ගන්න. වර්ධනය කියන්නේ තනි පුද්ගල දියුණුවක්ම නොවෙයි, එය බෙදා ගත හැකි දෙයක් බව විශ්වාස කරන්න.

වර්ධනය කියන්නේ වෙනස්වීම. වෙනස්වීම සමහර වෙලාවට අපහසු වෙන්න පුළුවන්. නමුත් ඔබේ සහකරු හෝ සහකාරිය වෙනස් වන විට ඔවුන්ට විරුද්ධ වෙනවා වෙනුවට ඔවුන් සමග හැඩ ගැසීමට තෝරාගන්න. මතක තියාගන්න ඔබ ආදරය කළේ ඒ මොහොතේ හිටපු පුද්ගලයාට නෙවෙයි, කාලයත් එක්ක වෙනස් වන පුද්ගලයාටයි. දෙදෙනා එකට වැඩෙන විට ඇතිවන සුන්දරත්වය හමුවේ, විවාහය කියන්නේ පැවැත්මක් පමණක් නොව එය දෙදෙනාගේම දියුණුවකි. එකිනෙකාගෙන් ඈත් වෙනවා වෙනුවට, ඔබ ආදරයේ සහ මිත්‍රත්වයේ අලුත් ස්ථර සොයා ගන්න. වර්ධනය ඔබව එකිනෙකාගෙන් ඈත් කරන්නේ නැහැ. ඒක ඔබට තවත් එකට අල්ලාගෙන ඉන්න හේතු ලබා දෙනවා. විවාහයෙන් අවුරුදු ගණනාවකට පසුවත් ආදරයෙන් ඉන්නවා කියන්නෙම ඔබේ සහකරු හෝ සහකාරිය සමග විවෘත මනසකින් කටයුතු කරනවා යන්නයි. වෙනස්වීම් සැමරීම, එකිනෙකාගේ ගමන්වලට උදව් දීම සහ පොදු අනාගතයක් ගොඩනැගීම අඛණ්ඩව සිදු කරන්න.

සන්නිවේදනය කියන්නේ වචන හුවමාරු කරනවාට වඩා වැඩි දෙයක්. සමහර වෙලාවට සන්නිවේදනය කියන්නේ කතා කිරීම නෙවෙයි. සමීපව සිටීම, එකිනෙකා බදාගැනීම, අත් අල්ලාගෙන සිටීම නැතිනම් නිශ්ශබ්දව එකට ඉඳගෙන සිටීමක් වචන දාහකට වඩා වැඩි දෙයක් කියන්න පුළුවන්. ශක්තිමත් සන්නිවේදනය තමයි විවාහ ජීවිතයේ හදගැස්ම. ආරක්ෂාව, විශ්වාසය හා බැඳීම ගොඩනගන්නේ සන්නිවේදනයයි. දිගටම කතා කරන්න, දිගටම සවන් දෙන්න සහ එකිනෙකාට නිරතුරුවම ළං වෙන්න. ආදරයෙන් කතා කරන වචන හරි ප්‍රබලයි වගේම ඒ වචන හරිම ප්‍රාණවත් බවින් යුක්තයි.




■ දිල්මි ශානුකී

වාණිජවේදී (විශේෂ) උපාධිධාරී)
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.






# පෙරමුණේ සටන් වැදි ඔහුට යෝධ සෙවණැල්ලක් වූ ඇය

**පවුලක දියුණුව, අභිවෘද්ධිය රඳා පවතිනුයේ බිරිඳකගේ කැපකිරීම මත යැයි පැවසුවහොත් ඔබ මා සමඟ එකඟ වනවාට සැක නැත. විවාහ ජීවිතය කළමනාකරණය කරමින් සිය සැමියා සහ දරුවන්ගේ ඕනෑ එපාකම් මෙන්ම ශරීර සෞඛ්‍යය කෙරෙහි බිරිඳක් විසින් දක්වනුයේ මහත් කැපකිරීමකි. මිල මුදල් නිසියාකාරව හසුරවමින් වයෝවෘද්ධ දෙමාපියන් පවා රැකබලා ගනිමින් සමාජ සංස්කෘතියට ගරු කරමින් නිහඬ සේවයක් කරන්නී ඇයයි. ඊටත් එහා ගිය වගකීම් කොටසක් ඉටුකරන්නියක් ලෙස රණවිරුවකුගේ බිරිඳක් දැක්විය හැකිය. පවුලක් තුළ නිහඬ යුද්ධයක් කරමින් රණවිරුවකු හට යෝධ ශක්තියක් වන ඔබ ගැනයි මේ කතාව.**

බියුගල් හඬට සොල්දාදුවා රාජකාරියට යනවාත් සමගම කුකුළා හඬලන හඬට අවදිව වගකීම් රැසක් හිසමත දරා ගනිමින් හමුදා සොල්දාදුවකුගේ භාර්යාවක් අන් භාර්යාවකට වඩා මෙහෙයක් ඉටුකරනු ලබයි. ඇය විටෙක මූල්‍ය කලමනාකාරිණියක්, දරුවන් රැක බලා ගන්නියක්, පවුල් ද්විත්වයක් අතර මැදිහත්කරුවෙක්, චිත්තවේගීයව ක්‍රියාකරන්නියක් මෙන්ම අනාගත අයිතිකරුවන්ගේ නිමැවුම්කාරිනියක් ද වේ. ඔවුන් විසින් කරන්නා වූ මෙම මෙහෙය පදක්කම් වලින් ඇගයීමට ලක්නොවූ නමුත්, ඇය අතින් නිමවෙන සෑම ප්‍රනීත ආහාර වේලක්ම, දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ගන්නා සෑම පියවරක්ම, උත්තර බඳින්නා වූ සෑම දුරකථන ඇමතුමක් තුළම ඇයගේ ඇගයීමට ලක්කළ යුතු කැපකිරීමක් තිබේ.

## නිමා නොවන දිනයක්

මෙවන් බිරිඳක් සිටින පවුලක දවස වේලාසනින් ආරම්භ වී ප්‍රමාද වී අවසන් වේ. ස්වාමියා නිවසේ සිටම කඳවුරු රාජකාරි සඳහා දෛනිකව පිටත් වන පවුලක බිරිඳට අමතර රාජකාරි තවත් කොටසක් ගොඩගැසෙනු ඇත. පවුලේ වියදම් ස්වාමිපුරුෂයාගේ වැටුපෙන් පමණක්ම හෝ ඇය විසින් උපයාගත් ක්‍රමෝපායන් හරහාද කළමනාකරණය කරමින් ඉතා සකසුරුවම් ලෙස නිවසට අවශ්‍ය බඩු බාහිරාදිය අඩු මුදලකින් යුතුව අවශ්‍යම සහ හොඳම දේ තෝරා බේරා ගනිමින්, විටෙක දරුවන්ට මවක්, ගුරුවරියක්, වෛද්‍යවරියක්, ව්‍යවසායිකාවක්, මනෝ උපදේශිකාවක්, සැමියාට දයාබර බිරිඳක්, මිතුරියක් මෙන්ම පවුලේ ඥාතීන් අතර සම්බන්ධීකාරකවරියක් ලෙස ජීවිත රඟමඩලේ විවිධ භූමිකාවන් රඟ දක්වන සෙබළ බිරිඳකගේ ගෙවනා දිනයන්ගේ ඇරඹුමක් හෝ නිමාවක් ඇයවත් නොදනී.

## ආර්ථික සමතුලිතතාවය

අසීමිත අවශ්‍යතා පිළිවෙලින් පෙලගස්වා හැකි උපරිමයෙන් කළමනාකරණය කරමින් ගෘහ ජීවිතයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා මූල්‍ය කළමනාකරණය මෙන්ම මූල්‍ය නිර්මාණශීලීත්වය ද අවශ්‍ය වේ.

එහිදී දෛනික අවශ්‍යතා සපුරාලීමට අමතරව සමාජ යුතුකම් ඉටුකිරීමේදී අමතරව ඇතිවන වියහියදම් කළමණාකරණය කිරීමටද ඇය පෙළඹෙනු ඇත. සැමියාගේ මාසික වැටුප නිසි පරිදි සැලසුම් කර මාසික වියදම් වෙන්කර රඳවා ගනිමින් හැකි පමණ මුදලක් ආයෝජනය කිරීමටද ඇය උත්සාහ කරනු ඇත. ජීවින බර තම සැමියාගේ උර මතට පමණක් නොදී නිවසේ වියදමට අමතර මුදලක් ඉපයීමේ අරමුණින් ව්‍යවසායිකාවක් ලෙස මැහුම් ගෙතුම්, ආහාරපාන අලෙවි කිරීම්, උපකාරක පන්ති පැවැත්වීම් ආදියෙහිද නියැලෙන ඇය කාලය කළමණාකරණය කරමින් ඒ සෑම අභියෝගයකටම මුහුණ දෙනුයේ රණවිරු සැමියාගේ මනස නිරවුල්ව තබමින්ය.

## දරුවන් රැකබලා ගැනීම

කාර්යබහුල සහ වගකීම් සහිත ස්වාමිපුරුෂයකුට බිරිඳක්ව දරුවන් ඇතිදැඩි කිරීම මෙන්ම රැකබලා ගැනීම සඳහා නොපසුබට ධෛර්යය අත්‍යවශ්‍ය සාධකයකි. එලෙසින්ම සෞඛ්‍යසම්පන්න මෙන්ම ගුණගරුක අධ්‍යාපනයෙන් පෝෂණය වූ දරුවන් තැනීම පහසු කාර්යයක් නොවනු ඇත. දරුවන් යනු හුදෙක් අප අන් අය සමඟ ගණුදෙනු කරන අයුරින් ඔවුන් සමඟ හැසිරීමට නොහැකි අතර මවගේ මානසික මට්ටම කුමන තත්වයක පවතීද යන්න දරුවන්ට නොවැටහෙනු ඇත. හුදෙක් සංවේදීව විමසිලිමත්ව ඔවුන් සමඟ කාලය ගතකිරීමට රණවිරු බිරිඳකට පැවරෙන වගකීම අන් මවකට වඩා අතිමහත්ය. අවැසි මොහොතේ තම සැමියා ළඟ නොමැති අවස්ථාවක පවා තැනට සුදුසු නුවණින් යුතුව කටයුතු කිරීමට ඇයට සිදුවනු ඇත. බොහෝ විට පිය පාර්ශවයෙන් දරුවන් හට විය යුතු වගකීම් පවා ඇය කර මතට ගැනීමට සිදුවනු ඇත. රාජකාරී බහුලත්වය මත පියාගෙන් මඟහැරුණු ආදරය, සෙනෙහස සහ වගකීම් ආදියෙහි අඩුව පුරවමින්, පිය සෙනෙහසද ලබාදී දරුවන් රැකගැනීමට ඇය මහත් පරිශ්‍රමයක් දරනු ඇත.

## නොහිතන අවස්ථාවන්ට මුහුණ දීම

රාජකාරී ස්වභාවය අනුව පැය 24 පුරාම ඕනෑම ස්ථානයක ස්ථානගත වී රාජකාරිය ඉටුකිරීමට රණවිරුවන් බැඳී සිටී. එවන් පසුබිමක සැමියාගේ හදිසි ස්ථාන මාරුවීම් හෝ දින ගණනාවක් නිවාඩු නොමැති වීම් මත අත්‍යාවශ්‍යම අවස්ථාවක පවා

> **රාජකාරි ස්වභාවය අනුව පැය 24 පුරාම ඕනෑම ස්ථානයක ස්ථානගත වී රාජකාරිය ඉටුකිරිමට රණවිරුවන් බැඳී සිටී. එවන් පසුබිමක සැමියාගේ හදිසි ස්ථාන මාරුවීම් හෝ දින ගණනාවක් නිවාඩු නොමැති වීම් මත අත්‍යාවශ්‍යම අවස්ථාවක පවා ඔහුගේ නොපැමිණීම ආදී හේතුවෙන් රණවිරුවකුගේ බිරිඳක් ලෙස ඇයට විවිධ අභියෝගයනට මුහුණදීමට සිදුවනු ඇත. විටෙක දරුවන්ට මවක්, ගුරුවරියක්, වෛද්‍යවරියක්, ව්‍යවසායිකාවක්, මනෝ උපදේශිකාවක්, සැමියාට දයාබර බිරිඳක්, මිතුරියක් මෙන්ම පවුලේ ඥාතීන් අතර සම්බන්ධීකාරකවරියක් ලෙස ජීවිත රඟ මඩලේ විවිධ භූමිකාවන් රඟ දක්වන සෙබළ බිරිඳකගේ ගෙවෙන දිනයක ඇරඹුමක් හෝ නිමාවක් ඇයවත් නොදනී.**

ඔහුගේ නොපැමිණීම ආදී හේතුවෙන් රණවිරුවකුගේ බිරිඳක් ලෙස විවිධ අභියෝගයන්ට මුහුණදීමට ඇයට සිදුවනු ඇත. එවන් තත්ත්වයන් තුළ පවුලේ සාමාජිකයින්ගේ හදිසි වියෝවීම්, අසනීප තත්ව, රෝහල් ගතවීම්, වයෝවෘද්ධ දෙමාපියන්ගේ අවශ්‍යතා ඉටු කිරීම් ආදියෙහිලා ද ඇය වැය කරන්නා වූ ශ්‍රමය මිලකළ නොහැක. බිරිඳක්, මවක්, දියණියක්, ලේලියක් ලෙස ඇය තමන්ගේ ආදරණියන් හට විය යුතු වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් වැඩ කටයුතු සංවිධානාත්මක ලෙස ඉටු කිරීමට මහත් පරිශ්‍රමයක් දරන්නීය.

## ඇයගේ මානසිකත්වය

ආදරය ලැබිය යුතු අවස්ථාවකදී පවා තනිවම සුසුමන් සිරකර ගැනීමට සිදුවන අවස්ථා ඇය හට කොතෙකුත් තිබේ. අන් සියලු දෙනා කෙරෙහි ඇය යොමුකරන අවධානය ඇය හට ලබාදීමට තරම් රණවිරු සැමියාහට කාලයක් නොමැති වනු ඇත. නිදහසේ ගමනක් බිමනක් යාමට, යහළු යෙහෙලියන් සමඟ විනෝදයෙන් අල්ලාප සල්ලාපයෙහි යෙදීමට, විවේකීව දවස ගතකිරීමට ඇයට නොහැකිවනු ඇත. වෙහෙසකර දිනයක අවසානයේ ඇයගේ හිත සනසාලීමට ඇත්තේ තම සැමියාගෙන් ලැබෙන දුරකථන ඇමතුම පමණි.

මෙම ලිපිය කියවන ඔබ ද, රණවිරුවකු විය හැකිය. එසේ නොමැති නම් ඔබගේ යෙහෙලියක, ඥාතිවරියක නැතිනම් ඔබගේ ආදරණිය ලේලිය හෝ තරුණ ඔබගේ මවද එම ශක්තිමත් කාන්තාව විය හැකිය. එසේ නම් ඇය කෙරෙහි ඔබගේ වගකීම කුමක්ද, ඇය වටා ගොඩගැසුනු වගකීම් සමුදාය පිළිබඳ සිතන්න. සාමාන්‍ය බිරිඳක්, මවක්, දියණියක්, ගැහැණියක් මෙන් නොව අන් සියලු කාන්තාවන්ට වඩා පියවරක් හෝ ඉදිරියෙන් ඇයගේ සිතුවිලි, නොපසුබට උත්සාහය ඇය සතුව ඇත. එහිදී ඇය අතින් සිදුවන අතපසුවීම් තිබිය හැක. සියලු දේ සිතන පරිදි නොපිරිහෙලා ඉටුකර ගැනීමට නොහැකි අවස්ථා මෙන්ම කාලයත් සමඟ වැඩ කටයුතු කළමනාකරණය කර ගැනීමට නොහැකි වන අවස්ථාද ඇය හට කොතෙකුත් යෙදේ. මන්දයත් ඇයත් ඔබ අප මෙන්ම ලේ මස් නහරයෙන් යුතු අයෙකි. රෝගාබාධ, මානසික ව්‍යාකුලතා ආදියට දෛනිකව මුහුණ දෙමින් ඒවා යටපත් කරමින් තනිව ජීවන අරගලයේ යෙදෙමින් වගකීම් ඉටුකිරීමට ඇයට සිදුවනු ඇත. ඇයව තේරුම් ගැනීමට මෙන්ම ඇය හට හැකි අයුරින් සහය වීම සහ දේශය වෙනුවෙන් කැපවූ සොල්දාදුවකුගේ මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට ඔබ විසින් කරනු ලබන ඒ කැපකිරීම ජාතික මෙහෙවරක් ද වනු ඇත. වීර සෙබළෙකුට යෝධ ශක්තියක් වන ඔබ කිසිදා තනි නොවනු ඇත.



එච්ජීජේ
හවන්ති



# කුමුදුගේ කථාව

# අන්තිම නිවාඩුව




"යුද්ධය" යනු නීරස මාතෘකාවකි. ගිනි අවි ගැටුණු සෑම බිමකම අවසානයට ඉතිරිවූ අදෝනා මැසිවිලි හා විනාශය පමණි. එය ජීවිත වලින්ද භෞතික පරිසරයෙන්ද වන්දිගෙවූ අභාග්‍ය සම්පන්න පරිසරයකි. යුද්ධයක සෘජු මැදිහත්කරුවන් වනුයේ සටන්වදින පාර්ශවයන්ය. අප රටෙහි ඊට දෙපිරිසක් මුල්වූ නමුත් ඉන් පීඩාවිඳි තවත් පාර්ශව කිහිපයක්ම සිටියේය. ඒ අතර රණවිරු බිරින්දෑවරුන් ද තිරය පිටුපස හිඳ නිහඬව ඉහිලූ දුක්කන්දරාව අතිමහත්ය. ඔවුන් හෙලූ කඳුළු එකතු කළේ නම් බැරල් ගනන් පිරවීමට හැකි තරම්ය. තිස්වසක් පුරා මෙරට පැවති යුද්ධයේ අභාග්‍යසම්පන්න ඉරණමට ගොදුරුව තම ස්වාමිපුරුෂයින් අහිමි වූ බිරින්දෑවරු සංඛ්‍යාව දහස් ගණනකි. ඉන් බොහෝ දෙනකුට සටනින් දිවි පිදූ තම ස්වාමියාගේ සිරුර හෝ දැකගත හැකි නොවීය. ඔවුන් දුටු එකම සාධකය වූයේ  අතුරුදහන් ලැයිස්තුවේ තිබූ නම පමණකි. එවන් අය අදටද හාස්කමකින් හෝ යලි තම සැමියා තමා කරා පැමිණේවි යැයි බලා සිටිති.

යුද්ධය හේතුවෙන් තරුණ වයසේදීම ස්වාමිපුරුෂයින් අහිමි වූ කාන්තාවන් දිගින් දිගටම සංඛ්‍යාත්මකව වැඩිවීම එකල ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත්ව තිබිණ. බොහෝ බිරින්දෑවරු එම තත්වයට පත්වූයේ ඉතාම තරුණ වයස්වලදීය. ඒ අතර අත දරුවන් සමඟ හුදෙකලා වූ අයද වේ. ඇතැමුන් දරුවන් පිළිසිඳගත් අලුතද ඇතැමෙක් දරු ප්‍රසූතිය සිදුකළ අලුතද එසේ වැන්දඹුවන් බවට පත්වූහ. මේ කුමන තත්වය යටතේ වුවද සමස්තයක් ලෙස රණවිරු බිරින්ඳෑවරු තරම් මානසික හා සමාජ පීඩනයකට ලක්වූ තවත් බිරින්දෑවරු කොටසක් ඇතැයි සිතිය නොහැක. මෙවර "යුධ සමයේ සැඟවුණු කතාවක් තුළින් ඇරඹෙනුයේ එවන් හුදෙකලා බිරින්ඳෑ කෙනෙකුගේ කඳුළු පෙළකි.

ඒ 1990 දශකය ඇරඹුමයි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි "මොරවැව" එවකට ත්‍රස්තවාදයේ සෘජු තර්ජනවලට ලක්ව තිබූ ප්‍රදේශයකි. එහි තැන තැන පැවති මාර්ග බාධක ද ඇඳිරි වැටීමට ආසන්න වෙද්දී හුදකලාවන ප්‍රධාන හා අතුරු මාර්ග ද ඉඳහිට තැනෙක ඇසුන වෙඩි හඬවල් ද එම ක්‍රියාන්විත බිමෙහි හැටි සොබා මනාවට පෙන්නුම් කළේය. සිංහල, මුස්ලිම්, දෙමළ ජන කොටස් ත්‍රිත්වයම එහි වෙන් වෙන්ව පදිංචිව සිටි අතර ත්‍රස්තවාදී කලබල උත්සන්න වනවිට ද්‍රවිඩ ජනතාව පමණක් සිය ගම්බිම් අතහැර වෙනත්

ප්‍රදේශවලට සංක්‍රමණය වී තිබුණි. ප්‍රදේශයේ ජනජීවිතය සහමුලින්ම පාහේ යුද්ධය හා බැඳී පැවති අතර ඒ නිසාම එහි වැසියන්ට අත්විඳීමට සිදුවූ දුක් ගැහැට නිමක් නොවීය. විශේෂයෙන්ම රාත්‍රී කාළයේ එහි ගම්මානවල කිසිවකුත් නිවෙස්වල රැඳී නොසිටි අතර යන්තමින් අඳුර වැටෙද්දී අතට හසුවන යමක් රැගෙන හුදෙකලා වනාන්තර තුළ කල් ගෙවන්නට සිදුවූයේ තම අත දරුවන් ද කරපින්නාගෙනය.

එච්එම්ඩී කුමුදු කුමාරි මොරවැව ග්‍රාමයේ පදිංචි පාසල් සිසුවියකි. ඕ සෑම දිනකම පා ගමනින් පාසල කරා ගමන් කරන ලද්දේ ප්‍රදේශයේ වූ යුද හමුදා කඳවුර ආසන්නයෙන් වැටීතිබූ මාර්ගයේය. ක්‍රියාන්විත අවශ්‍යතා සඳහා යුද හමුදා සාමාජිකයින් නිරතුරුව ප්‍රදේශයේ සැරිසැරීම එකල සාමාන්‍ය සිදුවීමකි. කුමුදු කුමාරිට නිතර එවැනි අය හමුවීම ද සුලභය. නමුත් ඒ අතර වූ අයෙක් ඇය ගැන අමුතු උනන්දුවක් දන්වන බව ඇයට තේරුම්යන්නට වූයේ තරමක් කල්ගත වූ පසුවය.

9 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් උපාලි ජයතිස්ස ඒ වන විට රාජකාරී කරන ලද්දේ මොරවැව පිහිටි යුද හමුදා කඳවුරේය. මහනුවර මැදවල පදිංචිකරුවකු වූ ඔහු එම කඳවුරෙහි රාජකාරී සඳහා එක්ව තිබුණේ මෑත වකවානුවකදීමය. සිය රාජකාරී අතරතුර කඳවුර ඉදිරිපිට ඇති මාර්ගයේ යනෙන බොහෝ පිරිස් අතර ඔහුගේ සිත්ගත් කුමුදු කුමාරි නම් පාසල් සිසුවිය පිළිබඳ ඔහු උනන්දු වන්නට වූයේ එලෙසිනි. ඒ අතරම ඔහු තම සිතැඟි පවසා ඇය නමට ලියූ පෙම් හසුනක් ද ඈ අතට පත්කරන්නේ 1990 දෙසැම්බර් 11 ලෙස දිනය ද සටහන්වය. එතැන් පටන් එම ආගන්තුක ඇරයුම වෙනුවෙන් කුමුදු කුමාරිගෙන් ද ලැබුණේ බලාපොරොත්තු සහගත ප්‍රතිචාරයකි. යුදමය පසුබිමක් කොතරම් පාරිසරික දුෂ්කරතා පැනනැගුනද හදවතක් තුළ වන ආදරයක් දලුලන්නට එහි කිසිදු බාදාවක් නොවීය. කුමුදු හා සෙබළ උපාලි අතර ප්‍රේමයක් ලියලන්නට වූයේ ඒ බැව් කදිමට සනාථ කරමිනි.

කෙසේ නමුත්, තම සම්බන්ධය කනවැකුණු සැනින් කුමුදුගේ දෙමාපියෝ බෙහෙවින් කලබලයට පත්වූහ. ඊට ඔවුන්ගේ කිසිදු අනුකූලතාවක් නොලැබිණ. යුද ගැටුම් පැවති එම ප්‍රදේශයන්හි



**සැරයන් උපාලි ජයතිස්ස හා කුමුදු කුමාරි විවාහ වූ දින**

යුද්ධය හේතුවෙන් තරුණ වයසේදීම ස්වාමිපුරුෂයින් අහිමි වූ කාන්තාවන් දිගින් දිගටම සංඛ්‍යාත්මකව වැඩිවීම එකල ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත්ව තිබිණ. බොහෝ බිරින්ඳෑවරු එම තත්වයට පත්වූයේ ඉතාම තරුණ වයස්වලදීය. ඒ අතර අත දරුවන් සමඟ හුදෙකලා වූ අයද වේ. ඇතැමුන් දරුවන් පිළිසිඳගත් අලුතද ඇතැමෙක් දරු ප්‍රසුතිය සිදුකළ අලුතද එසේ වැන්දඹුවන් බවට පත්වූහ. මේ කුමන තත්වය යටතේ වුවද සමස්තයක් ලෙස රණවිරු බිරින්ඳෑවරු තරම් මානසික හා සමාජ පීඩනයකට ලක්වූ තවත් බිරින්ඳෑවරු කොටසක් ඇතැයි සිතිය නොහැක.

දිනපතා මියෙන තුවාල ලබන හමුදා සාමාජිකයින් පිළිබඳ නිරන්තරව අසන්නට ලැබෙන පසුබිමක් තුළ තම දියණිය එවන් අයෙක් සමඟ සබඳතාවක් පැවැත්වීම අනාගත අවදානමක් මතුවිය හැකි බවට ඔවුන්ගේ උපකල්පනය විය. සැබැවින්ම යුද සෙබළුන් පිළිබඳ ඒ වනවිට සමාජයේ පැවති පොදු ආකල්පයද එසේම විය. කෙසේ නමුත් සෙබළ උපාලිගේ දැඩි උවමනාව මතම දෙමාපිය විරෝධ මධ්‍යයේ වුව තම ආදරය නොවෙනස්ව පවත්වාගෙන යාමට කුමුදු කුමාරි කටයුතු කළාය. අවසානයේ කෙසේ හෝ දෙපාර්ශවයේ කැමැත්ත දිනා ගන්නා සෙබළ උපාලි ඇය සමඟ අතිනත ගන්නේ දෙවසරකට ආසන්න වූ සිය ප්‍රේමය මල්ඵල ගන්වමිනි.

විවාහයෙන් පසුව මහනුවර මැදවල පිහිටි තම ස්වාමියාගේ නිවසේ නතරවූ කුමුදු අලුත් පරිසරයේ තම අලුත් ජීවිතය අරඹන්නට වූවාය. ඒ වනවිට දෙමාපියන් හැරුනු විට ස්වාමියාගේ සහෝදර සහෝදරියන් තිදෙනෙක්ද එහි වූ නමුත් ඇයට එහි දැනුනේ දැඩි හුදෙකලා බවකි. විශේෂයෙන්ම පැවති ක්‍රියාන්විත තත්වය හේතුවෙන් කෝප්‍රල් උපාලිගේ නිවාඩු බෙහෙවින් සීමා වී තිබූ අතර බොහෝ අවස්තාවල ඔහුට නිවසට ඒමට හැකි වූයේ අවම වශයෙන් මාස තුනක් ඉක්ම ගිය පසුවය. ස්වාමියාගේ දුරස් බව ද ඔහුගේ රාජකාරී ප්‍රදේශයේ වූ ජීවිත අවධානම ද හමුවේ බිරිඳ කුමුදු නිරතුරුවම පසුවූයේ පීඩනයකිනි. ඒ අතරම කලාතුරකින් හෝ ඔහු නිවාඩු පැමිණිය ද නිවසේ පැවති පරිසරය හමුවේ ඇයට නිදහසේ තම හැඟීම් ස්වාමියා සමඟ බෙදාගැනීමට තරම් අවස්ථා ද නොවීය. සැමියා සමග ගමනක් බිමනක් යාම පවා ඇයට සීමා වී තිබූ අතර, දෙදෙනා එක්ව දළදා මාලිගාවට ගිය ගමනක් හැරෙන්නට වෙනත් විනෝද ගමනක් යාමට තරම්වත් අවස්ථාවක් ඇයට නොලැබිණ.

කෙසේ හෝ මෙලෙස කලක් ගතවෙද්දී උපාලිට දාව තම කුළුදුල් දරුවා පිළිසිඳ ගත්තේ කුමුදු තුළ  අප්‍රමාණ බලාපොරොත්තු පුරවාලමිනි. ඒ සමගම උපාලි පැමිණි ආසන්න නිවාඩු වාරයකදී ඔහු සමඟ කුමුදු මොරවැව පිහිටි තම මහගෙදර කරා යනුයේ දරු ප්‍රසූතිය තෙක් එහි රැඳී සිටීමේ අදහසිනි. එහිදී, ඇට දෙමාපියන්ගෙන් ලැබුනේ නොමද සැලකිල්ලකි. ඒ වනවිට ඔවුන්



**සැරයන් උපාලි ජයතිස්ස (ඡායාරූපයේ මැද)**

දුෂ්කරතා මැද සාමාන්‍ය ජීවිතයක් ගතකළ ද තම දියණියට කිසිවකින් අඩුපාඩු නොවන්නට කුමුදුගේ දෙමාපියෝ වගබලා ගත්හ. මෙලෙස කාලය ගෙවී 1995 පෙබරවාරි 28 දින දින කුමුදු සිය කුළුඳුල් දරුවා ප්‍රසූත කළාය. දියණියක වූ ඇයට ''කසුනි තරුශිකා'' ලෙස සුන්දර නමක් ද තැබුවාය.

දියණිය ලැබී මෙලෙස තවත් කලක් ගතවන විට මොරවැව, ගජබාපුර ආදී ප්‍රදේශ රැසකට ස්ථාන මාරු ලැබ සිටි සෙබළ උපාලි පිළිවෙලින් සැරයන්වරයකු ලෙස උසස් වීමක් ද ලැබ තිබුණි. එලෙස තවදුරටත් ඔවුනගේ ජීවිත ගලා යද්දී ඔහුට මුලතිව් කඳවුරට මාරුවීමක් ලැබෙනුයේ අනපේක්ෂිත අයුරිනි. ඒ වන විට හුදෙකලාව පිහිටි මුලතිව් කඳවුරේ පැවති දැඩි අවදානම හමුවේ තම ස්වාමියා එහි යාම පිළිබඳ බිරිඳ කුමුදු තුළ කිසිදු කැමැත්තක් ද නොවීය. නමුත්, කුමන වාතාවරණයක් යටතේ වුව හමුදාවේ රාජකාරී ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් පසු වූ ඇය සියල්ල දරා ගනිමින් සිටියා මිස සැමියාගේ ගමනට හරස් නොවූවාය.

මෙලෙස තවත් කලක් ගතවිය. ඒ වනවිට සැරයන් උපාලි මුලතිව් රාජකාරී අරඹා වසරකට ආසන්න වී තිබිණ. සුරතල් දියණිය ද කලදවස ගෙවෙද්දී උස්මහත් වන්නට වූයේ නොදැනීමය. නමුත්, පියා ලෙස ඇයගේ සුරතල් බලන්නට තරම් අවස්ථා සැරයන් උපාලිට බොහෝ සීමා විය. මුලතිව් කඳවුරේ රාජකාරියට වාර්තා කළ දා පටන් ඔහුගේ නිවාඩු පෙර අවස්ථාවලට වඩා සීමා වූ අතර, එය ඇතැම් විට මාස හතරක් තරම් දිගු විය. සමස්තයක් ලෙස ඔහුගේ රාජකාරී දිවිය තුළ ඒ වනවිට තම දියණිය දකින්නට ලැබී තිබුණේ වාර දෙක තුනකදී පමණි.

උපාලි මුලතිව්හි සිට යළිත් වතාවක් නිවාඩු ලැබ නිවසට පැමිණෙන ලද්දේ 1996 ජූලි මස පළමු සතිය ගෙවෙද්දීය. එවර ඔහුට පෙර නොවූ තරම් උද්දාමයට හේතු වී තිබුනේ සිය දියණිය තවදුරටත් දඟකාරකම් පෙන්වන සමයක් වීම නිසාමය. එවර ද සුපුරුදු ලෙසට ඔවුන් තිදෙනා දළදා මාලිගාවට ද යන ලද්දේ විශේෂයෙන්ම එය බිරිඳ කුමුදුගේ ප්‍රියතම තැන ද වූ නිසාමය. මෙලෙස නිවාඩුවේ සතියක් ගෙවෙන්නටත් මත්තෙන් සැරයන් උපාලිට හදිසියේම නිවසට පැමිණි පොලිස් නිලධාරියකු හරහා පණිවුඩයක් ලැබිණ. එමගින් කියවුනේ ඔහුට කඩිනමින් යළි කඳවුරට වාර්තා කරන ලෙසය. ඔහුට මෙන්ම එම පණිවුඩය ඒ වනවිට මුලතිව් සිට නිවාඩු ලැබ සිටි සෙසු අයට ද දැනුම් දී තිබුණි. මුලතිව් කඳවුරට එල්ල වෙමින් තිබූ ත්‍රස්ත තර්ජන උත්සන්න වීමත් සමඟ එහි ආරක්ෂාව දැඩි කිරීම පිණිස එලෙස හටපිරිස් කඩිනමින් යළි කැඳවීමට හේතු වී තිබිණ.

ක්‍රියාන්විත පෙදෙසක සිට සෙබළකුට නිවාඩුවක් හිමිවීම යනු එකල අතිශය විරල කරුණකි. කෙසේ හෝ අමාරුවෙන් හිමිකරගත් එම සීමිත නිවාඩුව ද රිසිසේ ගෙවන්නට අවකාශ නොලැබීම හේතුවෙන් සැරයන් උපාලි තුළ සේම බිරිඳ කුමුදු තුළ ද ඇති වූයේ ඉමහත් කනස්සල්ලකි.

**හුදෙකලාව පිහිටි මුලතිව් කඳවුරේ පැවති දැඩි අවධානම හමුවේ තම ස්වාමියා එහි යාම පිළිබඳ බිරිඳ කුමුදු තුළ කිසිදු කැමැත්තක් ද නොවීය. නමුත් කුමන වාතාවරණයක් යටතේ වුව හමුදාවේ රාජකාරී ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් පසු වූ ඇය සියල්ල දරා ගනිමින් සිටියා මිස සැමියාගේ ගමනට හරස් නොවූවාය. මෙලෙස තවත් කලක් ගතවිය. ඒ වනවිට සැරයන් උපාලි මුලතිව් රාජකාරී අරඹා වසරකට ආසන්න වී තිබිණ. සුරතල් දියණිය ද කලදවස ගෙවෙද්දී උස්මහත් වන්නට වූයේ නොදැනීමය. නමුත් පියා ලෙස ඇයගේ කෙළි සිනා බලන්නට තරම් අවස්ථා සැරයන් උපාලිට බොහෝ සීමා විය. මුලතිව් කඳවුරේ රාජකාරියට වාර්තා කළ දා පටන් ඔහුගේ නිවාඩු පෙර අවස්ථාවලට වඩා සීමා වූ අතර එය ඇතැම් විට මාස හතරක් තරම් දිගු විය. සමස්තයක් ලෙස ඔහුගේ රාජකාරී දිවිය තුළ ඒ වන විට තම දියණිය දකින්නට ලැබී තිබුණේ වාර දෙක තුනකදී පමණි.**

හමුදාවේ රාජකාරී ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් සිටි උපාලි උද්ගතව ඇති තත්ත්වයට අනුගතවන්නට වූයේ සිය බිරිඳව ද අස්වසාලමිනි. ඒ අනුව 1996 ජූලි මස 14 වන දින උදෑසනින්ම ඔහු සිය ගමන් මල්ල ද සූදානම් කර ගනිමින් යළි කඳවුරක් බලා පිටත් වන්නට වූයේ අවසන් වතාවට ද බිරිඳ කුමුදුගේ හා දියණියගේ හිස සිඹිමිනි.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)



**ලුතිනන් කර්නල්**
**ඊඒචී සුජිත් චමින්ද**

# සෙබළ සිතුවිලි

## මල් කුමාරියේ...

කවියට පණ දෙමුයි යටිහිත පවසනවා
ඔබ ගැන ලියන්නැයි හදවත මුමුණනවා
ලස්සන රුවක් සිත් අහසේ බැබලෙනවා
මල් කුමරියට කවි පද වැල් ලියවෙනවා

දියයට ඉපිද හිරු එළියක් සොයා එන
මානෙල් මලක් ඔබෙ මුව ලඟ තබාගෙන
ලස්සන බලන්නට කීවත් තෝරන්න
කෙලෙස තෝරම්ද ඔය රුව බලාගෙන

පිපිණු මලේ තිබෙනා ලස්සන දුටුවා
ඔබේ මුවත් ඒ වාගෙම මම දුටුවා
වරුවක් ගෙවෙන විට මල විකසිත වූවා
සිත් අහසේ පිපි මල වෙත පෙම් කෙරුවා

විටකදි දුටුවෙ ඔබෙ මුව පුන් සඳ ලෙසට
දෙවඟන නළඟනන් පරයයි ලැම හසට
ආලය කරන්නට සිතුවත් ඔබෙ සිතට
කඳුළැල් පමණි රැඳුනේ නෙතු පියන් යට

සැමදා පිබිද ආදරයම පසක් කෙරූ
දකිනා විටදි සතුටට මා සිත් පෑරූ
මතකයෙ රැඳුණු තැන්වල කඳුළැලි වැගිරූ
මල් කුමරියත් මිරිඟුව විය හද පෑරූ


සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී
11 ශ්‍රීලංජාආබමු
ජනමාධ්‍ය හා මව්මෙඅම

## මගේ අම්මා...

හිරුත් මම නුඹේ දහවල එළිය කළ
සඳුත් වුණා මම නුඹෙ රැය සිසිලකළ
ලොවක් හිනැහුණා විටකදි විහිලු කර
මමත් එන්න හැඬුවා නුඹ වෙත නිරන්තර

අම්මා නුඹයි මගේ ලෝකය එළිය කළ
නම්මා දෙපා වඳිනෙමි නැහැ හිතට බිය
දුන්නේ ඔවාමිණි මා හට මෙහෙම දින
වැන්දේ බුදුන් නුඹේ මව්ගුණ මෙනෙහිකර

ලා/කෝ රාජපක්ෂ ජීජීකේ
6 ගරෙ




## හොඳ නරක...



නුඹලාට නොදැනුනත්
හොඳ නරකක් එහෙම
මට දැනෙනවා නුඹලට
වැඩියෙන් තාම
දැනුණත් නොදැණුනා වාගේ
ඉනු කොහොම
පපුවට බරක් දැනුණේ
නැතුවද තාම

සෙ/ඞී102485
පාසෙ මධුෂාන් ඞීආර්යූ
2(සෙව්) ශ්‍රීලපාහ



## ඉගෙනුම...

පෙර පාසල තුළින් අකුරු හුරු වෙද්දී
අම්මා සමඟ මා පාසල වෙත යද්දී
ගෙදර ඇවිත් කවි සී පද කියවද්දී
දැනුමින් පිරුණි මගෙ සිත නිරතුරු ඉද්දී

කාලය ටිකෙන් ටික ගතවීගෙන යද්දී
පාසල් කාලෙ ටික ටික නිමවී යද්දී
අම්මගෙ තුරුල්ලේ මා ඇති දැඩි වෙද්දී
අකුරු ඉගෙන ගත්තෙමි පාසල් යද්දී

ඉගෙනුම නමැති ඔරුවට ඔබ ගොඩවන්න
බුද්ධිය නමැති හබලෙන් එය පදවන්න
අතරමඟදි හොඳ නෑ ඔබ නවතින්න
කැම්පස් කියන වෙරළට ඔබ ගොඩවන්න

ලා/කෝ සම්පත් ඩීඑම්අයි
9 ගැහේබ

## ප්‍රේමය...

සිතේ කකියන හුඟක් දේවල්
ඇසිපියන් මට කියන්න...
වාරුවෙන්නට උරහිසක් මට නැතිවුනත් අද
එපා තනියක් ඔබට නම් දැනෙන්න...
සිහින එකිනෙක එකට අමුණා
එක්ව ගෙතූ ඒ සතුටු කාලය
මගෙන් උදුරා දමන්න...
හදා ගත්තේ කොහොමදෝ සිත
මොහොතකින් මා ඇතෑරලා
ඔහුගේ අතගෙන පිය නගන්න...

සෙ/163274 බොම් මධුසංඛ පීජීඑස්
6 ශ්‍රීලකාහ




## හිරු නොදුටු සේපාලිකා...

නැග එන සඳුගේ
මෘදු ගතියට හිත බන්දා
සේපාලිකා මල් සුවඳක් පෙම් බැන්දා
පෙති පුබුදුවන විට
හිරු බැසගොස් හින්දා
සේපාලිකා හැම රැකම ඉකිබින්දා
දෙනෙතින් වැටෙන කඳුලැලි
පෙති අඟට වැද
සඳ තරු සමඟ දුක්ගැනවිලි කියන සඳ
මිහිරස ගෙනෙයි ඈ විහිදූ මෘදු සුවඳ
ඈ නිදිමරයි හිරු පායන විට සබඳ
දරදඬු හිතක් ගෙන පායා එන හිරුට
නොපෙනේ තුෂාර ලෙස ඇති
ඇගෙ කඳුළු කැට
සොඳුරුයි සොබාදම පෙන්වූ දසුන මට
කවිපද බැඳුනෙ එහි සුන්දර විලාසෙට

ලා/කෝ කුමාර එච්එම්පීඑන්
2(සෙව්) ශ්‍රීලපාහ

මතක මංපෙත් ඔස්සේ

# එදා සිළුමිණ නොබැලුවා නම් මෙදා වියෝවක් නැහැ



1993 වර්ෂයේ මා හට මතක ආකාරයට සැප්තැම්බර් මස දිනක මා පුස්තකාලයේ සිළුමිණ පුවත්පත කියවමින් සිටියෙදී පුවත්පතේ තිබූ මධ්‍යම ප්‍රමාණයේ දැන්වීමක් කෙරෙහි මාගේ අවධානය යොමු විය. එය යුද හමුදා ස්වේච්ඡා බලසේනාවට ආධුනික සෙබළුන් බඳවා ගැනීම සඳහා පළකරන ලද දැන්වීමකි. ඊට පෙර ද යුද හමුදාව වෙත බඳවා ගැනීම් නිවේදන පුවත්පත් මගින් දැන ඇතත් මෙම නිවේදනයේ තිබූ විශේෂ කරුණක් මාගේ දැඩි අවධානයට ලක්විය. එහි දක්වා තිබුනේ දැනට රජයේ සේවයේ යෙදී සිටින අයට ද එම රැකියාව තබා ගෙනම යුද හමුදාවට බැඳිය හැකි බවත් එසේම රැකියාවක් නොමැති අයෙකුට ඉදිරියේ රජයේ රැකියාවක් ලැබුනහොත් අනිවාර්ය නිවාඩු මත එම රැකියාව භාර ගැනීමට හැකි බවටයි. මෙය මාගේ තරුණ සිත ආකර්ෂණයට ලක්කළ කොන්දේසියක් වුයේ යම් දිනක මාගේ අධ්‍යාපන සුදුසුකම් මත සිවිල් රැකියාවක් ලැබුනහොත් එය ද භාර ගැනිමේ නිදහස එහි දක්වා තිබීමයි. මා ඊට පෙර දැක තිබූ යුද හමුදා බඳවා ගැනිම් දැන්වීම්වල එවැනි කරුණක් සඳහන් වී තිබුනාදැයි මා හට මතකයක් නොමැති බැවින් මා ඒ සඳහා නැඹුරු වුයේ යැයි මා හට අද ඒ පිළිබඳව සිතන විට සිහිපත් වේ.

සම්මුඛ පරීක්ෂණ පවත්වන ස්ථාන කිපයක් දක්වා තිබූ අතර, එයින් මා හට ආසන්නම ස්ථානය වුයේ තිසාවැව යුද හමුදා කඳවුරයි. මා මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන බවත් සමත් වුවහොත් අනිවාර්යෙන්ම යුද හමුදාවට බැඳීමට මා විසින් තිර අධිෂ්ඨානයක් ඇති කරගත් අතර, එදින සිටම ඒ සඳහා ඇවැසි කටයුතු සුදානම් කර ගත්තේ පාසලට හා නිවසට කිසිදු තොරතුරක් නොපවසමිනි. පාසැලේ අස්වීම් සහතිකය හැර අනෙකුත් සියලු සහතික ගොනුවකට දමා ගත් මා සම්මුඛ පරීකණය සඳහා දිනය එළඹෙන තෙක් නොඉවසිල්ලෙන් කාලය ගතකරන ලදී.

මුලික ප්‍රශ්නය වුයේ වයස අවුරුදු 18 සම්පූර්ණ කිරීම සඳහා තවත් මාස කිපයක් තිබීමයි. නමුත්, එවකට පැවති ක්‍රමවේදය අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා පුහුණුව සඳහා යවන දිනය වනවිට වසර 18ට සම්පූර්ණ වෙතැයි මා බලාපොරත්තු විය. කෙසේ නමුත් නිවසට හා පාසැලට කිසිදු දැනුම් දීමක් නොමැතිව මා විසින් තිසාවැව කඳවුරේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම සඳහා පිටත් වූයේ කුමක් සිදුවන්නේදැයි අවිනිශ්චිත හැඟීම් සමුදායයක් හිතේ කැටිකර ගනිමිනි.

අද කාලයට සමගාමීව යුද හමුදාවට බැඳීමට තිබූ උනන්දුව කොපමණදැයි පැරැණ්නෝ දනිති. බඳවා ගැනීම් පෝලිම තිසාවැව ගේට්ටුවේ සිට පසුපසට කිලෝමීටරයකට වඩා තිබූ අතර දෙවියන් සිහිවූයේ මෙපමණ සංඛ්‍යාවකින් මා තේරීපත් වේදැයි දැඩි සැක සංකාවක් සිතට ඇතුළු කරමිනි. කෙසේ නමුත්, පැමිණි සිටි කිහිප දෙනකු සමඟ මිතුරු සබඳකම් ඇති කර ගැනීමට ක්ෂණිකව හැකිවීම සිතට සහනයකි. මා ඉතා ලාබාල පෙනුමැති අයෙකු වීමත් මා හට සමානුපාතිකව ඔවුන් ඉතා වයස වැඩි හා ශරීර ප්‍රමාණයෙන් විශාල අයවීමත් මත ඔවුන් මා හට යම් අනුකම්පාවක් දක්වන බව ද මට දැනුනි. දැඩි උෂ්ණය මත පෝලිමේ සිටීම මත ඇති වූ අපහසුතාවය ද අධිකය. කෙසේ නමුත්, ඉහත දැක්වූ සහෘදයන් කිහිපදෙනකු මා කඳවුර ඉදිරිපස තේ පැන් සැලකට ගෙන ගොස් කෙටි ආහාරයක් හා තේ පානයක් මිළදී ගෙනදුන් බව මා හට අද මෙන් මතකය. ඒ සඳහා මුදල් ගෙවූ මට වඩා වසර ගාණක් වැඩි මහල් සොහොයුරා මා සමඟම පුහුණුව ලබා එකම ඒකකයේ සේවය කළ ද ඉතා කෙටි කලකින් සේවය අතහැර යන ලදී.

අවසානයේදී කෙසේ හෝ මාගේ වාරය එළඹ මා සම්මුඛ පරීක්ෂණයට

කැඳවූ අතර, එහි නිලධාරීන් තුන් දෙනකු සිටි අතර, පසුව දැනගත් පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරියා එවකට ලුතිතන් කර්නල් ප්‍රේමචන්ද්‍ර නම් වූ ගජබා රෙජිමේන්තුවේ කෘතහස්ත නිලධාරියෙකි. ඔහුගේ සහයට ලුතිතන් නිලයේ නිලධාරීන් දෙදෙනකු විය.ඔවුන් දෙදනො තම ජ්‍යෙෂ්ඨ නිලධාරියා කෙරෙහි දැඩි ගෞරව සම්ප්‍රයුක්ත බවකින් හැසිරෙන බව මා හට වැටහිනි. මා සම්මුඛ පරීක්ෂණ මැදිරිය තුළට ඇතුලු වනවිටම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ මුවින් පිටවූයේ අයියෝ ගොඩක් පොඩි ළමයෙක්නේ යනුවෙනි. මා මඳක් චංචල වුව ද හොඳින් සම්මුඛ පරීක්ෂණයට මුහුණදීමට තරයේ අදිටන් කර ගතිමි. ක්ෂණිකයෙන්ම මාගේ සහතික අයත් ගොනුව අධීක්ෂණය කළ ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමාගේ මුහුණ කෙමෙන් වෙනස් වනු මට පැහැදිලිව පෙනුනි. සුලු වෙලාවක් ඇතුළත මාගේ සහතික පත් ගොනුව පරිවාර නිලධාරි දෙදෙනගේ ද අතින් අත මාරුවී යළිත් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අතට පැමිණි අතර, ඔහු සියලු සහතික පිළිවෙලට සකසා මාගෙ අතට ලබා දුන්නේ දරුවෝ ඔයා ගිහිල්ලා නැවත පාසැල් යන්න උසස් පෙල විභාගය ලියන්න. මා හට දැනුනේ අකුණු කිපයක් මා ඉදිරියේ පුපුරා ගියා සේය. දෙනෙත් කඳුලින් පිරීගිය අතර වචන ගැට ගසාගැනීම උභතෝකෝටිකයක් සේ දැනුනි. නමුත්, කෙස් හෝ වචන කිපයක් ගලපා ගනිමින් ඉල්ලා සිටියේ නැවත පාසැල් යාමට කිසිදු අදහසක් නොමැති බවත් හමුදාව හා එක්වීමට අවස්ථාවක් ලබාදෙන ලෙසයි. නමුත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අදහස වූයේ මා උසස් අධ්‍යාපනය ලැබිය යුතු බවත් යුද හමුදාවට සෙබළෙකු ලෙස බැඳීමට මාගේ අධ්‍යාපන සුදුසුකම් ඉතා වැඩි බවත්ය. යුද හමුදාවට බැඳීමට අවශ්‍ය වන්නේ නම් උසස් පෙල සමත් වී නිලධාරියකු ලෙස හමුදාවට එක්විය හැකි බවත් පවසන ලදී. නමුත්, මා තරයේ මාගේ අදහසේම සිට නැවත නැවත ආයාචනා කිරීමේදී එක් නිලධාරියකු මාගේ සහතික නැවත පරීක්ෂා කර බැලීය. පාසැල් කාලයේ ඉතා දක්ෂ පැසිපන්දු හා ක්‍රිකට් ක්‍රීඩකයකු වු මා රග්බි මෙන්ම පාපන්දු ක්‍රීඩාවෙන් දිනාගත් සහතික රැසක් එම ගොනුවේ තිබුණි. එක් නිලධාරියකු ජ්‍යෙෂ්ඨ නිලධාරියා හට යෝජනා කළේ මා ඔවුන්ගේ ඒකකය වෙත බඳවා ගෙන ක්‍රීඩා කණ්ඩායම වෙත යොමු කිරීම ඉතා ප්‍රතිඵලදායී විය හැකි බවයි. ඔවුන් අතර පැවති අභ්‍යන්තර කෙටි සාකච්ඡාවක් අවසානයේදී මා හට දැනුම් දුන්නේ මාගේ අවසන් තිරණය යුද හමුදාව වෙත එක්වීම නම් සම්මුඛ පරීක්ෂණ මඩුල්ලේ අකැමත්තක් නොමැති බවත් මාගේ අධ්‍යාපන හා ක්‍රීඩා සුදුසුකම් මත අදාළ ස්ථාන වෙත යොමු කිරීමට හැකියාව ද ඇති බවයි. සතුටින් ඉපිලී ගිය මා ඔවුන්ට ස්තුති කර එතැනින් පිට වූයේ රටක් රාජ්‍යක් දිනාගත් අයුරිනි.

අද මෙන් නොව ඒ කාලයේ සම්මුඛ පරීක්ෂණය පවත්වා සමත්වීම හා ඉදිරි උපදෙස් ලබාදෙනුයේ තම පුද්ගලික ලිපිනය වෙත එවන ලිපියකිනි. ලිපිය ලැබෙනුයේ තැපල් මඟින් බැවින් මෙන්ම පොලිස් වාර්තා හා ප්‍රදේශයේ ප්‍රභුවරයන්ගේ රෙකමදාරු ලබා ගැනීම සඳහා දෙමාපිය ඥාති මිත්‍රාදි සහය ලබාගැනීම සඳහා මා යුද හමුදාවට බැඳීමට ගත් තිරණය ඔවුන් හට දැනුම්දීම ජීවිතයේ මා ලැබූ මහත්ම අභියෝගය විය. පළමුව ඔවුන් හට මා ගත් තීරණය අදහා ගැනීමට නොහැකිව සිටිමුත් දැඩි පැහැදිලි කිරීම්වලින් පසු මාගේ තීරණය ඔවුන් අවනත වූ බව පෙනීමට තිබිණි. එසේම, මා මාගේ ජීවිතය පිළිබඳව වැරදි තිරණයක් කිසිදා ගනු ඇතැයි ඔවුන්ගේ විශ්වාසයක් තිබුන බව පෙනීමට තිබිණි.

පාසැල් යාම නොකඩවා සිදුකළ ද දිනපතා ලැබෙන ලිපි පිළිබඳ නිරන්තර අවධානයෙන් පසුවීම පුරුද්දක් කරගතිමි. නොඉවසිලේනේ පසුවූ මාසයකට පමණ පසු මා වෛද්‍ය පරීක්ෂණයට භාජනය කිරිම සඳහා නැවතත් තිසාවැව කඳවුර වෙතම පැමිණෙන ලෙස දන්වා තිබුනි. වෛද්‍ය පරීක්ෂණය සඳහා සම්මුඛ පරීක්ෂණය දවසේ තරම් විශාල පිරිසක් පැමිණ නොසිටි අතර, සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් අයවලුන් පිරිසක් ද වූ බව දැනගත්තේ එදාය. කෙසේ වෙතත්, නව මිතුරන් හඳුනා ගැනීම ආරම්භ වෙමින් තිබුණි. වෛද්‍ය පරීක්ෂණය ද කිසිදා අමතක නොවන අත්දැකීමක් වූ අතර, විශාල ප්‍රමාණයක් වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වීම විශේෂ සිදුවීමක් බැව් සිහිපත් වේ. වෛද්‍ය පරීක්ෂණය අසමත් සහෘදයන් කඳුළු සලමින් සමුගත්තේ අප හටද වේදනාබර මතකයක් ඇති කරමින්ය. බඳවා ගැනීම් සඳහා දිනයක් දන්වා එවන ලෙස දැනුවත් කරමින් අප කඳවුරෙන් පිටත් කරවූයේ එදිනට රැගෙන ඒමට අවශ්‍ය බඩුබාහිරාදිය ලේඛණයක් ද සමගිනි.


මෙවර බඳවා ගැනීම සඳහා ලිපිය ලැබීමට එතරම් කාලයක් ගත නොවූ අතර ඉතා කෙටි දිනයක් දක්වා අවශ්‍ය සහතික බඩු බාහිරාදිය ද සමඟ පුහුණුව සඳහා වාර්තා කරන ලෙස දන්වන ලදී. කෙසේ වෙතත් පාසැලින් අස්වීම සහතිකය ලබාගැනීම සඳහා ගිය ගමන ඉතාමත් හැඟීම්බර එකක් වූයේ නොසිතූ ලෙසය. මා උත්සාහ කළේ හැකි තාක් මා හට වඩාත් හෘදයාංගම බැඳීම් ඇති ගුරු පියවරුන් හා මෑණිවරුන් හට මාගේ අස්වීම දැනුම්වත් නොකර ප්‍රධාන කාර්යාලය වෙතින් අස්වීම සහතිකය ලබාගෙන පාසැලෙන් පිටත්ව යාමය. නමුත්, ආරංචිය ලැබුන ගුරුභවතුන් සහෝදර සිසුන් උසස් අධ්‍යාපානය අත්නොහරින ලෙස කළ බලවත් ඉල්ලීම් ඉතා කාරුණිකව ප්‍රතික්ෂේප කළ මා මාගේ අරමුණේ තදින් එල්ඹ සිටියෙමි. අවසානයේ ගරු විදුහල්පති තුමා අස්වීම සහතිකය මා වෙත පිරිනමමින් මා ඔබ තෝරාගත් වෘත්තියට හා ඉදිරි අනාගතයට සුභපතනවා යනුවෙන් පැවසීමත් සමඟ දණහිස් බිම තබා ඔහු ඉදිරියේ වැද වැටුනේ නෙත් දෙකින් රුරා වැටුන කඳුළු සමගිනි. ඒ සමඟ මා තවදුරටත් පාසැල් සිසුවකු නොවන බවත් යළිත් කිසිඳු දිනක සුදු ඇඳුම ඇද මා පාසැල් නොයන බවට දැනුන හැඟීම හදවතේ ඊයම් බරුවක් සිරවුවාක් මෙන් වේදනා සහගත සිතුවිල්ලත් සමඟ පරිවර්තනය වූ වැස්සක් මෙන් කඳුළු ගලා ඒම වලක්වා ගැනීම ඉතා අපහසු කටයුත්තක් සේ දැනුනි. එදා සිට අද දක්වා අනන්ත රාත්‍රීන්වල දුටු සිහිනයන් හි සිත්තම් වූයේ මා නැවත පාසැල වෙත ගමන් කරන මිහිරි මතකයන්ය. නමුත්, අවදි වූ සැම විටම මා සිටිනුයේ පුවරසන්කුලම හෝ අච්චුවේලි ඉදිරි ආරක්ෂක වලල්ලේ බවත් එම මිහිරි අතිතය කිසිඳු දිනක යලි නොපැමිණෙන බව දැනුන වේදනාව අප්‍රමාණ විය.

තිසාවැව කඳවුරට පැමිණි අප ආධුනික සෙබළු 400ක් පමණ දින ගණනාවක් එම කඳවුරේ ගත කළේ කිසිඳු කාර්යයක් නොමැතිවය. අප පුහුණු මධ්‍යස්ථානවලට යැවීමේ යම් ප්‍රමාදයක් හැඟිනි. අඹේපුස්ස නුවරඑළිය වැනි ස්ථාන වෙත පිරිසක් රැගෙන ගිය අතර, අප දුම්රියෙන් කොළඹ කොටුව දක්වා ගමන් කර කිරුලපන කඳවුරේ දින කිපයක් ගත කර දුම්රියෙන් දියතලාව බලා පිටත් වූයේ ස්වේච්ඡා බළසේනා පුහුණු පාසැල වෙතයි. අප තිසාවැව කඳවුරේ


සිට දින ගණනාවක් විවිධ කඳවුරුවලට රැගෙන ගොස් සියලු පාලන කටයුතු සිදුකරනුයේ මා අදටත් නම නොදන්නා පාබල හමුදාවට අයත් ලාන්ස් කෝප්‍රල් නිලයේ අයෙකි.

අවසානයේ 1994 ජනවාරි මස අග දිනක දියතලාව දුම්රිය ස්ථානයෙන් බැසගත් අප තනි පෙලකින් එවකට අතිශය සුන්දර නගරයක් වූ දියතලාව නගරය මැදින් ස්වේච්ඡා පුහුණු පාසැල වෙත ඇතුළු විය. අනුරාධපුර මහජන පුස්තකාලයේ සිළුමිණ පුවත්පතේ දැන්වීමක් බැලීමෙන් සිදුවූ ජීවිත විපර්යාසය යම් සන්ධිස්ථානයකට ලඟාවූ බව මා හට හැඟුණි. ඒ බව හොඳින්ම අවබෝධ වූයේ පුහුණුව අවසාන කොට රිවිරැස මෙහෙයුමට යාපනය වෙත ගියපසු අච්චුවේලි ප්‍රදේශයේ අප ලැගුම්ගත් නිවෙස්වල අපට පෙර ලැගුම් ගෙන සිටි ජ්‍යෙෂ්ඨ සෙබළුන් කරුණාසේන දිවුල්ගනේ මහතාගේ ජනප්‍රිය ගියක් ඇසුරින් ලියාතිබු බංකර් කුරුටු ගී අතරේ තිබූ එදා සිළුමිණ නොබැලුවා නම් මෙදා වියෝවක් නෑ කවිය දුටුවිටය.

යුද හමුදා සේවය සඳහා මඟපෙන්වූ සිළුමිණ පුවත්පත කියවූ අනුරාධපුර මහජන පුස්තකාලය හා මාගේ බැඳීම අදටත් ඉතා හෘදයාංගම බව කිව යුතුය. මා ඒ අසලින් පා ගමනින් මාගේ යතුරුපැදියෙන් හෝ යාමේදී නිරායාසයෙන්ම එක් වරක් හෝ ඒ දෙස බැලෙනුයේ මා හට ඇති ආත්මීය බැඳීම නිසාමය. මක්සිම් ගෝර්කිගේ ජීවිත කතාවේ කොටසක් වන මගේ සරසවි කෘතියේ සඳහන් පරිදි ඔහු කසාන් නගරයට ගියේ එහි විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට වුවද ඔහුට සිදුවූයේ කසාන් නගරයේ හුදී මිනිසුන් අතර ජීවිත තක්සලාවේ කල් ගෙවීමටයි. ඔහුගේ ගුරුවරුන් වූයේ පොත්පත්ය. මා ද අනුරාධපුරය පුස්තකාලයට ඇතුළුවූයේ විශ්ව විද්‍යාලයට යාමට ඇවැසි දැනුම සාක්ෂාත් කර ගැනීමට වුවද පොත්පත්වලින් මඟ පෙන්වූයේ ජීවිත තක්සලාවේ අධ්‍යාපනය ලැබීමටයි. සාහිත්‍ය ඇසුරේ ජීවිතය ගෙවන අප නවීන ලෝකය විසින් භෞතිකව දියුණුව නවීනත්වය වශයෙන් හඳුන්වා ගන්නා තරඟකාරී ධාවනය දෙස බලනුයේ දැඩි උපේක්ෂා සහගතවය. දියුණුයේ සළුපිලි ඇද පැමිණෙන විවිධ සමාජ තරාතිරම්වල ලක්ව නව පරම්පරාව පත්ව ඇති ඉරණම කණගාටුදායකය. මිනිසුන් වන අප මෙලොවට පැමිණ ඇත්තේ අනෙකාගේ හැඟීම්වලට ගරු කරන සහකම්පනය සහිත මිනිසුන් වශයෙන් ජිවත්ව මියයාමට බව සියල්ලන් සිහිතබා ගත යුතුය.


- **මේජර් ධම්මික කාංචන**

**බළඇණි පුහුණු පාසල ගල්කුලම**




# හිමි අහිමි

"ඇ බං සමරෙ... උඹ මොකද දැන් රස්සාවෙන් අයින් වෙලා කරන්න හිතාගෙන ඉන්නේ...?" දකුණු අතේ රැඳි බූට් එක පිසදමමින් සිටි පියසේන තම අසල වූ ඇඳෙහි දිගා වී සිටි සමරසිංහගෙන් විමසීය.

"මට ජපන් යන්න පොටක් පෑදිලා තියෙන්නේ බැජියා..." සමරසිංහ තම ජංගම දුරකථනය ඔබමින් හඩ අවදි කළේය.

"අනේ බං... ඔය මනස්ගාත හිතින් අයින් කරල ඉතුරු අවුරුදු නවයත් කට්ට කාගෙන මේකෙම හිටපන්... පියසේන පවසන්නට විය.

"අනේ මගෙන් මුකුත් නාහ හිටපන් පියසේන... උඹ හිතන්නේ හමුදාව තමයි උඹේ මුළු ලෝකෙම කියලා... ඊට වඩා ගොඩක් දේවල් මේ රස්සාවෙන් පිට තියෙනවා..." සමරසිංහ තියුණු ස්වරයෙන් පැවසීය.

"ඔව් ඔව්... අනේ යකෝ... හැම මාසෙම උඹේ බැංකු පොතට ලොකු ගාණක් වැටෙන්නෙ හමුදාවෙ ඉන්න නිසා කියන එක අමතක කරන්න එපා... අනික ගිය මාසෙ උඹලගෙ අම්මා ලෙඩ වෙලා මැරෙන්න වැටිලා හිටියා... හමුදාවට පින්සිද්ධ වෙන්න නාරාහේන්පිට ආමි හොස්පිටල් එකෙන් බෙහෙත් ගත්තා... දැන් උඹ අලුතින් වීල් එකක් ගත්තෙත් ආමි එකට පින්සිද්ධ වෙන්නනේ..." පියසේන උපහාසාත්මක ස්වරයෙන් සමරසිංහ වෙත පිළිතුරු දුන්නේය.

එක්වරම සමරසිංහගේ මුහුණු රතු විය. ඔහු පසුගිය මාස කිහිපය තුළ මුහුණ දෙන්නට සිදුවූ සිදුවීම් සමුදාය

චිත්‍රපටයක් මෙන් පෙළින් පෙළ දිස්වන්නට විය.

"අනේ උඹේ බණවලින් මට වැඩක් නෑ බං... මං දැන් ගත්ත තීරණේ වෙනස් කරන්න කිසි කෙනෙක්ට බෑ..." සමරසිංහ පැවසීය.

"උඹට කියන කට හොඳයි ගලක අතුල්ල ගන්නවා... උඹේ ඔය වැඩ නිසා අවසානේ දුක් විඳින්න වෙන්නේ අර ගෑණිටයි, කෙල්ලො දෙන්නටයි තමයි... මං යනවා ඔෆිස් එකට..." පියසේන සමරසිංහගෙන් සමුගත්තේය.

කෝප්‍රල් පියසේන සහ කෝප්‍රල් සමරසිංහ 2010 වසරේ යුද හමුදාවට බැඳුණු තරුණයින් දෙපළකි. මොවුන්ගේ ගම් පළාත් පිළිවෙලින් අනුරාධපුර සහ රඹුක්කන වෙති. ආධුනික පුහුණු පාඨමාලාවෙන් පසු කෝප්‍රල් පියසේන ලිපිකරු වෘත්තිය කෙරෙහි දැඩි උනන්දුවක් සහ දක්ෂතා පෙන්නූ චරිතයක් බැවින් එම වෘත්තියේ නියැලෙමින් කොළඹ අවට කඳවුරු රැසක රාජකාරි කරන්නට අවස්ථාව හිමිවිය. ඒ අතර දිගු කලක් යාපනය සහ වව්නියාව ප්‍රදේශයේ රාජකාරි නිතරව සිටි කෝප්‍රල් සමරසිංහ හට හදිසියේම මරදානේ පිහිටි කඳවුරක් වෙත ස්ථාන මාරුවීමක් ලැබුණේ 2023 වසරේදීය. එවකට එම කඳවුරේ මූලස්ථාන කාර්යාලයේ රාජකාරි කරමින් සිටි ඔහුගේ මිතුරා වූ කෝප්‍රල් පියසේන හමුවූයේ අහම්බෙනි. එතැන් පටන් නැවතත් ඔවුන්ගේ ආධුනික පුහුණු පාඨමාලා කාලසීමාව පුරා පැවති සහෝදර බැඳීම කෙමෙන් කෙමෙන් දළුලන්නට විය. අවුරුදු දහයක් වැනි කාලයක් දුරස් වූ ඔවුන් දෙදෙනා හට නැවතත් එකම කඳවුරක එකට සේවය කිරීමට ලැබීම පිළිබඳ මහත් සේ සතුටට පත්වූහ.

කෝප්‍රල් පියසේන ආධුනික පුහුණු පාඨමාලා කාලසීමාවේ පටන් විවිධ දක්ෂතා දැක්වූ චරිතයකි. එසේම ඔහු ස්වඋත්සාහයෙන් ජීවිතය ගොඩනගාගත් තරුණයෙකි. පියසේනගේ පියා ජීවිතයෙන් සමුගත්තේ ඔහුට වයස අවුරුදු 18 පිරෙන සමයේදීය. ඔහු පවුලේ වැඩිමලාය. පියසේනට තවත් නැගණියක් සහ බාල සහෝදරයෙක් සිටිති. පියාගේ වියෝවෙන් පසු පියසේන තම පවුලේ බර කරට ගත්තේ ඔහුගේ අඩුව පිරවීමේ අරමුණෙනි. කෝප්‍රල් පියසේන කඳවුර තුළද කැපීපෙනෙන මෙන්ම ආදර්ශමත් චරිතයකි. ඊට අමතරව ඔහු විසින් සුළු ස්වයං රැකියා කිහිපයක්ද මේ වනවිට තම බිරිඳත් සමඟ ආරම්භ කොට ඇත.

නමුත් කෝප්‍රල් සමරසිංහ යනු ඊට හාත්පසින්ම වෙනස් චරිතයකි. ඔහු ආධුනික පුහුණු පාඨමාලා කාලසීමාවේ පටන්ම ඉතා අලස පුද්ගලයෙකි. ඔහුගේ එකම අරමුණ වූයේ කෙසේ හෝ සේවා කාලය ගෙවා දැමීමටය. ඔහුට යමක් ඉගෙන ගැනීමට ආසාවක් නොමැත. හෙතෙම විවාහකයෙකි. ඔහුට නිවුන් ගැහැණු දරුවන් දෙදෙනෙක් සිටිති.

"කෝප්‍රල්... කෝප්‍රල්ට CO සර් කතාකළා..." කොහෝදෝ සිට කලබලයෙන් දුවගෙන ආ ආධුනික සෙබළෙක් හට නිවාසය තුළ නිදාගෙන සිටි සමරසිංහට දැන්විය.

එකවරම සමරසිංහගේ මතකයට නැගුනේ යුද හමුදාවෙන් අස්වීම වෙනුවෙන් අණදෙන නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලැබූ ලිපිගොණු කිහිපය පිළිබඳවය. වහා නිල ඇඳුම ඇඟලාගත් සමරසිංහ මූලස්ථාන කාර්යාලයට පිටත්වූයේය.

"එක්ස් කියුස් මී සර්.... ගුඩ් ඊව්නින් සර්" කෝප්‍රල් සමරසිංහ අණදෙන නිලධාරී දෙස බලමින් පැවසුවේය. "ආ... සමරෙ ඇතුළට එන්න". "මං මේ සමරසිංහගේ ඉල්ලා අස්වීමේ ලිඛිත ප්‍රකාශනය බලන ගමන් හිටියේ... තමුන්ගෙ සේවා කාලය කීයද?"

"අවුරුදු 15යි සර්..." කෝප්‍රල් සමරසිංහ පිළිතුරු දුන්නේය.

"බලනවා... තව පොඩි කාලයයිනෙ තමුන්ට පැන්ෂන් යන්න තියෙන්නේ. ඇයි මේ එකපාරම අස්වෙන්න හදන්නේ? ගෙදර මොකක්හරි ප්‍රශ්නයක්ද?" අණදෙන නිලධාරී අසන්නට විය.

"ගෙදර කිසිම ප්‍රශ්නයක් නෑ සර්... මට ඒජන්සියක් හම්බවුණා ජපන් යන්න පුළුවන්. කුරුණෑගල ටවුමෙ තියෙන්නෙ සර්. එහෙන් කිව්වා ජොබ් වේකන්සි ගොඩක් තියෙනව කියල. දැන් ගන්න පඩිය අරන් ජීවත් වෙන්න අමාරුයි සර්. ඇබ්සන් වෙලා ගිහින් දුක් විඳින්න බැරි නිසයි අස්වෙලාම ඒ ජොබ් එකට යන්න හදන්නේ සර්"

"හරි... දැන් තමුන් අස්වෙලා ගියා කියමුකො. ඉස්සෙල්ලම ඔය ඒජන්සි එකෙන් මීට කලින් ජපන් ගිය මිනිස්සු ඉන්නවද කියල තමුන් හොයල බැලුවද? අනික රට යන්න සල්ලි කොහෙන්ද හොයාගන්නෙ?" අණදෙන නිලධාරී කෝප්‍රල් සමරසිංහගෙන් ප්‍රශ්න කරන්නට විය.

"මං ඒ ගැන නම් හොයල බැලුවෙ නෑ සර්. ඒගොල්ලන්ගෙ ඔෆිස් එකේ බෝඩ් එකෙත් ගහල තිබ්බා. රජයේ පිළිගත්ත ආයතනයක් කියලා. ඊට අමතරව මගෙ අක්කරයක කුඹුරු කෑල්ලක් තියෙනවා සර්. ඒක විකුණන්න තමයි හිතාගෙන ඉන්නෙ. තව වයිෆ්ගේ රත්තරන් බඩු වගයකුත් තියෙනවා. ඒ ටිකත් බැංකුවෙ තියලා ණයක් ගන්න පුළුවන්. වීල් එකට ෆිනෑන්ස් එකක් දාලා තියෙන නිසා එකෙන් අතට පොඩි ණයක් ගන්න පුළුවන්. මං වාහනෙත් විකුණන්න ඉන්නේ සර්. ඒජන්සියෙ සර්ල කිව්වා ජපන් ගිහින් මාසෙන් ලොකු ණයක් හොයන්න පුළුවන් කියලා"

"ඉතිං බලනවා සමරේ... තමුසෙ ඒ ඒජන්සිකාරයො හරියට කව්ද කියලවත් දන්නෙ නැනේ. රට ගිය උදවිය ඉන්නවද කියන එක හොයල බලලත් නෑ. අනික බෝඩ් කෑලිවල මොනව ගහගන්න බැරි ද අද කාලේ. තමුන් හදන්නෙ පවුලම අමාරුවෙ දාලා රට යන්න. දැන් තමුන් අවුරුදු පහළොවක් ආමි එකේ හිටිය කියලා මොකක්ද වෙච්ච වැරැද්ද? තමුන්ට මේ වගේ පඩියක් ගන්න පුළුවන් ද එළියෙ ජොබ් එකක් කරලා" අණදෙන නිලධාරීගේ ප්‍රශ්න හමුවේ කෝප්‍රල් සමරසිංහ නිරුත්තර විය.

"බලනවා අර කෝප්‍රල් පියසේන දිහා. ඒ මනුස්සයා කොච්චර හොඳට තමන්ගෙ පඩිය සැලසුම් කරගෙන වැඩ කරනවද? මේ ළඟදි මිනිහ පොඩි අමතර ආදායම් ක්‍රමේකුත් පටන් ගත්තා. ඒ මනුස්සයට කියල හමුදාවෙන් විශේෂ පඩියක් හම්බෙන්නෙ නැනෙ. දැන් සමරසිංහගෙ අන්තිම තීරණේ හමුදාවෙන් අස්වෙන එකද?" අණදෙන නිලධාරී සමරසිංහගෙන් අසන්නට විය.

"ඔ...ඔව් සර්..." කෝප්‍රල් සමරසිංහ සෙමෙන් මුමුණන්නට විය.

තමුසෙට දෙවියෝ ඔළුවක් දීල තිබ්බට මොලයක් දීල නෑ. තමුන්ට කවදාහරි තෙරෙයි මේ ගත්ත තීරණේ කොච්චර මෝඩ ද කියන එක" යැයි පවසමින් අණදෙන නිලධාරී කෝප්‍රල් සමරසිංහ විසින් ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශනයේ Appd යැයි සටහන් කරමින් සංවාදය අවසන් කරන්නට විය.

එදින සිකුරාදා දිනයක් වූ බැවින් කෝප්‍රල් සමරසිංහ තම නිවස බලා පිටත්වීමට සූදානම් විය. තමන් තව

නොබෝ දිනකින් යුද්ධ හමුදාවට සමුදීමට සූදානම් වන නිසා කඳවුරෙහි තම පුද්ගලික බඩු භාහිරාදිය එකින් එක අසුරන්නට විය. ට්‍රන්කා පෙට්ටියටත්, විශාල ගමන් මල්ලකටත් බඩු පුරවාගත් කෝප්‍රල් සමරසිංහ ඇඳිරි වැටෙන මොහොතේ නිවසට සේන්දු විය. තම පියා එනු දුටු දියණියන් දෙදෙනා ප්‍රීතියෙන් කෑ ගසමින් සමරසිංහ දෙසට දුව එන්නට විය. දියණියන් දෙදෙනාත් සමඟ මොහොතක් සතුටු සංවාදයේ යෙදුණු සමරසිංහ තම බිරිඳ වූ දීපිකා විසින් රැගෙන ආ තේ කෝප්පය තොලගාමින් සංවාදය අරඹන්නට විය.

"දීපා... මං තව සතියකින් නිදහස් පුරවැසියෙක්" සමරසිංහ ප්‍රීතියෙන් පවසන්නට විය.

"හමුදාවෙන් අස්වෙන එක ඔයාට විනෝදයක් කියල හිතුවට මම නම් තාමත් කැමති නෑ ඔයා ගත්ත ඒ තීරණේට" දීපිකා පැවසීය.

"ඇයි දීපා එහෙම කියන්නේ. ඔයා කැමති නැද්ද අපේ කෙල්ලෝ දෙන්නත් එක්ක සැපවත් ජීවිතයක් ගතකරන්න" සමරසිංහ බිරිඳගෙන් අසන්නට විය.

"ඒ දේවල් කරගන්න මාත් කැමතියි. හැබැයි හමුදාවෙන් අයින් වෙලා නෙවෙයි. ඔය ඒජන්සිකාරයො ඇත්තක්ද බොරුවක්ද කරන්නෙ කියලා අපි කොහොමද හරියට දන්නේ..." දීපා වේදනාවෙන් පවසන්නට වූවාය.

"පිස්සුද දීපා... ඒ මිනිස්සු හරි හොඳයි. අනික් අපි එහෙට යනකම්ම අපි ගැන බලනව කිව්වා" කෝප්පයේ ඉතිරි තේ බිංදුවත් උගුරට හලාගනිමින් සමරසිංහ උජාරුවෙන් හඬනගන්නට විය.

"ඕනි ඉටි ගෙඩියක් කරගන්න. ඔයා කවදාවත් ඉතිං මං කියපු දෙයක් අහපු කෙනෙක් නෙවෙයිනෙ" හිස් වූ තේ කොප්පයත් රැගෙන කෝපයෙන් දීපා මුළුතැන්ගෙය දෙසට ඇදෙන්නට වූවාය.

කෙමෙන් කෙමෙන් දින ගෙවෙන්නට විය. සමරසිංහගේ අස්වීමේ ඉදිරි කටයුතු ටිකෙන් ටික අවසන් විය. අවසානයේ ඔහු යුද්ධ හමුදාවට ආයුබෝවන් කීවේය. මීට සතියකට පෙර සමරසිංහ විසින් ඒජන්සි ආයතනය වෙත රුපියල් ලක්ෂ 15ක මුදලක් ගෙවන ලද්දේ කුඹුර කැල්ලත්, බිරිඳගේ රත්තරන් බඩුවලිනුත්, ත්‍රීරෝද රථය විකිණීමෙන් ලබාගත් මුදලිනි. ඒ අනුව විවිධ පෙදෙස්වලින් පැමිණි පුද්ලගයින් කිහිප දෙනෙකු ද සමරසිංහ සමඟ එලෙස මුදල් තැන්පත් කරන ලද්දේ ජපන් යෑමේ සිහිනය සඵල කරගැනීමේ අටියෙනි.

මෙලෙස දෙසතියක පමණ ඇවෑමෙන් කෝප්‍රල් සමරසිංහ දන්වා තිබූ පරිදි ඒජන්සිය වෙත නිකමට මෙන් දුරකථන ඇමතුමක් ගත්තේ රට යෑමේ ඉදිරි කටයුතු පිළිබඳ වත්මන් තත්ත්වය විමසා බැලීමේ අරමුණිනි. නමුත් එම දුරකථන අංකය භාවිතයේ නොමැති බවට සඳහන් විය. සමරසිංහ කිහිප විටක් ඇමතුම් ගත්තද ලැබුණු එකම පිළිතුර වූයේ එය පමණි. සමරසිංහගේ සිතෙහි තරමක සැකයක් සේම බියක් ඇතිවිය.

"මොකෝ මූණ එල්ලගෙන" කොහේදෝ සිට පැමිණි දීපා සමරසිංහගෙන් ප්‍රශ්න කරන්නට විය.

"නෑ මේ... අර ඒජන්සියට කෝල් එකක් ගත්ත මගේ වැඩේ මොකද බලන්න. ඒ නම්බර් එක භාවිතයේ නෑ කියනවනෙ. මං ගිය සතියෙත් කතා කළා ඒ නම්බර් එකට. දැන් වැඩ නෑ"

"මං ඔයාට කට කැඩෙනකං කිව්වා නේද ඔය ඒජන්සිකාරයො කියන්නෙ බොරු කියලා. උන්ගෙ කීම අහල, උන්ට සල්ලිත් පුදලා රැවටිලා ඔයා ගහෙන් ගෙඩි එන්නා වගේ රස්සාවෙන් අස්වුනා"

"හරි හරි... ඔයා කලබල නොවී ඉන්නකො ටිකක්. සිග්නල් අවුලක්ද දන්නෙත් නැනෙ" සමරසිංහ බිරිඳට පැවසීය.

"තවත් උන්ව විශ්වාස කරනවනෙ මේ මනුස්සයා. ඔය නිකමටවත් තාත්ත කෙනෙක් විදිහට හිතල වැඩ කරන්නෙ කවද්ද?" දීපා හැඬුම්බර ස්වරයෙන් සමරසිංහ අමතන්නට විය. මොහොතක් තම සැමියා දෙස එක එල්ලේ බලාසිටි දීපා කඳුළු පිරි දෙනෙතින් ගෙතුලට ගියාය.

"හරි හරි මං හෙට උදේ එතනට ගිහින් බලන්නම්කො. ඉවරයිනෙ වැඩේ" සමරසිංහ පැවසීය.

පසුදින උදෑසන නිවසින් පිටත් වූ සමරසිංහ රඹුක්කන නගරයේ පිහිටි ඒජන්සි ආයතනය බලා පිටත් විය. ඔහු එම ආයතනයට ළඟා වනවිට එහි කිසියම් කලබලකාරී හැඩයක් ගෙන තිබුණා. මිනිසුන් කිහිපදෙනෙකු කෑ ගසමින් හැසිරෙන්නට වූ අතර ඒ දෙස අසල වූ ජනතාව වටවී බලා සිටින්නට වූහ. සමරසිංහ ඒ අසලට ගොස් එක් පුද්ගලයෙකු අමතන්නට විය.

"මල්ලී... මොකද මේ කේස් එක?"

"ජපන් යවනව කියල සෙට් එකක් මිනිස්සුන්ගෙ සල්ලිත් අරන් රට පැනල. ඔය ඉන්නෙ සල්ලි දීපු සෙට් එක... උන්ගෙ ඔෆිස් එකත් වහල. නම්බර් එකක්වත් වැඩ නෑ. මරු බඩු ටික" තරුණයා පැවසීය.

"මොකක්?" සමරසිංහගේ සිරුර එක්වරම සීතල වී ගියේය. ඔහු ද මීට දෙසතියකට පෙර තැන්පත් කළ ලක්ෂ 15ක මුදල සිහිවිය. ඔහුගේ ඉදිරි අනාගතය තුළ විඳීමට සිදුවන දුක් ගැහැට එක පෙළට දිස්වන්නට විය.

සමරසිංහගේ වසන්ත සමය කෙමෙන් කෙමෙන් ඈතට ඇදී යන්නට පටන් ගත්තේ ඔහුටවත් නොදැනීමය. තමන් හමුදාවෙන් ඉවත්වී දැනට මාස තුනක් පමණ ගතවී ඇති බව ඔහුගේ මතකයට නැඟුනේ නිරායාසයෙනි. ඒ කාලය තුළ ඔහුට ජපන් යෑම සඳහා ලබාදුන් මුදලවත්, ඔවුන් ගැන හොඩුවාවක්වත් දැනගැනීමට නොහැකි විය. හමුදාවෙන් ලැබූ වැටුපෙන් දීපා විසින් ඉතිරි කළ ගත් යම්කිසි මුදලකින් ගෙවීගිය මාසය තුළ අඟහිඟකම් මකාගන්නට හැකිවිය.

කාලය දින සති මාස අවුරුදු වශයෙන් ගෙවෙන්නට විය. මේ වනවිට සමරසිංහ යුද හමුදාවෙන් ඉවත්වී අවුරුදු දහයකට පමණ ආසන්න කාලයක් ගතවී ඇත. මේ ගෙවුණු අවුරුදු දහයට සමරසිංහ විසින් විවිධ රැකියාවන්හි නිරතවිය. ඒ රැකියාවන් අතරට ගමෙන් පිටත ප්‍රදේශවලට ගොස් අත්වැඩ දීම සහ කුලී වැඩ කිරීම ද අයත්විය. දීපාද තම සැමියාට වාරුවක් වීමේ අරමුණින් යුතුව ඇඟලුම් කර්මාන්ත ශාලාවක රැකියාවක නියුතු වූවාය. තමන් මීට පෙර යුද හමුදාවේ ගතකළ සුඛෝපභෝගී ජීවිතය පිළිබඳ මෙනෙහි කරමින් සමරසිංහ නිතර නිතර දුක්වන්නට විය. "අපරාදෙ... මං කරගත්ත මෝඩකමක්" යැයි ඔහුට තමන්ටම කියාගත්තේය. ඊට අමතරව ඔහු දෛනික පුවත්පත්වල පළවූ රැකියා ඇබෑර්තු පිටුව පිරිකසන්නට වූයේ ස්ථිර රැකියාවක්

සොයාගැනීමේ බලාපොරොත්තුවෙනි. එක් සවසක තේ කෝප්පයක් තොලගාමින් පුවත්පතෙහි රැකියා ඇබෑර්තු පිටුව බලමින් සිටි සමරසිංහ හඬ අවධි කළේය.

"දීපා... මේ බලන්න ජොබ් වේකන්සියක් තියෙනවා"

"මොනවද විස්තර දාල තියෙන්නේ?" ඇඳුමක් මසමින් සිටි දීපා තම සැමියාගෙන් ප්‍රශ්න කරන්නට විය.

"අහගන්නකො... දේශීය විදේශීය වෙළඳපල ජයගත් සමාගමක කෑගල්ල ශාඛාවේ පුරප්පාඩු රැසක් ඔබ වෙනුවෙන්. ආකර්ෂණීය වැටුප්, අගනා රැකියා පුහුණුවක්, නිරන්තර දිරිගැන්වීම්"

"දීපා අපි ට්‍රයි කරලා බලමුද මේකට" සමරසිංහ තම බිරිඳගෙන් අසන්නට විය.

"ඔව්... ඔව්... නැත්තං මට හැමදාම මැෂින් පාගල මැරෙන්න බැහැ. කෙල්ලො දෙන්නගෙ ටියුෂන්වලටම මගෙ පඩිය ඉවරයි" දීපා හඬ අවදි කළේය.

"හෙට මට වෙන වැඩක් නැති එකේ මෙතනට ගිහින් බලනවා" සමරසිංහ තම බිරිඳ හට පැවසීය.

පසුදින උදයේම සමරසිංහ කෑගල්ල නගරය බලා පිටත් විය. ඔහු ඒකායන අරමුණ වූයේ කෙසේ හෝ රැකියාවක් සොයාගැනීමය. උදෑසන 10 පමණ වනවිට කෑගල්ල නගරය වෙත ළඟා වූ සමරසිංහ පුවත්පතේ සඳහන් ලිපිනය සොයා පදික වේදිකාවේ පිය නගන්නට විය. ත්‍රීරෝද රථ රියදුරෙක්ගෙන් පාර අසාගත් සමරසිංහ නගරය මධ්‍යයේ වූ තට්ටු දෙකකින් සමන්විත ගොඩනැගිල්ලක ඇතුළුවිය. එම ගොඩනැගිල්ලෙහි Dinushika & Sons (Pvt) Ltd නමින් ලොකු අකුරින් සඳහන් කොට තිබුණි. ඔහු සෙමෙන් සෙමෙන් පිළිගැනීමේ නිලධාරිනිය දෙසට සේන්දු විය.

"ගුඩ් මෝර්නින් සර්... සර්ට කාවද හම්බෙන්න ඕනි" පිළිගැනැනීමේ නිලධාරිනිය ලෙස පෙනීසිටි තරුණිය හඬ අවදි කළේය.

"ගුඩ් මොර්නින් මිස්... මං මිස්ලගෙ කම්පැනි එකෙන් ජොබ් වේකන්සි වගයක් දාලා තියෙනව දැක්ක පත්තරේ. ඒ සම්බන්ධව විස්තර දැනගන්න ආවේ" සමරසිංහ පැවසීය.

"අපේ සිකුරුටි වේකන්සි දෙකක් තිබ්බ සර්. එක්කෙනක් කලින් ආවා. එයාව අපි ගත්තා. අනිත් වේකන්සිය ෆිල් වෙලාද කියල පොඩ්ඩක් ඔෆිස් එකෙන් අහන්න සර්. සර් චුට්ටක් ඔතනින් වාඩිවෙලා ඉන්න. මං බලන්නම්" යැයි කියමින් තරුණිය දුරකථය අතට ගත්තේය.

අසල අසුනක හිඳගත් සමරසිංහ තමන්ගේ වාරය පැමිණෙන තෙක් බලා හිඳින්නට විය. පිළිගැනීමේ නිලධාරිනිය දුරකථනයෙන් යම්කිසි අයෙකු සමඟ කතබහක නිරතවන අයුරු ඔහුට පෙණුනි.

"සර්..." එක්වරම පිළිගැනීමේ නිලධාරිනිය හඬ අවදි කළේය. සමරසිංහ හනික නැගිටිමින් ඇය වෙත ගියේය.

"මං ඔෆිස් එකට කතාකළා. සිකුරුටි ජොබ් එකේ තව වේකන්සියක් තියෙනවා. අපේ කම්පැණි එකේ සාමාන්‍යයෙන් ඉන්ටවිව් එක කරන්නේ බොස් තමයි. අද බොස් කෑගල්ල බ්‍රාන්ච් එකට එන දවස. සර්ට පුළුවන් ඉන්ටර්විව් එකට ඉඳල ජොබ් එක හරි ගියොත් හෙට ඉඳන් වැඩට එන්න. බොස් තව ටිකකින් ඔෆිස් එකට එනවා සර් පොඩ්ඩක් ඔහොම ඉඳගෙන ඉන්න" ඇය සමරසිංහ වෙත පැවසීය.

නැවතත් සිය අසුනට වී තමන්ගේ වාරය පැමිණෙන තුරු බලා සිටියේය. එක්වරම කාර්යාලය ඉදිරිපිට ලෑන්ඩ් කෲසර් වර්ගයේ කළු පැහැති මෝටර් රථයක් නැවැත්වීය. කළු කලිසමක් සහ සුදු අත් දිග කමිසයක් හැඳ ටයි පටියකින් සැරසුනු අයෙකු මෝටර් රථය තුළින් බැසගත් අතර, ඔහු අතෙහි ෆයිල් ගොනු කිහිපයක් ද විය. ඔහු වයස අවුරුදු 40කට ආසන්න පුද්ගලයෙකු බව සමරසිංහට සිතිණ. ඔහු මීට පෙර දැක ඇති හුරු පුරුදු බවක් දැනුණි. නමුත් සමරසිංහට ඔහුගේ මුහුණු හරි හැටි නොපෙණුනි. දොරටුව අසලින් උඩට දිවගිය තරප්පු පෙළ නැගතත් ඔහු නොපෙනී ගියේය.

සමරසිංහ එක්වරම පිළිගැනීමේ නිලධාරිනිය දෙසට හැරුණි. ඇය කඩිමුඩියේ දුරකථනය අතට ගනිමින් යම් අයෙකු අමතන්නට විය.

"සර්... අපේ බොස් ආවා. සර්ට උඩට කතා කළා. ඔය පේන පඩිපෙලෙන් උඩට ගිහින් වමට හැරුණහම කෙලිම්ම යන්න. එතන ඔෆිස් එකේ බොස් ඉන්නවා" පිළිගැනීමේ නිලධාරිනිය සමරසිංහ හට පැවසීය.

වහා නැගිටගත් සමරසිංහ තරප්පු පෙළ නැඟ ආයතන ප්‍රධානියාගේ කාර්යාලය පිරික්සන්නට විය. එහි දෙපස තවත් කාර්යාල කිහිපයක් විය. කාර්යාල සියල්ල පසුකරමින් පැමිණි සමරසිංහ අවසානයේ තරමක් විශාල කාර්යාලය අසල නතරවන්නට විය. එම කාර්යාලයෙහි Marketing Director (අලෙවි කළමනාකාර අධ්‍යක්ෂක) යනුවෙන් දොරෙහි නාම පුවරුවක සටහන් කර තිබිණ. දොර අතරින් කාර්යාලය ඇතුළත නිරීක්ෂණය කළ සමරසිංහ හට තමුන් මීට ප්‍රථම පහළ දොරටුව අසල මෝටර් රථයෙන් බැසගත් රුව දුටුවේය. ඔහු කාර්යාලය මැද පිහිටි විශාල මේසයක් අසල පුටුවක හිඳගෙන ලිපිගොනුවක් නිරීක්ෂණය කරමින් සිටින අයුරු සමරසිංහ හට දැකගන්නට හැකිවිය. සමරසිංහ සෙමෙන් දොරට තට්ටු කළේය. කාර්යාලය තුළ සිටි අධ්‍යක්ෂක තුමන් ලිපිගොනුව දෙසට නෙත් යොමාගෙන සමරසිංහ හට ඇතුළට එන ලෙස අතින් සංඥා කළේය.

"එක්ස් කියුස් මී සර්... ගුඩ් මොර්නින් සර්" සමරසිංහ හඬ අවදි කළේය.

"ගුඩ් මොර්නින්..." එක්වරම අධ්‍යක්ෂක තුමන් සමරසිංහ දෙස නෙත් යොමු කළේය. සමරසිංහ හට එක්වරම ඇස් අදහාගත නොහැකි විය. අවුරුදු ගණන් තම මවගෙන් වෙන් වූ දරුවෙකු තම මව පළමු වරට දකින්නාක් මෙන් සමරසිංහ හැසිරෙන්නට විය.

"සමරෙ උඹ..." එක්වරම අධ්‍යක්ෂක තුමන් සමරසිංහ අමතන්නට විය. ආධුනික පුහුණු පාඨමාලා මිතුරා වූ කෝප්‍රල් පියසේන තමන් ඉදිරියේ පෙනීසිටීම සමරසිංහ හට අදහාගත නොහැකි විය. පියසේන දුටු සමරසිංහගේ ඇසෙන් මතු වූ කඳුළු බිංදු අත රැඳි ෆයිල් කවරය මතට වැටුණේ ඔහුටත් නොදැනීමය.



**කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම්**

11 ඉසේරෙ
ජනමාධ්‍ය හා මව්මෙ අම






## ආයාචනයක්...

මේ දෙරණේ මේ මිහිකත රකින්නට
කළ කැපකිරීම් අපමණයි එදා විරු කැළ
එවකට ඒ මතකයන්
විටෙන් විට නැගෙයි හදවතට
ජ්‍යෙෂ්ඨත්වයට ගරුකරන
නියම ජාතිමාමකයකු ලෙසට
උපන් බිම රකින්නට ආවේ මා රණබිමට
ලබාගත් දැනුම අපමණයි
රණබිමේ විරුවා ලඟ
ඉතිං ඒ පන්නරය තාම ඇත අපගේ මතකවල
එදා මෙදාතුර කළ කැපකිරීම්වල වටිනාකම
කාලයක් සමඟ වියැකිලා දෝ
හැඟෙයි විටක මට
එපා කිසිදිනෙක නිගරු කරලන්න අභිමානයට
රැකදෙන්න නිරතුරුවම මව්බිම
එයයි ආයාචනය වත්මනට
දිරි දෙන්න රණවිරුවනට
එවිට එයි ඔබට සිත් සවිය
ආවර්ජනය කර එදා විරු කැළගේ
අතීත මතකයන් සබඳ
ඒ තුළින් වැජඹෙන්න එයයි මාගේ ප්‍රාර්ථනය

බනි 1 කේඑම්එස්කේ කරුණාරත්න යූඑස්පී
1 කාඉරෙ ශ්‍රීලංඉ



## මුලකුර...

ඉගිළෙන්නට අත්තටු නොමැති වුවත්
සුළඟ දෙයි ඇති හැකි බලය
රුවල් ඔරුවක ගමන් මඟකට
මංජුසාවක් තුළ සැඟවුණ
ධූමකේතුවක් ලෙසින් ඇවිත්
සංසාරයේ කෙදිනක හෝ
කල්‍යාණ මිතුරෙකි මේ පද පෙලෙහි මුලකුරු

කෝප්‍රල් දුස්මන්ත එස්ඒඩීපී
6 ගැහේබ

## අභිමානවත් විරුවා...

විඩාබර මද්දහනේ
දෙතොල ඇත වියැලී
සා පිපාසාවෙන්
උසුලනු බැරි බරක්
කරපින්නාගෙන
කටු කොහොලින් පිරි
යනෙනා මේ දුර්ගයේ
මතු යම් දිනෙක
විරුවන්ගේ දා බිඳු මතින්
ඇතිරෙනු ඇත සේද පලස්
එදවස නොව වැඩි ඈතක
වසන්තයේ මල් පීදී
සුවඳ කරයි ඒ මාවත්
එදාට ඒ විරුවානන්
සිනාපායි අභිමානෙන්

ගංගා නිරෝශනී
මනෝවිද්‍යා උපදේශිකා

## ජීවිතය...

සඳ රේඛා මැකී ගියා
නෙළුම් මලේ සුවඳ නැහැ
කඳුළු ගඟේ පාවීලා
දැන් මට මම නැති පාටයි
සිහිනයකත් තනිකමක්
හිනාවකත් වේදනාවක්
ජීවිතයම අඳුරගෙන
අතීතයක් නැති පාටයි
අඳුරු වළාවක් සේ
මහ පොළොවට වැටෙන තුරා
තනිකමින් පාවීලා
දැන් මට මම නැති පාටයි

කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ
12 ගැහේබ

## පා ගමනක අවසානයේ සටහන් වූ සතුටු කඳුළු...

තිබුනම වටිනවා හදවත්වල
මනුස්සකමක්
ඉතිරූ......
වටිනවා තවකෙකුට අත දෙන
ගතිය හැම හදවතකම
පැතිරූ.....
දැකල තියනවද මීට කලිං  මේ
ලෝකේ කොහේ හරි
කවුරූ.....
ඇස් දෙකක් නැති මනුස්සයෙකුගෙන්
වෑහෙන හැටි පහලට සතුටු
කඳුලූ.......

කපිතාන් බුද්ධික ආරච්චිගේ



## ජීවිතේ නම් නෑ සමාවක්...

සඳට කවි ලියන කවියෝ හැමටම
කවි ලියන්නට සඳට සිතුනොත්
අහසටත් නෑ සඳේ අගයක්
කවියටත් නෑ සිනිඳු තනුවක්

මල් රොන් සොයා යන බඹරු හැමටම
රොන් උරන්නට ඉඩක් ලැබුනොත්
නටුවටත් නෑ මලේ අගයක්
බඹරටත් නෑ මිහිරි රසයක්

වචන මදුවිත පොවා සිතට රිංගන
සලෙලුන්ගේ හැටි නොදැන
සිත් කවුලුවේ දොරක් ඇරුනොත්
මල්සරාගෙත් නෑලූ වරදක්
ජිවිතේ නම් නෑ සමාවක්

මේජර් එම්ඊඑල් ගුණවර්ධන
4 ශ්‍රීලංඉ



## පුංචි ආදරය...

ලැබූ නොලැබූ
ඔබෙන් ලැබූ ආදරය මා
අසම්මත වුවත්
ජීවත්වෙමි නුඹ හින්දා

සැරයන් චතුර කුමාර පීජීඑන්
2(සෙව්) ශ්‍රීලයුවෙබ




## පරීක්ෂාව...

බෙහෙත් ගන්නට ආ පුංචි පිරිමි ළමයි දෙදෙනෙක් එක ළඟ වාඩිවී සිටියහ. එක ළමයෙක් ඉකි ගසමින් අඬනු දුටු දෙවැන්නා ඔහුගෙන් මෙසේ ඇසුවේය.


"ඇයි ඔයා අඬන්නේ?"

"මගේ ලේ පරීක්ෂා කරගන්න අම්මා මාව එක්කගෙන ආවේ. දැන් මගෙ ඇඟිල්ල කපලා ලේ ගන්නවලු"

එය ඇසූ දෙවැන්නා මහා හඬින් ළතෝනි දෙමින් අඬන්නට පටන් ගත්තේය.

"ඔයා මොකද අඬන්නේ?"

"අපේ අම්මා මාව එක්කගෙන ආවේ මුත්‍රා පරීක්ෂා කරන්න"




## නෝනා සහ මහත්තයා...

**මහත්තයා -:** පැටියෝ, මං ඔෆිස් ඇරිලා ගෙදර එන ගමන් වාහනේක හැප්පුනා. මධුරි මාව ඉස්පිරිතාලෙට අරන් ආවා. දොස්තරලා මාව චෙක් කරල බැලුවා. ඔළුව හොඳටම වැදිලලු. වම් අතේ ඇඟිලි දෙකක් කැඩිලා. කකුලෙ තුවාලෙටත් මැහුම් 15ක් ගහන්න වෙයි කියනවා. තුවාල දරුණු නිසා මාසයක්වත් ඉස්පිරිතාලෙ නතර වෙන්න වෙයිලු. මාව බලන්න ඉක්මනට එන්න.

**නෝනා -:** ඔක්කොටම කලින් කියනවා කවුද මිහිහෝ මධුරි කියන්නේ...?





# රණවිරුවා






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
ඊඑච් සුජිත් චමින්ද



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඡ්එම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**
"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

**ඊමේල්**
dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**
011 2993076

**යුහ දිගුව**
51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය


## ඔබේ නිර්මාණ අපට එවන්න

සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වන "රණවිරුවා" වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍යය, අධ්‍යාපනික, විදෙස් හා ඉතිහාස තොරතුරු වඩා විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් වී ඇති බැවි අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මගින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අප වෙත ලිපි සහ නිර්මාණ යොමු කළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්ත්වයක් පවතී. එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. එසේම, රණවිරුවා යුද්ධ හමුදාවට පමණක් සීමා නොවන්නකි. බාහිර පාඨකයන්ගේ ලිපි, නිර්මාණ, ඡායාරූප හා කාලීන තොරතුරු වෙනුවෙන්ද එහි නිරතුරු ඉඩකඩ වෙන්කොට ඇති බව සතුටින් දැනුම් දෙන්නෙමු. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මගින් පාඨක ඔබගේ නිර්මාණශීලි හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතුවන්න.

– සංස්කාරක



සෙන්පතියකු පිළිබඳ මතක...

# සතුරු බල බිඳ නැගෙනහිර බිමේදී සමුගත් යුද සෙන්පති

ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු මෙන්ම රෙජිමේන්තු අධිපතිවරයකු වශයෙන් කටයුතු කළ මේජර් ජෙනරාල් අනුර නලින් අංගම්මන ආර්එස්පී යූඑස්පී පීඑස්සී මෙරට තුළ පැවති ත්‍රස්තවාදයට එරෙහි සටනේදී මවිබිම වෙනුවෙන් ජීවිතය පිදූ ඉංජිනේරු බලකායේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වේ. හෙතෙම 3 වන සේනාංකයේ සේනාංකාධිපතිව සිටියදී 1995 ජුලි මස 30 වන දින මඩකලපුව වාලච්චේන ප්‍රදේශයෙහි පිහිටි මූකරාල් කඳවුරට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයක් විමර්ශණය කොට ආපසු පැමිණි ගමනේදී බිම්බෝම්බයකට ගොදුරුව තම ජීවිතය පුදකළේය. අදින් වසර 30කට පෙර එලෙස දැයෙන් සමුගත් එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් වූ මේ මතක සටහන ඔහුගේ එම උත්තම මෙහෙවරට උපහාරයක් ලෙසය.

1946 ජුලි මස 02 වන දින මාතලේ දිස්ත්‍රික්කයේ තලංගොඩ ප්‍රදේශයේ උපත ලද ලුතිනන් ජෙනරාල් අනුර නලින් අංගම්මන මහනුවර ධර්මරාජ විද්‍යාලයෙහි දීප්තිමත් ශිෂ්‍යයකු විය. එවකට පාසල් ක්‍රිකට් කණ්ඩායමේ නායකයා මෙන්ම 1964 වසරේදී පාසලෙහි හොඳම පන්දු යවන්නා ද ලෙස සම්මාන ලබා ඇති ඔහු පාසල් බෞද්ධ සංගමයේ සභාපති ධූරය ද පාසල් ශිෂ්‍ය නායක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කළේය. වර්ෂ 1965 අප්‍රේල් මස 05 වන දින කෙඩෙට් නිලධාරියකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වන ඔහු එවකට දියතලාව පුහුණු මධ්‍යස්ථානය වෙතින් මූලික පුහුණුව හදාරා 2/ලුතිනන්වරයකු ලෙස 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුව වෙත ඇතුළත් වෙමින් එතැන් පටන් උතුරු නැගෙනහිර ක්‍රියාන්විත මෙහෙවරට සක්‍රීයව දායක විය.

කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ පළමු විධායක අධිකාරීවරයා ලෙසද එවකට ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ අධිසහායක වශයෙන් ද කටයුතු කර ඇති එම ජ්‍යෙෂ්ඨ නිලධාරී තම සේවා කාලය තුළ 1 කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී, 31 වන බළසේනාවේ බළසේනාධිපති, ඉංජිනේරු බළසේනාවේ බළසේනාධිපති, 1 වන සේනාංකයේ සේනාංකාධිපති, ආරක්ෂක සේනා මූලස්ථානය - කෑගල්ලහි ආඥාපති වශයෙන් කටයුතු කොට ඇත.